# ජාතික කියවීමේ මාසය - සමරු කලාපය

# தேசிய வாசிப்பு மாத - ஞாபகார்த்த மலர்

# National Reading Month - Commemorative Volume

# 2019

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை
National Library & Documentation Services Board

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education



**දරුවොත් එක්ක කියවමු**

சிறுவர்களுடன் இணைந்து வாசிப்போம்

**Let's read with Children**

# ජාතික කියවීමේ මාසය - සමරු කලාපය
# தேசிய வாசிப்பு மாத - ஞாபகார்த்த மலர்
# National Reading Month - Commemorative Volume

2
0
1
9


ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை
National Library & Documentation Services Board

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

© ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය 2019
© தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை 2019
© National Library & Documentation Services Board 2019

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය - ප්‍රකාශනගත සූචිකරණ දත්ත

ජාතික කියවීමේ මාසය - සමරු කලාපය - ඔක්තෝබර් 2019 .- කොළඹ :
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, 2019
පි. xx, 88 ; සෙමී. 25
ISBN 978-955-7544-34-2

i. 028.9095493 ඩිවී 23
1. කියවීමේ පුරුදු - ශ්‍රී ලංකාව
2. පුස්තකාල විද්‍යාව

ISBN 978-955-7544-34-2

**සම්පාදන උපදේශකත්වය**

එච්. හේවගේ - සභාපති (වැ.බ.)

ඩබ්ලිව්. සුනිල් - අධ්‍යක්ෂ ජනරාල්

**සම්පාදනය**

සේනානි බණ්ඩාර - අධ්‍යක්ෂ

කුසලා සජීවනී - සහකාර අධ්‍යක්ෂ

තිලිණි උපේන්ද්‍රා - තොරතුරු සහකාර

**පිටු සැකැස්ම සහ පිටකවරය නිර්මාණය**

එල්. එච්. තනුජා රංගිකා - කළමනාකරණ සහකාර

**ප්‍රකාශනය**

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය,
අංක 14, නිදහස් මාවත, කොළඹ 07.
දුරකථන : 011 2698847 / 011 2685197
ෆැක්ස් : 011 2685201
විද්‍යුත් තැපෑල : www.libdev@mail.natlib.lk
web : http://www.natlib.lk

**මුද්‍රණය**

අජිත් ප්‍රින්ටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්,
342, පරණ කැස්බෑව පාර, රත්තනපිටිය, බොරලැස්ගමුව.
දුරකථන : 011 2517269

# ජාතික කියවීමේ මාසය - සමරු කලාපය

# தேசிய வாசிப்பு மாத - ஞாபகார்த்த மலர்

# National Reading Month - Commemorative Volume

# 2019

# පටුන

පිටු අංකය

අතිගරු ජනාධිපතිතුමාගේ සුබ පැතුම් පණිවුඩය vii
ගරු අග්‍රාමාත්‍යතුමාගේ සුබ පැතුම් පණිවුඩය ix
ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ සුබ පැතුම් පණිවුඩය xi
ගරු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමාගේ සුබ පැතුම් පණිවුඩය xiii
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ සුබ පැතුම් පණිවුඩය xv
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සභාපතිතුමාගේ සුබ පැතුම් පණිවුඩය xvii
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සුබ පැතුම් පණිවුඩය xix

සකස්කඩ නොකී කට
- **ආචාර්ය අධිනීතිඥ ඩබ්ලියු. ඒ අබේසිංහ** 1-9

ළමා කියවීමේ රුචිය උද්දීපනය කරනු පිණිස පදනම් කරගත යුතු ළමා මනෝවිද්‍යාත්මක සංකල්ප
- **සම්මානිත මහාචාර්ය අධිනීතිඥ රෝලන්ඩ් අබේපාල** 11-16

Role of libraries in the promotion of reading and information literacy skills of children
- **Dr. G. D. Amarasiri** 17-21

කියවීම දරුවන්ගෙන් ආරම්භ කරමු
- **මෞලවි ෆරූද් ෆාරුක් ඉන්සානි** 23-26

வாசிப்புப் பழக்கத்தை ஊக்குவித்தல்
– எஸ்.சிவகுருநாதன் 27-30

ශ්‍රී ලාංකේය ළමා සාහිත්‍යය තුළ ළමයා කියවීම සහ ළමයාගේ කියවීම 31-36
- **සේනානි ගුණතිලක බණ්ඩාර**

දරුවන් සමඟ කියවීම : මහජන පුස්තකාලයක කාර්යභාරය
- **වරුණි ගගබඩආරච්චි** 37-40

දරුවන් අපචාරවලින් මුදා ගැනීමට කියවීම ඉවහල් කරගනිමු
- **ලංකා රාජිණී අමරසේන** 41-44

දරුවන් කියවීමට හුරුකරමු
- **සුමේධා නවරත්න** 45-48

Child in a 'Worldland'
- **Indeewara de Mel** 49-52

කියවන සමාජයක ඇරඹුම ළමයාගෙන් පටන් ගනිමු
- **ආචාර්ය පූජ්‍ය ඔලගන්වත්තේ චන්ද්‍රසිරි හිමි** 53-61

ළමා ලෝකය ප්‍රතිනිර්මාණය කෙරෙන විශ්ව ළමා සාහිත්‍යය
- **සුදේශ් කවීශ්වර** 63-71

வாசிப்புக் கலையாக வேண்டும்!
– செ. அன்புராசா அடிகள் – முல்லைத்தீவு 73-78

වැනි වටින ගජමුතු - දරුවන් වන්න දිනමුතු දරුවන් වැනි නෙතු - නිතර පත පොත ඇසුරු කළයුතු ...
- **ඒ. පී. චතුනි ලංකාන්ජලි** 79-84

**Award Winners** 85-88



# අතිගරු ජනාධිපතිතුමාගේ සුබ පැතුම් පණිවුඩය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ජාතික කියවීමේ මාසය ආරම්භ කර සිය පහළොස් වසරක ගමන්මග සමරන අවස්ථාව වෙනුවෙන් පණිවුඩයක් නිකුත් කරන්නේ ගෙවී ගිය එම කාලය තුළ දැනුමින් පිරිපුන් සමාජයක් බිහිකිරීමට මණ්ඩලය කළ මෙහෙවරට සතුට පළ කරමිනි.

අධ්‍යාපන ක්‍රියාවලියේ දී කියවීම අත්‍යවශ්‍ය අංගයකි. ලෝකය පිළිබඳ ඇවිළුණු කුතුහලයෙන් යුත් දරුවන් සන්සිඳුවිය හැකි විශ්මිත හැකියාවන් පොත්වලට ඇති බව මිනිසා උගත්තේ, පරම්පරා ගණනාවකට පෙර සිටය. එබැවින් දරුවන්ගේ පරිකල්පනය පුළුල් කළ හැකි පොතපත වඩාත් සුලබ කරමින්, දරුවන් ඒ හා ඇඳ බැඳ තැබීමට වැඩිහිටියන් වන අපට ඇත්තේ යුතුකමක් නොව, වගකීමකි.

අධ්‍යාපනයේ සංවර්ධනය සඳහා රජය විසින් නොමිලේ අධ්‍යාපනය දෙනු ලැබේ. එමගින් මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රයේ භෞතික හා මානව සම්පත් සංවර්ධනය විශාල ප්‍රගතියක් ලබා ඇත. තොරතුරු සන්නිවේදන තාක්ෂණය සෑම අංශයකටම පුළුල්ව ලබාදීම රජයේ සංවර්ධන සැලැස්මේ එක් ප්‍රධාන උපාය මාර්ගයක් ද වී තිබේ. එමගින් පුස්තකාල සහ අනෙකුත් ආයතන වෙත අන්තර්ජාල පහසුකම් ලබාදීමටත්, තොරතුරු තාක්ෂණය සමාජයේ සෑම අංශයක් වෙතම ගෙන යෑමටත් රජය අපේක්ෂා කරයි.

පුස්තකාල භාවිතයත් සමඟ කියවීම පාදක කරගත් පැවැරුම් හා ක්‍රියාකාරකම් ලබාදීමත්, විෂය ධාරාවන්ට මෙන්ම විනෝදය සඳහා අවශ්‍ය වන කියවීම් ද්‍රව්‍ය පුස්තකාලයට ඇතුළත් කිරීමත් මගින් කියවීම් රුචිය වර්ධනය කර ගැනීමට අවශ්‍ය පරිසරය නිතැතින්ම නිර්මාණය වේ.

ශ්‍රී ලාංකේය ජනතාව අතර කියවීමේ පුරුද්ද වර්ධනය කිරීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ඉටුකරන කාර්යභාරය අගයන අතරම, මෙම ජාතික කර්තව්‍යය සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවා යි ද ප්‍රාර්ථනය කරමි.

ගෝඨාභය රාජපක්ෂ
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ජනාධිපති



# ගරු අග්‍රාමාත්‍යතුමාගේ සුබ පැතුම් පණිවුඩය

ජාතික කියවීමේ මාසය ආරම්භ කර වසර පහලොවක් සම්පූර්ණ වීම නිමිත්තෙන් ශුභාශිංසන පණිවුඩයක් නිකුත් කරන්නේ ඉමහත් සතුටිනි. එමෙන්ම 2004 වසරේදී මුල්වරට ආරම්භ කරන ලද ජාතික කියවීමේ මාසයට ද මා හට සුබ පැතුම් එක් කිරීමට හැකි වීම මෙහිදී සිහිපත් කරමි.

අදහස් හා ආචාර විද්‍යාත්මක වටිනාකම් හුවමාරු කර ගැනීමේ මාර්ගයක් ලෙස පොතපත හැඳින්විය හැකිය. රටක පූර්ණ සංවර්ධනයේ ලක්ෂණයක් ලෙස දැනුමෙන් පිරිපුන් ජනතාවක් සිටීම අත්‍යාවශ්‍ය සාධකයකි. බුද්ධිය හා සදාචාරාත්මක වර්ධනයක් සිදු නොවී කෙතරම් භෞතික සංවර්ධනයක් රට තුළ සිදු වූවද ඉන් ඵලක් නොවනු ඇත. භෞතික සංවර්ධනය මෙන්ම බුද්ධිමය හා සදාචාර සංවර්ධනය ජනතාව තුළ ප්‍රගුණ කරවිය යුතුය. මෙම අරමුණු ඉටු කර ගැනීම සඳහා කියවීම ප්‍රවර්ධනය කිරීම අත්‍යවශ්‍ය සාධකයක් ලෙස හැඳින්විය හැකිය.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන මෙම ජාතික කියවීමේ මාසය වසර පහලොවක් නොකඩවා පවත්වාගෙන එමින් රටේ ජනතාව අතර කියවීම වර්ධනය කිරීම සඳහා සිදු කරන්නාවූ මෙහෙය වඩාත් සාර්ථක අයුරින් ඉදිරියට ගෙන යාමට සුබ පැතුම් එක්කරමු.

ඔබ සැමට සුබ අනාගතයක් !

මහින්ද රාජපක්ෂ

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

අග්‍රාමාත්‍ය



# ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ සුබ පැතුම් පණිවුඩය

සියවස් විස්සකට වැඩි අඛණ්ඩ ලිඛිත ඉතිහාසයකට උරුමකම් කියන ප්‍රඥාසම්පන්න ජාතියක් වේ නම් ඒ ශ්‍රී ලාංකික අපයි.

නූතන මානව ශිෂ්ටාචාරයේ ලිවීම හා කියවීම 'උපතින්ම' උරුම කර ගත් පළමු ජාතීන් අතළොස්ස අතර අපි වඩාත් ඉහළින්ම සිටින්නෙමු.

වංශකථා සාහිත්‍යයෙන් ඔදවැඩී ත්‍රිපිටක දම් රසයෙන් ප්‍රමුදිතව, නවලොව අන්තර්ජාල යුගය දක්වා සියවස් ගණන්, යුගයෙන් යුගය කියවීම අත් නොහළ ජාතියක් ලෙසින් අපි ලොව ඉහළම සාක්ෂරතාවයක සාඩම්බර හිමිකරුවන් ද වන්නෙමු.

එතෙක් නූතන ඩිජිටල් සන්නිවේදන සංග්‍රාමයට ගොදුරුව, වැඩි වැඩියෙන් 'ඇසීමට හා දැකීමට' යොමු වෙමින් පවතින වත්මන් පරපුර කියවන්නන් බවට පත්කිරීම අභියෝගයක් මෙන් ම ජාතික වගකීමක් ද වේ.

මේ ජාතික වගකීමට උරදෙමින්, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය වසරක් පාසා පවත්වන ජාතික කියවීමේ මාසය, කියවීමෙන් පෝෂණය වී ප්‍රඥාවේ ඵල දරන වසන්ත සමය යැයි මම සිතමි.

ජාතියට කියවීම හුරු කරන මේ උතුම් මෙහෙවරට නැණ නුවණ, වෙර වෙහෙස පුදකළ අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් ජාතකි පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයටත්, සියලුම සහෝදර නිලධාරී මහත්ම මහත්මීන්ටත් මගේ ස්තුතිය ද, සුබ ප්‍රාර්ථනයද මේ සමඟ එක්කරමි.

ඩලස් අලහප්පෙරුම

අධ්‍යාපන, ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍ය



# ගරු අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යතුමාගේ සුබ පැතුම් පණිවුඩය

ජාතික කියවීමේ මාසය ලෙස ඔක්තෝබර් මාසය නම් කිරීම හා එම කාල සීමාව කේන්ද්‍ර කර ගනිමින් පොතපත කියවීමට ප්‍රජාව අතර පෙළඹවීමක් ඇති කිරීම සාහිත්‍ය මාසයේ ඇතිවන සාහිත්‍ය ප්‍රබෝධය වඩා අර්ථ ගැන්වීමට හේතුවන බව මාගේ විශ්වාසයයි. 2004 වසරේ සිට ආරම්භ කළ මෙම වැඩසටහනෙහි 15 වන සංවත්සරය මෙම වසර තුළ උත්කර්ෂවත් අයුරින් සැමරීමට පියවර ගැනීම පිළිබඳව ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය වෙත මාගේ කෘතවේදීත්වය පිරිනැමීමට කැමැත්තෙමි.

කාර්ය බහුල ජීවන රටාවත්, විද්‍යුත් මාධ්‍යයේ ප්‍රබල ආගමනයත් හේතුවෙන් පොතපත කියවීමේ පුරුද්ද ජනතාව අතින් යම් තරමක ගිලිහී යාමක් දක්නට ඇතත් තවමත් පොතපතට ඇති ගෞරවයේ සහ රුචිකත්වයේ කිසිදු වෙනසක් සිදුව නැති බව මාගේ විශ්වාසයයි. පෙර කී තාක්ෂණික දියුණුව හමුවේ රටක සංස්කෘතිය, සදාචාරය රැක ගනිමින් ගුණ පිරි නුවණැති පුරවැසියෙකු වශයෙන් රටේ සෑම කෙනෙකුම හැඩගැස්වීම සඳහා ඉතාම ගෞරවාන්විත සේවාවක් ඉටුකළ හැක්කේ පුස්තකාලයටම පමණක් බව කිව යුතුය.

රට තුළ පවතින සෑම පුස්තකාල වර්ගයකම සේවාවන් හමුවේ ප්‍රධාන ජාතික ආයතනය ලෙස ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ඉටු කරනු ලබන සේවාව මෙන්ම රට පුරා පුස්තකාල නිලධාරීන්ගේ ද සේවාව අප විසින් අගය කළ යුතුය.

සංවර්ධනය කරා යන ගමනේ දී දැනුමැති වෘත්තිකයන් මෙන්ම යහගුණ ඇති ප්‍රජාවක් රටක් තුළ ජීවත් වීම එම රටේ වාද - භේද තුරන් කොට එකම දරුකැළක් ලෙස ආදරය වපුරාලීමට ඉවහල් වේ.

දැනුම ලැබීම, තොරතුරු ගවේෂණය, රස වින්දනය පමණක් නොව අවම වශයෙන් නිවැරදිව ජීවත් වීම වෙනුවෙන් ද කියවීම අත්‍යාවශ්‍ය කරුණකි.

එකී කාර්යයන් පසක් කරමින් සංවර්ධිත රටක් තැනීමේ ක්‍රියාවලිය සඳහා ජාතික කියවීමේ මාසය තුළින් ලබන පන්නරය තව තවත් ඉදිරියටම ළඟා කර ගැනීමට වාසනාව, ශක්තිය, ධෛර්යය ලැබේවා යි ප්‍රාර්ථනා කරමි.

ආචාර්ය රංජිත් සියඹලාපිටිය
අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍ය



# අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ සුබ පැතුම් පණිවුඩය

රටක සංවර්ධන කාර්යයේ දී වඩා වැදගත් වන්නේ එම රටේ ජීවත් වන ජනතාවගේ බුද්ධියයි. බුද්ධිමත් ජනතාවක් වෙසෙන රටක තම වෘත්තිය නිසි ලෙස ඉටු කරන රටේ සම්පත් සුරකින මෙන්ම අන්‍යෝන්‍ය බැඳීම ඇති අන් අය ගරු කරන සමාජයක් නිතැතින්ම උපදී. එම කටයුත්තේ දී ලොකු කුඩා සැම දෙනෙකුගේ ම කියවීම ඉතා ම වැදගත් වේ. 2004 වසරේ දී ආරම්භ කරන ලද ජාතික කියවීමේ මාසය තුළින් පුරා පහළොස් වසරක් මුළුල්ලේ එකී ප්‍රගමනය උදෙසා ඉටු කර ඇති විශිෂ්ට සේවාව අතිශය අගය කළ යුතුය. එම කාර්යය උදෙසා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය වෙනුවෙන් පළමුව මාගේ සුභාශිංසන පුද කරමි.

පුස්තකාල ක්ෂේත්‍රයේ ප්‍රධානතම ආයතනය වශයෙන් ජනතාව තුළ කියවීමේ පුරුද්ද හා නවීන තාක්ෂණික දියුණුව හමුවේ ඉන් මනා ප්‍රයෝජන අත්කර ගැන්මට මග පෙන්වීමේ ප්‍රධාන වගකීම ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සතු වේ.

දැනුම ලැබීම, තොරතුරු ගවේෂණය මෙන්ම වෘත්තීය සංවර්ධනය වැනි විවිධ අරමුණු වෙනුවෙන් හැඩ ගැසෙන පාඨකයා වෙනුවෙන් ජාති, ආගම්, කුල භේදයකින් තොරව එක ලෙස සේවා සැපයීම පුස්තකාල නිලධාරීන්ගේ කාර්යභාරය වේ.

සංවර්ධනයේ ප්‍රධාන බැම්ම වන ජාතිවාදය තුළින් ගොඩනැගෙන වෛරය වෙනුවට ජාතීන් අතර ඇතිවන අවබෝධය තුළින් ගොඩනැගෙන ආදරය උදෙසා අප සියලු දෙනා දරුවන් සමග කියවීම සිදුකළ යුතු බව මාගේ කියැවීමයි.

ජාතික කියවීමේ මාසයේ අභිමානනීය 15 වැනි සංවත්සරය අවස්ථාවේ දී ඉදිරියටත් කියවීම් ප්‍රවර්ධනය තුළින් ගුණ - නැණ සපිරි මිනිසුන් බිහි කිරීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයට ශක්තිය, ධෛර්යය ලැබේවා යි ප්‍රාර්ථනා කරමි.

එන්. එච්. එම්. චිත්‍රානන්ද
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය



# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සභාපතිතුමාගේ සුබ පැතුම් පණිවුඩය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ජනතාව තුළ කියවීමේ රුචිකත්වය වර්ධනය කිරීම උදෙසා පසුගිය පහළොස් වසර පුරා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

කියවීමේ වැදගත්කම සහ එයින් ඇතිවන යහපත් ප්‍රතිඵල පිළිබඳ කිසිදු විවාදයක් නොමැත. කියවීම මගින් දැනුම පෝෂණය කර ගැනීම, ඒ ඒ පුද්ගලයාගේ හැකියාව හා අධ්‍යාපනික වර්ධනයට විශාල පිටුවහලක් වනවා සේ ම පොදුවේ එය සමාජයේ සහ රටේ සංවර්ධනය සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටුකරනු ලබයි. සෑම ක්‍රියාවකටම මෙන් ම කියවීමට ද හොඳ ආරම්භයක් ලැබීම තීරණාත්මකව වැදගත්වනුයේ දෙමාපියන්ගේ මග පෙන්වීම හා සහාය ළමුන්ගේ කියවීම වර්ධනය සඳහා අත්‍යවශ්‍ය වන බැවිනි. මෙවර ජාතික කියවීමේ මාසයේ තේමාව වන ''කියවන සමාජයක ඇරඹුම දරුවාගෙන් පටන් ගනිමු'' යන්න යථාර්ථයක් කරගත යුතුව ඇත. සාර්ථක ජීවිතයකට මුහුණ දීමටත්, යහපත්, ඵලදායී පෞරුෂයක් සහිත පුරවැසියකු ලෙස ජීවත්වීමටත් දරුවන් කියවීමට යොමු කළ යුතුය.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ඒ සඳහා සියලු වැඩසටහන් දිවයින පුරා ක්‍රියාත්මක කරමින් පවතී. ''**පුස්තකාලය, සියල්ලන්ට අවබෝධය දියුණුව හා ප්‍රීතිය ගෙන එන විශ්ව අධ්‍යාපනයේ අතවැසියා වේ**''. ඒ අනුව මෙම ජාතික කියවීමේ මාසයේ වැඩසටහන් සිදුකළ සියලුම පුස්තකාලවලටත් පොදුවේ ජාතික කියවීමේ මාසයේ වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා සහයෝගය දැක්වූ සියලුම දෙනාටත් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ කෘතවේදීත්වය හිමිවේ.

එච්. හේවගේ
සභාපති (වැ.බ.)
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය



# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සුබ පැතුම් පණිවුඩය

ශ්‍රී ලාංකීය ප්‍රජාව අතර පොතපත කියවීමේ පුරුද්ද සහ තොරතුරු සාක්ෂරතාව වර්ධනය කිරීමේ අරමුණෙන් 2004 වසරේ සිට සෑම වසරකම ඔක්තෝබර් මාසය "ජාතික කියවීමේ මාසය" ලෙස රජය විසින් ප්‍රකාශයට පත් කර තිබේ. ගත වූ කාලසීමාව තුළ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ නායකත්වය යටතේ මෙරට සෙසු පුස්තකාල හා විවිධ ආයතනවල සහයෝගිත්වයෙන් ප්‍රජාව අතර කියවීම ප්‍රවර්ධනය කිරීම උදෙසා විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාවට නංවා තිබේ. මෙවර ජාතික කියවීමේ මාසය වැඩසටහනේ තේමාව වන්නේ "කියවීම දරුවන්ගෙන් පටන් ගමු" යන්නයි.

පුද්ගල ජීවිතයේ යහපත් පුරුදු කුඩා කල සිට හුරුපුරුදු වීම මගින් එය ජීවිතයේ අත්හල නොහැකි පුරුදු බවට පත්වන බැවින් පොතපත කියවීම, පොතපතට හුරු කරවීම, දරුවන්ට තම කුඩා වියේ සිටම හුරුකළ යුතු යහපත් පුරුද්දකි. වර්තමානයේ දැනුම් ලොවට ප්‍රවේශ වීමේ අසහාය මාර්ගය වී ඇත්තේ කියවීමයි. පොතපත කියවීම පුරවැසියා තුළ මෙන්ම සමාජය තුළ ද ආධ්‍යාත්මික සංවර්ධනයක් ඇති කිරීමට හේතු වනු ඇත. ඒ සඳහා කාලීන දැනුම හා තොරතුරු ඇතුළත් පොතපත වෙත සෑම දරුවෙකුම යොමු කරවීම වැඩිහිටි සැමගේ යුතුකමකි. සාක්ෂරතාව අතින් ලොව ඉහළ පෙළේ රටවල් සමඟ සැසඳීමේ දී ශ්‍රී ලංකාවට හිමි වන්නේ ප්‍රමුඛ ස්ථානයකි. ලෝකයේ දසදෙස බිහිවන නව තොරතුරු ජනතාව වෙත ලබාදීමේ දී පුස්තකාලවලට විශාල වගකීමක් පැවරී තිබේ. මෙම කාර්යයේ දී පුස්තකාල සතු භූමිකාව අති මහත්ය.

පොදු ජනතාව පොතපත වෙත සම්බන්ධ කරලීමේ මහගු කාර්යය පැවරී ඇත්තේ පුස්තකාල වෙතය. නවීන ලෝකයේ සෑම මිනිත්තුවකදීම ජනනය වන අති විශාල දැනුම් සම්භාරය නිසි ආකාරයෙන් සංවිධානය කර පාඨක ප්‍රජාව වෙත දායාද කිරීම පුස්තකාලවල වගකීමකි. එසේම පාඨක ප්‍රජාව වෙත පොතපත කියවීමට අවස්ථාව ලබාදීමත්, නව තොරතුරු නිවැරදි ආකාරයට ලබා දීම තුළින් පාඨක දැනුම් සම්භාරය වර්ධනය කරලීම පුස්තකාල පද්ධතියේ මූලික වගකීම බව ද සඳහන් කළ යුතුය.

ඩබ්ලිව්. සුනිල්
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

# සකස්කඩ නොකී කට

- ආචාර්ය අධිනීතිඥ ඩබ්ලියු.ඒ.අබේසිංහ*

ක්‍රීඩා වියේ සිටම දරුවන්ට කියවීම පුරුදු කරවීම සඳහා වඩාත් ප්‍රබල වූද, ප්‍රායෝගික වූද සාහිත්‍ය මාධ්‍යය වනුයේ, ළමා කවිය සහ ගීතයයි. සැබැවින්ම, අපේ දරුවන්, ලොවේ අන් බොහෝ ශිෂ්ට රටවල දරුවන් මෙන්ම, කියවීමට අත්පොත් තබන්නේ, සිය මෑණියන්ගේ හෝ මිත්තණියන්ගේ හෝ මිහිරි ළයාන්විත කටහඬින් කියැවෙන ළමා කවිගීවලිනි.

වයිවාරන්න විද්‍යුත් මෙවලම් අපේ දරුවන් අතට දෙන මෙකල්හි වුව, දරුවන් කියවීමට අනායාසයෙන් හුරු කෙරෙන සාහිත්‍ය මාධ්‍යය ළමා කවියත් ගීතයත් බැව් බැහැර කරනු බැරිය. එසේ හෙයින්, මෙසමයෙහි වනාහි, කියවීමේ පුරුද්ද ප්‍රගුණ කරවීමේ මාධ්‍යයක් හැටියට, ළමා කව් ගීත අධ්‍යයනය කෙරෙහි විශේෂාවධානයක් යොමු කිරීම, අධ්‍යාපනඥයින්ගේත් ගුරුදෙමාපියන්ගේත්, ඊටද අමතරව, විද්වත් පුස්තකාලයාධිපති-පතිනියන්ගේත් කාර්යභාරය බැව් නමෝවිත්තියෙන්ම සඳහන් කරනු කැමැත්තෙමි.

''සකස්කඩ නොකී කට
උගේ කට හුඹස් කට''

විසිඑක්වැනි සියවසේ දෙවැනි දශකයද ගෙවෙමින් පවතින මේ මොහොතේ, අපේ දරුවන්, ඒ කියමන අසා නැතුවා වන්නට පුළුවන. ඒ ගැන, ඒ දරුවනට දොස් කියන්නටද බැරිය.

**මුනිදාස කුමාරතුංග, මාර්ටින් වික්‍රමසිංහ** වැනි මහා වියතුන් බිහි කළ ගුරුගෙදර, පන්සල, පිරිවෙන වැනි පැරණි සම්ප්‍රදායයේ අධ්‍යාපන ආයතනවලදී ළමයින්ගේ කටේ හැක යන්ටත්, අප සිංහලයේ පමණක් නොව, **පාලි සංස්කෘත** ආදි මාතෘ භාෂාවන්ගේද වචන හඬනගා කියවීම හෙවත් ශබ්දෝච්චාරණය සඳහාත්, දරුවන්ට කියවන්ට සිදු වූයේ **සකස්කඩ, බුද්ධගජ්ජය, ගණදෙවි හැල්ල සහ වදන් කවි** පොතය. ඒ පොත් කියවා නැති නම්, ඒ ඉගෙනීමෙන් වැඩක් නැතැයි පැරණියෝ කීහ. මන්ද යත්, ඒ අධ්‍යාපනයේ සවිමත් පදනම දැමුණේ, අර පොත් කියවා, වැලිපිල්ලේද අකුරු ලියා හුරුවීමෙන් අනතුරුව වන බැවිනි. ඒ නිසා, සකස්කඩ නොකී කට, නිකම්ම හුඹස් කටක් විය.

ඒ සකස්කඩ කියවූ කාලය, ගෙවී ගොස් දැන් බොහෝ කල්ය. ඉනුත් මෑත භාගයේදී අපේ පොඩි දරුවන්ගේ මුව රැඳුණු පුංචි කවි කිහිපයක් විය. ඒ කවි අතර මුනිදාස කුමාරතුංගගේ **''හා හා හරි හාවා කැලේ මැදින් ආවා''** නමැති කවියත්, ආනන්ද රාජකරුණාගේ **''රෝසමලේ නටුවෙ**

* හිටපු සභාපති, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

**කටු වනබමරෝ ඔහොම හිටූ**'' යන කවියත් ඇස්. මහින්ද හිමියන්ගේ

''**සමන් පිච්ච මල් ඉහිරුණු**
**නිල් තණකොළ පිට්ටනියක්**
**වගෙයි අහස අන්න බලනු**
**කොච්චර ලස්සනද රෑට**'' යන කවියත් විය.

පසුගිය විසිවැනි සියවසේ මැද භාගය වන විට, සිංහලයේ ''සකස්කඩ'' බවට පත්ව තිබුණේ, ඒ කවි කිහිපයයි. ඒ අනුව ඇස්. මහින්ද හාමුදුරුවන්ගේ **සමන් පිච්ච මල් ඉහිරුණු** කවි පංතිය කටපාඩමින් දන නොසිටීම, දරුවකුගේ ලජ්ජාවට කාරණයක් විය.

ඒ, එදාය.

අද සිංහල ළමා අධ්‍යාපනයට මොනම සකස්කඩක්වත් ඇත්තේ නැත.

*****

කියවීම ප්‍රගුණ කිරීම සඳහා මෙන්ම ශ්‍රී ලංකාවේ වර්තමාන සිංහල ළමා සමූහයාගේම භාෂාවත්, සාහිත්‍යයත්, රසවින්දනයත් අත්පොත් තැබීම සඳහා, **ඇස්. මහින්ද හාමුදුරුවන්ගේත්, මුනිදාස කුමාරතුංග පඬිතුමන්ගේත්, ආනන්ද රාජකරුණා මහාකවියාගේත්** ළමා කවි ගීත නමැති මහා නිධානය වෙත ආපසු ගමන් කළයුතු වන්නේ, ඒ නිසාය. අපගේ ළමා භාෂා සාහිත්‍ය අධ්‍යාපනය පිහිටුවා ලියයුතු එක් සවිමත් පදනමක් හෙවත් ප්‍රතිෂ්ඨාවක් වනුයේ, එකී ධීමතුන්ගේ අනල්ප වූ ළමා කාව්‍ය - ගීත සමුදායයි.

අපගේ ළමා පරපුර අතර කියවීම ප්‍රවර්ධනය කිරීම උදෙසාද, සාහිත්‍ය රසවින්දනය අර්ථවත් කරනු උදෙසාද, අධ්‍යාපනයේ නිසි මගෙහි අපේ දරුවන් මෙහෙයවනු සඳහාද, සිකීම් මහින්ද හෙවත් ඇස්.මහින්ද මාහිමියන්ගේ ළමා කවි සහ ගීත නිදසුන් කොටගෙන, මෙම නිබන්ධනය සම්පාදනය කෙරෙනුයේ, එමගින් සම්භාවිත සෙසු ළමා ගද්‍යපද්‍ය සාහිත්‍යය කෙරෙහිද අදාළ පිරිස් යොමුකරවීමේ අධ්‍යාශයෙන් බැව් මෙහිලා සඳහන් කරනු රිසියෙමි.

ඇස්. මහින්ද හිමියන් විසින් ලියන ලද කාව්‍ය රචනා විශාල සමුදාය අතරින් සැලකිය යුතු සංඛ්‍යාවක්, ළමා කවි සහ ගීතය. මෙම ළමා කාව්‍ය නිර්මාණ, උන්වහන්සේ විසින් වරින් වර පළ කරන්ට යෙදුණු කුඩා කවි පොත්වල අන්තර්ගතව තිබුණි. එම පොත්වලින් සැහෙන සංඛ්‍යාවක් පාසල් දරුවන් අරමුණු කරගෙන ලියන ලද ඒවා විය. පසු කලෙකදී එම ළමා පද්‍ය සංග්‍රහයන් පාසල්වල භාවිතයට ගැනුණු බැව්ද ප්‍රකට කාරණයකි.

ළමයින් උදෙසා නිර්මාණය වී, පසු කලෙක පාසල්වලද භාවිතය සඳහා ගැනුණු එම ළමා කවි ගී, මූලික වශයෙන් පොත් පේළි තෙවගක සංගෘහිත විය. ඒ පොත් පේළි තුන නම් **කවි මිණ, කවි මුතු** සහ **ළමා කවි** කළඹය.

**කවි මිණ**, පහළ බාලාංශය, ඉහළ බාලාංශය 2, 3, 4, 5 යන පංතිවලට වෙන වෙනම පොත් හයකුත්, 6, 7, 8 යන පංති සඳහා තවත් පොතකුත් වශයෙන් පොත් හතක් හැටියට නිකුත්ව ඇත. **කවි මුතු** පොත් පෙළ පළව ඇත්තේද, ඒ පිළිවෙළටම පොත් හතක් වශයෙනි. ඒ අතර, **ළමා කවි කළඹ** පොත් පෙළ, පහළ සහ ඉහළ බාලාංශ පංති උදෙසාද 2, 3, 4 සහ 5 යන පංති උදෙසාද පොත් හයක් හැටියට පළව ඇත. එයට අමතරව, **ඔවා මුතුදම, නන්දන ගීත** සහ **දරුනැළවිල්ල** හෙවත් **ජාතික තොටිල්ල** යන පොත් තුනත් සැලකියයුතු වන්නේ, ළමා කවි-ගී හැටියටමය.

මහින්ද හිමියන්ගේ ළමා පද්‍ය ආකෘතියෙහි දක්නා ලැබෙන්නේ සරල සුගම හෘදයංගම

රීතියකි. උන්වහන්සේ ස්වකීය නිර්මාණ හුදු පද්‍ය ප්‍රබන්ධ හැටියට ද, බොහෝ විට ඊටත් වඩා නිදහස් රීතියක් අනුගමනය කරමින් ගීත හැටියටද නිමවන අයුරු දැකිය හැකිය. ගීතාකාරයෙන් කරන ලද නිර්මාණයන්හි ඉතා සුකර වූද. සුගේය වූද, ස්වයංසිද්ධ රිද්මයක් හෙවත් ''තනුවක්'' බිහි වනු පෙනී යයි. මේ ලක්ෂණය මුනිදාස කුමාරතුංග, ආනන්ද රාජකරුණා, ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ සහ මහගම සේකර යන කවීන්ගේ ළමා රචනාවලද දක්නා ලද කාරණයක් බව සඳහන් කරනු වටියි.

ඇස්. මහින්ද හිමියන්ගේ ළමා කාව්‍ය සහ ගීතවලට වස්තු විෂයය වන්නේ, දරුවා වටා ඇති පරිසරයත් ඔහුගේ පෞරුෂ වර්ධනය හා ආකල්ප සම්පත්තිය කෙරෙහි බලපාන ආගම දහම හා ගුණ දහමත්, දරුවාගේ ජාතික උරුමය සහ ඉතිහාසයත් බව පෙනී යයි. එමගින් දරුවාගේ චරිතය හා පෞරුෂය ගොඩනඟන අතරම, එයටම ආනුශංගික වූ සෞන්දර්ය වින්දනයද තීව්‍ර කිරිම අපේක්ෂිතය. මේ සියල්ල, සාහිත්‍ය නිර්මාණ කාර්යයක් තරමටම, අධ්‍යාපන ක්‍රියාවලියක්ද වූ වග, විශේෂ කොට කිවයුතු වෙයි.

දරුවා සිය පරිසරය ග්‍රහණය කරන්නේ, තම නැසියන්ද, සතා සීපාවාද, ගහකොළද, ඇළදොළද, අහස පොළොවද යන මේ සියල්ල, ගතින් සිතින් ස්පර්ශ කිරීමෙනි. එකී මූලික සංජානනය හෙවත් හඳුනාගැනීම තියුණු කරන්ටද, පෞද්ගලික අත්දැකීමක් බවට පත් කරන්ටද, එය අර්ථවත් කරන්ටද කවියා ඉදිරිපත් වෙයි. අභූතපූර්ව වූද, ඉතා රමණීය වූද, කාව්‍ය ගීත සමුදායක් බිහි වන්නේ, එතැනදීය.

මහින්ද හිමියන් ඉහළ බාලාංශ පන්තියේ දරුවන් අරමුණු කරගෙන ලියූ එක් රචනයක් හඳුන්වා තිබුණේ ''මල් උයනක්'' යනුවෙනි.

''කුඩලු අරලිය වතුසුදු
රුක්අත්තන ගොඩමහනෙල්
බඳුවද බූත්සරණ ඉද්ද
රාජපොහොට්ටුද කනේරු

වෙන වෙන හොඳ පාට ඇඳුම්
ඇඳගත් පොඩි ළමයි පෙළක්
වගෙයි නේද, මේ ගස් ටික
නොයෙක් පාට මල් පිපිලා

මගෙ නංගිගෙ පොඩි හිනාව
වගේය මේ පිච්ච පොකුර
ඇගෙ කම්මුල් දෙකේ පාට
කොයින්ද මේ රෝස මලට

ඉරුගේ පොඩි පැටවුන් මෙන්
බබළන රන්වන් මල් ඇති
මේ කිණිහිරි ගහ බලන්න
මහණ වෙලා වගේ නේද''

කවියා විසින් පබඳන ලද මෙවන් රචනා රසකම දක්නා ලද ප්‍රබල ලක්ෂණයක් විය. දරුවන් පරිසරය හඳුනාගන්නේ, ඒ හා නැසිය හැඟීමකින්ද බැඳීමෙනි. හුදෙක් ඈත සිට එදෙස බලා

සිටීමෙන් නොවේ. මල් ගස් පෙළ නොයෙක් පාට ඇඳුම් ඇඳගත් පොඩි ළමයින් වගේය. පිච්ච පොකුරේ ඇත්තේ නංගිගේ පොඩි හිනාවය. රෝස මලේ ඇත්තේ නංගිගේ කම්මුල් දෙකේ පාටය. මේ ලක්ෂණය තව බොහෝ පද්‍ය පන්තීන්හි දක්නා ලැබෙයි. ඒ අතින් බලන විට, **රාත්‍රිය** විශිෂ්ට රචනයකි.

**''සමන් පිච්ච මල් ඉහිරුණු**
**නිල් තණකොළ පිට්ටනියක්**
**වගෙයි අහස අන්න බලනු**
**කොච්චර ලස්සනද රෑට**

**බකමූණෝ පියාඹතී**
**අනික් කුරුල්ලෝ නිදතී**
**බෝ අතුවල එල්ලීගෙන**
**මාවවුලෝ  කෑ ගසතී**

**මගෙ සුරතල් අක්කාගේ**
**මාලේ මුතු ඇට වාගේ**
**මේ වැටෙන්නෙ පිනි බින්දුත්**
**හදමු එකක් ඒ වාගේ**

**හඳහාමී අප දිහාව**
**එබී බලයි පා හිනාව**
**සිහිල් සුළං දූල් විඳින්ට**
**දොරට යන්ට හොඳ වෙලාව**

**අහසේ තරු වැල් පිරිලා**
**පොළොවේ සුදු මල් පිපිලා**
**මඟුල් ගෙවල් දෙකක් වගෙයි**
**මේ දෙපළම හැඩ ගැහිලා''**

ස්වභාව සෞන්දර්යය විෂයය කරගෙන රචිත බොහෝ රචනාවන්හි දක්නා ලැබෙන්නේ, ''**රාත්‍රිය**'' නමැති කව් පෙළෙහි එන රීතියමයි. පරිසරයේ හෙවත් ජගත් සෞන්දර්යයේ ආශ්චර්යය, කවියා විසින් දරුවන්ගේ විෂය පථය තුළට ගෙන එනු ලබන්නේ අර බලන්නැයි අණවමින් නොව, ඒ ආශ්චර්යය හා දරුවා ඥාති සම්බන්ධයකින් මෙන් එකට බැඳ තැබීමෙනි. මේ වූකලී, ළමා සාහිත්‍ය නිර්මාණයේ අතිශයින්ම වැදගත් සාධනීය ලක්ෂණයක් - ඉෂ්ටදායක ප්‍රවණතාවක් - බව කිව යුතුය. වැටෙන පිනි කැට දරුවා දකින්නේ, තමාගේ සුරතල් අක්කාගේ මාලේ මුතු ඇට සේය.ඒ මොහොතේම, ඒ පිනිකැට දරුවාගේ විෂයය ලෝකයෙන් තමා සතුකරගන්නා වූද, තමා ආදරය කරන්නා වූද දෙයක් බවට පත් වෙයි. වැටෙන පිනිබිඳුවල සොබා අසිරිය, අක්කා කෙරෙහි ඇති ආදරය හා යා වන විට, කවියෙන් ලබන වින්දනයද අතිශයින් තීව්‍ර වෙයි. මෙපරිදි සාහිත්‍ය රස වින්දනයට හුරු වන දරුවා, උසස් සාහිත්‍යයට වඩ වඩාත් සමීප වන්ට වෙයි.

අවිඥානිකව මෙන්, සාහිත්‍ය රස වින්දනය තම ජීවිතයේ කොටසක් කරගනියි. මහින්ද හිමියන් විසින් ස්වභාව සෞන්දර්යය පිළිබඳව පබඳන ලද ළමා කවි ගී, දරුවාගේ සාහිත්‍ය රස වින්දනයේ සවිමත් අඩිතාලමක් හෙවත් පදනමක් වෙතැයි කිව යුත්තේ ඒ නිසාය.

සාහිත්‍ය රස වින්දනය වූකලී, බැහැරින් ගෙනැවිත් දරුවා පිට පටවන බරක් නොවිය යුතුය. එසේම, දරුවාගේ විෂයය ලෝකයෙන් දුරස්ථව බිහිවන්නා වූ දෙයක්ද නොවිය යුතුය. ඒ වනාහී දරුවා ලෝක විෂයය පිරිසිඳ දැනගැනීමේ කාර්යයෙහිදී, ඔහුගේම අත්දැකීමක්, පෞද්ගලික කාර්යයක්, සමීප සබඳතාවක් ඇති ක්‍රියාවලියක් විය යුතුය. සාහිත්‍ය රස වින්දනය දරුවාගේ පෞරුෂ වර්ධන ක්‍රියාවලියේ අනිවාර්ය අංගයක් බවට පත් කරලිය හැකි වන්නේ එවිටය.

දැන් ''කුකුළා කතා කරයි'' යන මෙම කුඩා කවි පන්තිය දෙස බැලුව මැනවි. කුකුළා ළමයින් අමතන්නේ මෙසේය.

''නැගිටපල්ලා
ළමයිනේ
**මමයි කුකුළා
කුක්කු කූ කූ
එළි වෙලා දැන්
ළමයිනේ
නැගිටපල්ලා
කුක්කු කූ කූ
පොත් අරන්
පාඩම් කරල්ලා
ළමයිනේ දැන්
කුක්කු කූ කූ
උදේ නැගිටින
ළමයි කවුරුත්
මගේ යාළුවෝ
කුක්කු කූ කූ''**

කුඩා ළමයින් මේ කව ග්‍රහණය කරගන්නේත්, එහි රස විඳින්නේත් ඈතින් සිටගෙන නොවේ. මේ කුකුළා තමන්ගේ යහළුවකු බව පසක් කරගෙන, කුකුළාගේ හඬ ඇසෙන මායිමේ සිටගෙනය.

ස්වකීය ළමා පද්‍ය රචනයෙහිදී මහින්ද හිමියන් කවි බස යොදාගන්නේ, අතිශයින්ම ජීවමානාකාරයෙනි. ඒ සජීවිබවට හේතු වන කාරණා අතර, සිංහල බසෙහි ව්‍යංජන ගුණයත්, වාග් රටාවනුත් එහිමියන් විසින් පිරිසිඳ දැන සිටි ආකාරය සටහන් කරනු සුදුසුය. ඊටද අමතරව, අපේ සම්භාව්‍ය කවි බස මෙන්ම ජනකවි බසද ඉතා සීරුවෙන් හැදෑරීමෙන්ද, ඒ දෙබසම නිර්මාණශීලි ලෙස වහරමින්ද, උන්වහන්සේගේ කවි බස නිර්මාණය වූ වග පෙනී යයි. නිදසුනක් වශයෙන්, ''**උයන් සිරි**'' නමැති රචනය දෙස බැලුව මැනවි.

මෙහිදී ළමයකු සිය නැගණිය අමතා, කියන්නේ මෙපරිදිය.

''ගසුත් උසයි අතුත් බරයි බිමට නැමීලා
**එහෙන් මෙහෙන් ගෙඩිත් තිබේ හොඳට ඉදීලා**

**සුළං හමයි කොළන් සැලෙයි ගෙඩිත් වැටෙන්නා**
**වටින් පිටින් රේණු වැටී ඇඟත් වැහෙන්නා**

**ගිරා පැටවු පියාඹා ගහේ වහන්නා**
**ටිටිං ගගා ලේනො රැළක් බයේ දුවන්නා**

**කුරුල්ලෙකුත් අපේ දිහා එබී බලන්නා**
**යමන් නගෝ, යමන් නගෝ වැහිත් වහින්නා''**

මේ වූකලී මහින්ද හිමියන් විසින් ගීත සම්ප්‍රදාය මත නිදහස්ව පිහිටා කරන ලද සරල නිර්මාණයකි. එසේද වුවත්, අපේ කවි බස, මෙතරම් පහසුවෙන් වහරන්ට, නිර්මාණශීලී ලෙස යොදාගන්ට, අපේ ජනතාවගේ බසත්, එතුළ වන වාග් රීතියත්, ඒ බසෙහි වන ස්වයංසිද්ධ ගීතස්වරයත් මනා කොට හඳුනාගැනීම අවශ්‍ය වෙයි. ඒ සඳහා, දීර්ඝ කාලීන අභ්‍යාසයක්ද අවශ්‍යය. මහින්ද හිමියන්ගේ මෙම රචනයත් සෙසු බොහෝ රචනාත් පිටුපස ඇති ඒ දීර්ඝකාලීන ශික්ෂණය සැබැවින්ම ප්‍රශංසනීය වෙයි.

ළමා කවිය හා ගීතය සාහිත්‍ය ක්‍රියාවලියක් තරමටම, අධ්‍යාපන ක්‍රියාවලියක්ද වෙයි. මෙම දෙකාර්යයෙහිදීම අවශ්‍ය වන මූලික කාරණයක් වනුයේ, දරුවන්ගේ ආකල්ප නිවැරදි කිරීමය. එසේ නිවැරදි කොට වර්ධනය කරන්නා වූ ආකල්ප සමුදාය හේතුකොටගෙනය, දරුවා ස්වකීය විෂය ලෝකය වටහාගන්නේත් ජීවිතයේ අර්ථාන්විතබව මඳින් මඳ ප්‍රත්‍යක්ෂ කරන්නේත්. මෙම දෘෂ්ටියෙන් විමසා බැලිය යුතු රචනා මහත් රාශියක්, මහින්ද හිමියන් අතින් බිහිව ඇත්තේය. ඉතාම ප්‍රබල නිදසුනක් හැටියට ''යුතුකම'' නමැති රචනය ඉදිරිපත් කළ හැකිය. ඉතා සුප්‍රකට මෙම කවි පෙළෙහි අඹ ඇටයක් සිටුවන මහල්ලාගෙන් ළමයා අසන ප්‍රශ්නය මේය.

**''දුක සේ සිටුවා අඹ ඇටයක් අද**
**එක අඹයක්වත් කන්ට ලැබේවිද''**

මානව වර්ගයාගේ පැවැත්ම උදෙසා, එක් පරම්පරාවක් විසින් ඉටු කළ යුතු යුතුකම් සම්භාරය - කළයුතු වන පරිත්‍යාගය - ළපටි වියේ සිටින මේ දරුවා දන්නේ නැත. මහල්ලා එය දරුවාට කියා දෙයි.

**''මම ළමයෝ මින් අඹයක් නොපතමි**
**යුතුකම පමණක් ඉටුකොට තබනෙමි''**

එහෙත් මහල්ලාගේ පිළිතුරෙන් දරුවා සෑහීමට පත් නොවෙයි. එසේ නොවන්නේ, මෙතැන්හි, යුතුකම නමැති සංකල්පය කිමෙක්දැයි ග්‍රහණය කරගන්ට ඔහු අසමත් වන හෙයිනි. ''යුතුකම'' වූකලී හුදු මනෝමූලික දෙයකි. එහි අර්ථලාභය කිමෙක්දැයි දරුවාට වැටහෙන්නේ නැත. එහෙයිනි, ඔහු තවත් ප්‍රශ්නයක් නගන්නේ.

**''තමන්ට නොලැබෙන දේකින් ලෝකෙට**
**කරන්ට හැකි දේ නොම තේරේ මට''**

දරුවාට, ඊට වැඩි චින්තනයක් නැත. ඔහුට ඊට වැඩි දෙයක් වටහාගැනීමද අසීරුය. ''යුතුකම'' නමැති සංකල්පය මිනිස් වර්ගයාගේ යහපැවැත්මට අවශ්‍ය වන්නාවූ ප්‍රායෝගික ක්‍රියාවලියක්ම බැව්, දරුවා වටහාගන්නේ මහල්ලා එය මෙපරිදි දක්වූ විටය.

**''පෙර උන් අය සිටවූ අඹ ගස්වල**
**පලයෙන් අපි කවුරුත් ලබනෙමු පල**
**අපෙන් පසුව එන අයටත් එම පල**
**ලැබෙන්ට සැලසුම අපගේ යුතුකම''**

**යුතුකම** යනු, හුදු මනෝමූලික සංකල්පයක් නොව, අතිශයින්ම ප්‍රායෝගික වූ මානව ක්‍රියාවලියක් බව දරුවා වටහාගන්නේ, එය, මෙම රචනයෙහි එන අනුභූතියෙහි පිහිටුවා දක්වූ විටය. දරුවන්ගේ ආකල්ප සම්පත්තිය කෙරෙහි මහින්ද හිමියන්ගේ කවි ගීවල බලපෑම ඉමහත්ය. එය ගුණධර්ම වර්ධනයට බලපෑම් ඇති කරන්නේ, අතිශය නිර්මාණාත්මක රීතියකිනි.

මහින්ද හිමියන් විසින් ලියන ලද බොහෝ කවි කතන්දරද දරුවන්ගේ ආකල්ප වර්ධනය කෙරෙහි බලපායි. ඊටද අමතරව, දෙබස් මගින්ද, ගුණ දහම් පහදා දෙන්ට උන්වහන්සේ පෙලඹෙති. ඇතැම් විටෙක දරුවනට, අහිංසක විනෝදාස්වාදයක් ලබාදීමේ අරමුණින් ලියවුණු සරල රචනාද දක්නට ලැබෙයි. මේ හැම තැනෙකදීම, දරුවන් සිය වසඟයට ගැනීමට හැකි රචනා රීතියක් හා බස් වහරක් යොදාගැනීමටද උන්වහන්සේ සමත් වෙති.

නිදසුනක් හැටියට ''**අණ බෙරයක්**'' නමැති රචනය විමසනු වටියි.

ඒ කාලයේ පාසල් දරුවන්ගේ මන්ද පෝෂණය හේතුකොටගෙන ඇති වූ පාණ්ඩු රෝගයට, පාසල්වලට පැමිණ බෙහෙත් දුන් අයුරු, මෙකල්හි වැඩිහිටියන්ට මතක ඇත. මේ බෙහෙත් ගැමියන් විසින් හඳුනවන ලද්දේ, ''**පණු බේත්**'', ''**කොකු පණු බේත්**'' යන සරල නම්වලිනි. අණබෙරකාරයා ළමයින් අමතන්නේ මෙසේය.

**''එන සිකුරාදා**
**කොකු පණු දොස්තර**
**එනවලු ළමයිනි**
**ඩුං ඩුං ඩුං**

**හොර ලෙඩ අරගෙන**
**නැවිත් ඉන්නට**
**හොඳ නෑ ළමයිනි**
**ඩුං ඩුං ඩුං**

**බෝතල් බාජන**
**අරන් වරෙල්ලා**
**ඇහුණද ළමයිනි**
**ඩුං ඩුං ඩුං**

**කොකු පණු බේතෙන්**
**පාංඩු පිප්පුම**
**සනීප වෙනවලු**
**ඩුං ඩුං ඩුං''**

මේ සුගම හෘදයංගම රචනා රීතියෙන් උන්වහන්සේගේ ළමා කවි බබළන්ට වෙයි. ''මුගුණුවැන්න'' ගැන කියන මෙම පුංචි කවි තුනත් විමසන්න.

**''ආයු එන්න**
**ලෙඩ නොවෙන්න**
**කතොත් මෙන්න**
**මුගුණුවැන්න**

**ඇහේ පෙනුම**
**දියුණු වේවි**
**ඉහේ රිදුම**
**දුරු කෙරේවි**

**ඇගේ කදිම**
**ඔප වැටේවි**
**ඉබේ නියම**
**සැප ලැබේවි''**

ළමා කවි ගී රචනයේදී මහින්ද හිමියන්ගේ අභිප්‍රාය වී ඇත්තේ, දරුවන්ට ග්‍රහණය කරගත හැකි මට්ටමේ නිවැරදි සජීවී වාග් රටාවන් ඉදිරිපත් කිරීමය. මෙම වාග් රටාවන් නිසි පරිදි විග්‍රහ කරමින්, දරුවන්ගේ භාෂා අධ්‍යාපනයද හරවත් කරනු හැකි වෙයි.

**''මවක් නම් පොළෝ ඇගෙ හොඳ**
**දියණි සිරිලකයි**
**මෙලොව හැම දෙනා තරගව**
**ඇයට පිය කරයි**

**සුගත් සම්බුදුන් තෙවරක්**
**වැඩම කළ රටක්**
**මෙසිරිලක මිසක් ලොව තුළ**
**ඇද්ද වෙන රටක්''**

**ඇස්. මහින්ද කවියා** දරුවනට තම රට ගැන කියාදුන්නේ, එසේය. දරුවාගේ අධ්‍යාපනයේ මෙන්ම පෞරුෂ වර්ධනයේද එක් අනිවාර්ය අංගයක් වනුයේ, ඔහු තම රට ජාතිය ගැන දක්වන ඉෂ්ටදායක වූ ආකල්පයයි. ලොවේ හැම රටක්ම නැගිට්ටේ, පුංචි ගම් වශයෙන් හෝ ඊට ටිකක් ලොකු පළාත් වශයෙන් හෝ හිතා නොවේ. ලොකු මහාද්වීප හැටියට හිතාද නොවේ. රටවල් ගොඩනැගුණේ, නැගිට සිටියේ, ජාතීන් වශයෙන් හිතාය. **ජාතිය** යනු, කිසියම් ජනකායක් සමගි

බැම්මෙන්ද කිසියම් අනන්‍යතාවකින්ද එකට බැඳ තබන මහ බලයක් වෙයි. එසේ හෙයින් හැම රටකම ජාතික හැඟීම, ජාතිකත්ව හැඟීම (එය ජාතිවාදය නම් නොවේමය.) දරුවන්ගේ පෞරුෂ වර්ධනයේ බලවත් ප්‍රතිෂ්ඨාවක් වෙයි. එහෙයින්ම එය අධ්‍යාපන ක්‍රියාවලියේද අනිවාර්ය අංගයක් වෙයි. ඒ නිසාම සාහිත්‍ය නිර්මාණ කාර්යයේද අනුල්ලංඝනීය කොටසක් වෙයි.

මහින්ද හිමියන්ගේ බොහෝ ළමා කවි ගී තුළ, ජාතිකත්වය පිළිබඳ මෙම සංකල්පය ඉතා තියුණුව ඉස්මතුව පෙනෙයි. ලංකාව ගැන ලියූ කුඩා රචනය උන්වහන්සේ අවසන් කෙළේ මෙම පද්‍යයෙනි.

**''මෙසේ සව්සිරින් සපිරුණු**
**රටක ඉපදුමත්**
**මෙඅප හැමදෙනා පෙර කළ**
**වාසනාවකී''**

එපරිදි දරුවා තුළ ජනනය කෙරෙන දේශ භක්තිය, ඔහුගේ පෞරුෂ වර්ධනය මෙන්ම, අර්ථපූර්ණ ජාතික නිදහසේත්, ජාතික නැඟීසිටීමේත් මහා බලවේගයක් වෙයි.

# ළමා කියවීමේ රුචිය උද්දීපනය කරනු පිණිස පදනම් කරගත යුතු ළමා මනෝවිද්‍යාත්මක සංකල්ප

- සම්මානිත මහාචාර්ය අධිනීතිඥ රෝලන්ඩ් අබේපාල*

ළමා සාහිත්‍ය නිර්මාණකරණයෙහි විවිධ අංශ පිළිබඳ සලකා බලන විට ළමයින් උදෙසා ලිවීම හෝ නිර්මාණය කිරීම වඩාත් බැරෑරුම් කාර්යයක් බව පෙනී යයි. යමක් ලියන විට හෝ නිර්මාණය කරන විට පළමුව අදාළ විෂය හෝ අත්දැකීම පිළිබඳ අවබෝධයක් අවශ්‍ය වේ. දෙවනුව එම නිර්මාණය බිහිකරන මාධ්‍ය පිළිබඳ අවබෝධය අවශ්‍ය වේ. ළමයින් උදෙසා සාහිත්‍ය හෝ වෙනයම් මාධ්‍යයක නිර්මාණ කරන විට ඉහත කී අවශ්‍යතා දෙකට අමතරව තෙවැනි අවශ්‍යතාවක් ද පැන නගිනු ඇත. එනම් ළමයා පිළිබඳ අවබෝධයයි. ළමයින් උදෙසා නිර්මාණයේදී ලේඛකයා කොතරම් උගත් උසස් හා ප්‍රවීණ අයකු වුව ද ළමයාගේ මට්ටම දක්වා පහළට බැසීමට සිදු වනු ඇත.

ළමයින් උදෙසා නිර්මාණකරණයෙහි යෙදෙන ලේඛකයා, නාට්‍යකරුවා ළමයින්ගේ මට්ටමට බහින්නේ කෙසේ ද නැතහොත් ළමයින් පිළිබඳ අවබෝධය ලබන්නේ කෙසේ ද යන්න විමසිය යුත්තකි. සාර්ථක ළමා නිර්මාණකරුවන්ගේ කෘතීන් අධ්‍යයනය කරන විට හා ඔවුන්ගේ අදහස්, අත්දැකීම්, මත ප්‍රකාශන අධ්‍යයනය කරනවිට දෙවදෑරුම් ලෙස මෙම අවබෝධය කරා ළඟාවිය හැකි ය. පළමුවැන්න නම් ලේඛකයා ළමා කාලය පිළිබඳ ලබා ඇති අත්දැකීම් වේ. ළමයින්ගේ කතාබහ, රුචි අරුචිකම්, ක්‍රීඩා ස්වභාවය, වීරකම්, බියගුලු හා දඟකාරකම්, රණ්ඩු දබර, හොඳ නරක සිතිවිලි යනාදී විවිධ හැසිරීම් ස්වභාවයන් පිළිබඳ තමා සතු විස්තරාත්මක දැනුම හා අත්දැකීම් තුළින් ළමා ලෝකය පිළිබඳ පැහැදිලි චිත්‍රයක් මනසෙහි නිර්මාණය කර ගත හැකි ලේඛකයාට ළමයින්ගේ මට්ටමට ප්‍රවේශ වී නිර්මාණකරණයෙහි යෙදීම අපහසු නොවේ. දෙවැනි ආකාරය නම් ළමයින් පිළිබඳ යථෝක්ත අවබෝධය ඉගෙනීම හෙවත් අධ්‍යයනය කිරීමයි. ළමයින් පිළිබඳ හැදෑරීම ද දෙයාකාරයෙන් කළ හැකි ය. පළමුවැන්න නම් සැබැවින් ම ළමයින් සමඟ හැසිරීමෙන්, කටයුතු කිරීමෙන් අත්දැකීම් ලැබීම ය. ප්‍රායෝගික වශයෙන් මේ ක්‍රමය වඩා වැදගත් ය. ළදරු පාසල්වල හා ප්‍රාථමික පන්තිවල උගන්වන ගුරුවරුන්ට මේ අවබෝධය නිතැතින්ම ලැබෙයි. එවැනි ගුරු භවතුන්ට ළමා නිර්මාණනකරණය වඩා පහසු වන්නේ එබැවිනි. ළමා නිර්මාණවල යෙදෙන ලේඛක ලේඛිකාවන්ගෙන් හා නාට්‍ය නිෂ්පාදකවරුන්ගෙන් වැඩි දෙනෙකු ගුරුවරුන් වශයෙන් අත්දැකීම් ලැබූ අය බව පෙනී යයි.

ළමයින් පිළිබඳ හැදෑරීමේ අනෙක් ක්‍රමය අධ්‍යාපනික හා මනෝවිද්‍යාත්මක ක්ෂේත්‍රවල අනාවරණයන් ඔස්සේ අධ්‍යයනය කිරීමයි. ආරයෙන් හා පරිසරයෙන් ලබා ගන්නා මූලික

---

* සම්මානිත මහාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය

විභව්‍යතාවන් අනුව මේරීමත්, පරිණතියත් ඔස්සේ ළමයා අනුක්‍රමයෙන් ඉගෙනුම ලබා ගන්නා ආකාරයත්, එසේම බුද්ධිමය පරිපාකයත් සමඟ සෞන්දර්ය ආස්වාදය හා නිර්මාණාත්මක කුසලතාවන් වර්ධනය වීම දක්වා ක්‍රියාවලිය ළමා සංවර්ධනය තුළින් කෙනෙකුට අධ්‍යයනය කළ හැකිය. විශේෂයෙන්ම අද මනෝවිද්‍යාවේ අධ්‍යයන ක්ෂේත්‍රය තුළින් ළමයාගේ ශාරීරික, සාමාජික, මානසික, චිත්තවේගික, බුද්ධිමය මෙන්ම නිර්මාණාත්මක හැසිරීම් ස්වභාවයන් අධ්‍යයනය කළ හැකිව තිබීම ළමා සාහිත්‍ය නිර්මාණකරුවන්ට වාසිදායක වන්නකි. ළමා සංවර්ධන විෂයයෙහි එක් එක් වර්ධන අවධීන්හි විද්‍යාමාන ළමා හැසිරීම් චර්යාවන් අධ්‍යයනය කළ මනෝ විද්‍යාඥයින්ගේ සොයා ගැනීම් අතර ජීන් පියාජේගේ අනාවරණ, ළමා සාහිත්‍ය නිර්මාණකරුවන්ට අතිශයින් ම වැදගත් ය. ඔහු පෙන්වා දෙන පරිදි ළමයා උපතේ සිට පළමු අවුරුදු දෙක දක්වා කාලය තුළ හැසිරෙන්නේ නිසි මානසිකත්වයකින් නොවේ. එනම් ළමයාගේ ක්‍රියාකාරිත්වය හිතාමතා මනසින් මෙහෙයවන බවක් පෙනී නොයයි. මෙකල ළමයාට ඇතිවන්නේ හුදු සංවේදනයක් පමණක් නිසා යමක් මැනවින් සංජානනය කරගැනීම අසීරු ය. ඉගෙනීම සිදු වන්නේ වැඩි වශයෙන් ම තැත් වරද ක්‍රමයට වන අතර මෙය බොහෝ දුරට සත්ව චර්යාවන්ට සමාන වේ. එසේම මෙකල ස්වයං ක්‍රියාකාරීව සිදු වන ඉන්ද්‍රිය ක්‍රියාකාරිත්වයක් සහිත වකවානුවක් බැවින් ඉන්ද්‍රිය චාලක අවධිය ලෙස නම් කර ඇත.

අනතුරුව එළඹෙන අවු.2-5 අතර කාලය  පූර්ව සංකල්පන අවධිය ලෙස හැඳින්වේ. එනමින්ම පැහැදිලි වන්නේ මෙකල ළමයාට සංකල්ප වටහා ගැනීම අපහසු බවයි. සංඥා හා ශබ්ද හඳුනා ගැනීමට හැකි වීම නිසා මෙකල භාෂාව පරිහරණය කිරීමේ හැකියාව(කථනය) සීඝ්‍රයෙන් වැඩෙයි. එසේම මානසිකව සිතා බලා කටයුතු කිරීමට හැකියාව ලබන නිසා චින්තන හැකියාව ද වර්ධනය වේ. මෙකල ළමයා වාචික උපදෙස් මත පාලනය කිරීම අසීරු බව පෙනී යන අතර වඩා අවශ්‍ය වන්නේ ක්‍රියාකාරී උපදෙස් ය. එනම් අවවාද, උපදෙස් හා අදහස් හුවමාරු කරගැනීමේදී වැඩි වශයෙන් කිසියම් ක්‍රියාවක් හා සම්බන්ධ කිරීම අවශ්‍ය වේ. මෙකල ළමයාගේ හැදියාව සම්බන්ධයෙන් වඩා වැදගත් වන්නේ, ක්‍රීඩාව හා අනුකරණාත්මක ක්‍රියාකාරකම් ය. එනිසා මෙකලට යෝග්‍ය වන්නේ, ක්‍රීඩාව, අනුකරණය, කවි, සින්දු පදනම් කර ගන්නා ලද නිර්මාණ ක්‍රියාවලියකි.

ළමයා පොත පත කියවීමට සමීප කළ හැක්කේ අවුරුදු තුනෙන් පසුව ය. ඊට හේතුව නම් මානසික මෙහෙයුමකින් යුතුව යමක් කිරීමටත්, තමන් කරන දේ කලින් නම් කිරීමටත් හැකියාව ලැබෙන හෙයිනි. බොහෝවිට මෙකල ළමයින්ට අකුරු කියවීම අරඹන්නේ එහෙයිනි.

ළමා සංවර්ධනය සම්බන්ධයෙන් ප්‍රතිභා චින්තන අවධිය අවුරුදු 5-7 අතර කාලය තුළ එළඹෙන්නකි. මේ කාලයේදී ළමයා තමන් කරන දේ නම් කරනවාට අමතරව හේතු දැක්වීමට ද ඉදිරිපත් වනු ඇත. එසේම මනෝවිද්‍යාත්මක වශයෙන් ආත්ම කේන්ද්‍රීත ස්වරූපයක් දරන අතර තමන්ගේ අවශ්‍යතා ගැන පමණක් වැඩි සැලකිල්ලක් දක්වනු ඇත. ළමයා යම් නාට්‍යයක හෝ කතන්දරයක සමස්තයම නොව, තමන්ට වඩා රුචි, තමා පිනවන තැනකට පමණක් අවධානය දක්වයි. එකවර  සමස්තය සංජානනය කර ගැනීමට වඩා තැනින් තැන කෑලි, සිදු වීම්, ආදී වශයෙන් සංජානනය කර ගනියි. මෙම අවධියට සුදුසු සාහිත්‍යමය කතා හා ක්‍රියාකාරකම් පෙරට වඩා තරමක් සංකීර්ණ කළ හැකිය. චරිත සිදුවීම් හා ක්‍රියාකාරකම් පෙරට වඩා වැඩි කළ හැකි ය. කාලය වශයෙන් විනාඩි 10-20 ප්‍රමාණයට සීමා කිරීම සුදුසු වන්නේ ඊට වැඩි කාලයක් එක එල්ලේ අවධානය රඳවාගෙන සිටීම ළමයාට අපහසු බැවිනි. මෙකල බුද්ධි වර්ධනය පිළිබඳ මෙන්ම සංකල්ප හඳුනා ගැනීමේ හැකියාව ද සීඝ්‍රව වර්ධනය වීම විශේෂ ලක්ෂණයකි. සංකල්ප සාධනය සම්බන්ධයෙන් තවදුරටත් විමසිලිමත් වන විට මෙම අවධිය සංයුක්ත සංකල්ප පමණක් ග්‍රහණය කර ගන්නා අවධියක් ලෙස හඳුනාගත හැකි ය. සංයුක්ත සංකල්ප යනු අපට දකින්නට හැකි

භෞතික පැවැත්මකින් යුක්ත දේවල් ලෙස සරලව හැඳින්විය හැකි ය. අම්මා, තාත්තා, ගස කුරුල්ලා, සරුංගලය, බෝලය, පොත යන දේවල් සංයුක්ත සංකල්ප සඳහා නිදසුන් වශයෙන් හැඳින්විය හැකි ය. මෙම අවධියේ ළමයින් උදෙසා කෙරෙන නිර්මාණවලදී වැඩි වශයෙන්ම ඇසුරුකොට ගත යුත්තේ සංයුක්ත සංකල්ප බව සඳහන් කළ යුතු ය. මන්දයත් ළමයාට පහසුවෙන් අවබෝධ වන්නේ සංයුක්ත සංකල්ප පමණක් බැවිනි.

පියාජේගේ විග්‍රහය අනුව ප්‍රතිභා චින්තන අවධියෙන් අනතුරුව ළමයා එළඹෙන්නේ ක්‍රියාකාරී චින්තන අවධියට ය. එම අවධියේ පළමු අදියර අවුරුදු 7-11 අතර දිවෙන සංයුක්ත ක්‍රියාකාරී චින්තන අවධියයි. සංයුක්ත ක්‍රියාකාරී අවධියේ පසුවන ළමයා තථ්‍ය හෙවත් පවතින තත්වයට සම්බන්ධ දේවල් ගැන පමණක් චින්තනය මෙහෙයවයි. පවතින දේවල් විවිධ භාණ්ඩ වස්තූන් හා පුද්ගලයන් සමඟ ක්‍රියාකාරීව සිදු වන ක්‍රීඩාව වැනි ක්‍රියාකාරකම් මේ යුගයේ බහුලව දැකිය හැකිය. ක්‍රීඩාව, අනුකරණය වැනි විවිධ ක්‍රියාකාරකම් උදෙසා මනාව පදම් වී සිටින මේ යුගයේ ළමයින් උදෙසා එවැනි ක්‍රියාකාරකම් බහුල ස්වභාවය මූලික ලක්‍ෂණයකි. විවිධ සිදුවීම් අතර වෙනස්කම්, කිසියම් සිදුවීමක් එක් තත්ත්වයකින් තවත් තත්ත්වයකට පරිවර්තනය වීම, එක් එක් සිදුවීම් සාපේක්ෂ වශයෙන් පුද්ගලයාගේ එදිනෙදා ජීවිතයට බලපාන ආකාරයේ සිදුවීම් මෙකලට සුදුසු ළමා කතාවල මූලික ලක්‍ෂණ ලෙස හඳුනා ගත හැකි ය.

අනුකරණය මේ වන විටත් ළමයා තුළ පැහැදිලි වශයෙන් වර්ධනය වී තිබෙන මනෝවිද්‍යාත්මක ලක්‍ෂණයකි. ස්වභාවයෙන් ම ළමයා තුළ ඇති වන ලක්‍ෂණයක් වන මෙම අනුකරණ හැකියාව ළමා නිර්මාණකරණයේදී අතිශයින් ම ප්‍රයෝජනවත් වන්නකි. ජීවිතය පුරා තමන් විසින් ඇසූ දුටු දේ අත්දැකීම් ලෙස තැන්පත් කර ගෙන සිටින ළමයා යම් යම් අවස්ථාවලදී නොපැකිළව ඒවා අනුකරණයෙන් දැක්වීමට පෙලඹෙනු ඇත. චරිත නිරූපණයේදී මේ හැකියාව ප්‍රයෝජනවත් වනු ඇත.

ආත්ම කේන්ද්‍රීය ස්වභාවය ද ළමයා තුළ දක්නට ලැබෙන තවත් මනෝවිද්‍යාත්මක ලක්‍ෂණයකි. අවු.-5ට අඩු ළමයා තුළ මෙය වැඩි වශයෙන් ප්‍රදර්ශනය කෙරෙන අතර පාසල් යාමත් සමඟ එය ටිකින් ටික අඩු වනු දක්නට ලැබේ. මේ නිසා ළමයින් උදෙසා කෙරෙන නිර්මාණවලදී ආත්ම කේන්ද්‍රීය ස්වභාවය ටිකින් ටික අඩු කරන ස්වභාවයේ සිදුවීම් ඇතුළත් විය යුතු ය. මන්දයත් ආත්ම කේන්ද්‍රීය ස්වභාවය ළමයින් අතර සමගියට සාමුහිකත්වයට හා සුහද සබඳතාවලට බාධාවක් වන හෙයිනි. එසේම එය වර්ධනය වීම ළමයාගේ යහපත් සමාජ සබඳතා සහිත සමාජීය වර්ධනයට ද බාධාවකි. එනිසා ළමා කතාවලට වස්තු වියයුත්තේ හුදු ආත්ම කේන්ද්‍රී බව ඉක්මවන සමාජ කේන්ද්‍රීය අත්දැකීම් ය. එනම්, තමන්ගේ දේවල් අනුන්ට දෙන, හැමවිටම තමන්ටම බෙදා ගන්නවාට වඩා අන්‍යයන්ට ද බෙදන තමන්ගේ ලොකුකම පමණක් නොව අන්‍යයන් ද අගයන, හුදු පෞද්ගලිකත්වය ඉක්මවා පොදු සමාජයීය සාමුහිකත්වය දනවන සිදුවීය.

කුතුහලය ළමා නිර්මාණකරණයට පදනම් විය යුතු තවත් මනෝවිද්‍යාත්මක ලක්‍ෂණයකි. කුතුහලය මිනිසාගේ සහජ අවශ්‍යතාවකි. ලෝකය අනාවරණය කර ගැනීමට තැත් කරන ළමයා, කවුද ? මොනවා ද? කාගේද? කොහේ ද? කොහොමද? ආදී වශයෙන් විවිධ ප්‍රශ්න නගනු ඇත. ළමයින් උදෙසා කෙරෙන සාහිත්‍ය නිර්මාණවලින් මෙන්ම ළමා නාට්‍යවලින් ද ළමයා තුළ වැඩෙන මෙම කුතුහලය සන්තර්පණය කිරීමට සමත්විය යුතුය. ළමයා තුළ කුතුහලය ක්‍රමයෙන් අවුස්සා එය වැඩෙන්නට හැර අනුක්‍රමයෙන් එය සන්තර්පණය කිරීමේ ක්‍රියාමාර්ගය ළමයා සාහිත්‍ය-කලාව කරා රැගෙන යාමේ උපාය මාර්ගයක් ද වනු ඇත.

කතන්දර ඇසීමට ළමයා දක්වන අභිරුචිය ළමා සාහිත්‍යකරුවාට තෝතැන්නකි. වැඩිහිටි සාහිත්‍ය කෘතියක කතන්දරය එතරම් වැදගත් නැතත් ළමා සාහිත්‍ය කෘතියක කතන්දරය වැදගත් ය. අම්මා, තාත්තා, නංගී. මල්ලී, ආදී වශයෙන් තම පවුලේ තොරතුරු පමණක් දැනගෙන සිටින

ළමයා අනෙකුත් මිනිසුන් ගැන, ඔවුන් කරන කියන දේවල්, ඔවුන්ගේ රැකියා, කතාබහ ආදී වශයෙන් අනෙක් මිනිසුන් ජීවත්වන ආකාරය ගැන අවබෝධය ලබන්නේ කතන්දරවලිනි. එසේම අනෙක් මිනිසුන් පිළිබඳ දයාව, ආදරය, කරුණාව වැනි යහපත් ආකල්ප ඇති කර ගන්නේ ද කතන්දර මගිනි. මේ නිසා ළමා පොත්වල කතාව ළමයා සම්බන්ධයෙන් ඉතා වැදගත් ය. නරක, නපුරු, භයානක මිනිසුන්, හොල්මන්, අවතාර, බියගැන්වීම්, ත්‍රාසජනකත්වය, දූෂණය, වංචාව, දුක් දෝමනස්සය, හිංසාව, මනුෂ්‍ය ඝාතනය වැනි සංසිද්ධි ළමා කතාවලට වස්තු නොවිය යුතු ය. එමගින් සමාජයීය හෝ අනෙකුත් මිනිසුන් පිළිබඳ පූර්ව විනිශ්චය හෝ හානිකර හා සෘණ ආකල්ප ළමයා තුළ හට ගැන්වීම සුදුසු නො වේ.

ළමා කතා මගින් ළමයා තුළ ඇති කළ යුත්තේ සෙසු මිනිසුන් හා සමාජය පිළිබඳ යහපත් ධනාත්මක ආකල්ප වේ. එනිසා ළමා කතාවලින් ළමයින් තුළ කරුණාව, දයාව, අනුකම්පාව, වීරකම, නිර්භීතකම, අනුන්ට උපකාරී වීම, තමන්ගේ යුතුකම නොපැකිළව ඉටු කිරීම, පරාර්ථය, පොදු යහපත, සත්‍යගරුක බව, ඉවසීම වැනි චර්යාවන් ආශ්‍රිතව චිත්තවේගික හැඟීම් වර්ධනයට අවස්ථාව සැලසීම වැදගත් ය. ළමයාගේ අභ්‍යන්තර මේරීමට හා පරිණතියට මෙවැනි චිත්තවේගික හැඟීම් හා ආකල්ප වර්ධනය කරලීම ඉතා අවශ්‍ය වේ. ළමා සාහිත්‍යයට පදනම් වන කතාවක ළමයාට ගෝචර වන යම් අර්ථයක් ගැබ්විය යුතු ය. එය හැම විටම ආදර්ශයක් විය යුතුම නැතත් යහපත් වීම වැදගත් ය. මේ අර්ථයෙන් බලන විට අප රට ළමයින් උදෙසා බොහෝවිට කියනු, රඟ දක්වනු හා ඉදිරිපත් කරනු ලබන ගමරාල කතා, මහදැනමුත්තා කතා, නරියා පිළිබඳ ඇතැම් කතා, සුරංගනා කතා වැනි ප්‍රචලිත කතා සාහිත්‍යයේ ළමා මනසට ගෝචර වන එවැනි හරයක් නොමැති බව පෙනී යයි. මෝඩ වැඩක්, කපටිකමක් කර කෙනෙක් විපතට පත්වී ඊට හිනාවෙන මෙවැනි කතා විසිඑක් වන ශතවර්ෂය කරා සංවර්ධනය වන ළමා මනසට කොතෙක් දුරට ගෝචරවේදැයි ළමා කතාකරුවන් අමුතුවෙන් සිතා බැලිය යුත්තකි.

එසේම සුරංගනා කතා කලක් ළමා නිර්මාණ කෘතිවලට පදනම් කර ගනු ලැබුව ද ළමා සංවර්ධනය පිළිබඳ මනෝවිද්‍යාව හා අධ්‍යාපනික දියුණුව නිසා අද සුරංගනා කතා ළමා නිර්මාණ සම්බන්ධයෙන් වැදගත් කොට සලකනු නොලබයි. සිතූ පැතූ දේ ලැබෙන ඇලඩින්ගේ පුදුම පහන, බෝංචි වැල දිගේ දිව්‍ය ලෝකයට යාම, මායාකාරියගෙන් ලැබෙන ගුළි තුනේ වරම, දුප්පත් දර කපන්නාට ශක්‍රයාගෙන් රත්‍රන් පොරවක් ලැබීම වැනි සුරංගනා කතාවලින් ළමා මනස අවුල් කෙරෙන බවත් ඇත්තටම නැති දේවල් කෙරෙහි බලාපොරොත්තු ඇති කර මනෝ ලෝකවලට ගෙන යන ළමයා යථාර්ථය තුළ අතරමං කෙරෙන බවත් අද සලකනු ලබයි.

ළමා සංවර්ධනය පිළිබඳ පියාජේ දැක්වූ අවසාන අවස්ථාව එළඹෙන්නේ විධිමත් චින්තන අවධිය වශයෙන් සැලකෙන අවු.11-14 අවධියයි. මෙම වකවානුවට එළඹෙන විට නව යෞවනෝදයට එළඹෙන ළමයා පෙරට වඩා විධිමත් ලෙස චින්තනය මෙහෙයවයි. පෙර නොවූ විරූ ලෙස ශරීරයේ බාහිර හා අභ්‍යන්තරික වශයෙන් ද ලිංගික හා ද්විතීය ලිංගික ලක්ෂණවලින් ද යුතු නව කායික ජීව බලයකින් යුක්ත මෙම අවධිය ළමා සාහිත්‍යකරුවාට වඩාත් වැදගත් වන්නේ මෙකල ළමයා තුළ සිදු වන බුද්ධිමය පරිණතියයි. එසේම නව යොවුන් අවධියේ ළමයාගේ හැසිරීමේ ස්වභාවය දෙස බලන විට ප්‍රතිවිරුද්ධ මනෝවිද්‍යාත්මක ලක්ෂණවලින් යුක්ත බව අවබෝධ කර ගැනීමද ළමා නිර්මාණකරුවන්ට වැදගත් වනු ඇත. මසුරුකම සමඟ ත්‍යාගශීලිකම ද සමාජශීලිකම සමග හුදෙකලා බව ද, සංතෘෂ්ටිය මෙන්ම දෝමනස්සය ද, යටහත් කීකරුකම මෙන්ම අකීකරු මුරණ්ඩුකම ද මෙකල ළමයා වෙතින් දැකිය හැකි ප්‍රතිවිරුද්ධ මනෝවිද්‍යාත්මක ලක්ෂණ අතර වෙයි.

නව යෞවනවියේ ළමයින්ගේ පොදු හැසිරීම් රටා අතර, දෙමාපිය ගුරුවරු ආදී වැඩිහිටි පාලනයෙන් මිදීමට උත්සාහ දැරීම, තම තමන්ගේ සමීප මිතුරන් ඇතුළු සමවයස් කණ්ඩායම් වෙත

ඇදී යාමේ ප්‍රවණතාව වැඩිවීම මූලික ලක්ෂණ ලෙස දැකිය හැකි ය. එසේම පෙරට වඩා අර්ථවත් අධ්‍යාපනයක් ලැබීම, අධ්‍යාපන අපේක්ෂණ හා වෘත්තීය ඉලක්කයක් සහිතව ඉගෙනීම මෙකල නව යෞවනයා වෙතින් දැකිය හැකි තවත් ප්‍රවණතාවකි.

නව යොවුන් වියේ හටගන්නා බුද්ධි වර්ධනයත් සමගම මෙම යුගයේ ආවේණික මුඛ්‍ය ලක්ෂණය වූ විධිමත් චින්තන හැකියාව විවිධ පැති අතු ඉති ඔස්සේ සංවර්ධනය වනු ඇත. මෙතෙක් කල් තමා ඉදිරියේ දකින්නට අසන්නට තිබෙන තථ්‍ය ලෝකය ගැන සංයුක්ත විදියට පමණක් සිතන්නට පුරුදුව සිටි ළමයා මින් ඔබ්බට වඩාත් වියුක්ත ලෙස හිතන්නට යොමු වනු ඇත. මේ අනුව වියුක්ත සංකල්ප අත්දැකීමට හසු කර ගැනීමට ඇති හැකියාව මෙකල සාහිත්‍ය නිර්මාණයේදී වඩා වැදගත් වනු ඇත. වියුක්ත චින්තය යනුවෙන් අදහස් කරනුයේ තමන් ඉදිරිපිට භෞතික පැවැත්මක් නැති දේවල් පිළිබඳ මනසින් සිතා ගැනීමට ඇති හැකියාවයි. සමාජවාදය, නිර්වාණය, ස්වර්ගය, නිදහස, යුක්තිය, සාධාරණත්වය, ජාතික සමගිය වැනි තථ්‍ය පැවැත්මක් නැති දේවල් වියුක්ත සංකල්ප වශයෙන් ගිනිය හැකිය. මෙසේ වියුක්ත ලෙස චින්තනය කිරීමේ හැකියාව වර්ධනයත් සමග ළමා නිර්මාණ ක්ෂේත්‍රයේ සීමාව බෙහෙවින් පුළුල් වනු ඇත. ඒ අනුව මෙතෙක් ළමා කතාවලට වස්තු කර ගත් සිදුවීම් කතා පුවත්වලට වඩා බෙහෙවින් වෙනස්, මානසික පරිකල්පනයෙන් යුක්ත වඩාත් සංකීර්ණ ගැටලු කරා ලේඛකයාට ගමන් කළ හැකි ය.

කුඩා කල සිට හටගෙන ටිකින් ටික අඩුවෙමින් පැවැති ආත්ම කේන්ද්‍රීය බව මෙකල වැඩි වී ඇති බව පෙනී යයි. මේ අනුව නව යොවුන් වියෙන් ඔබ්බට සාහිත්‍ය නිර්මාණය කරන විට, මම වෙනුවට අපි, සාමූහික පොදු යහපත, අනුන් ගැන සිතන, පරෝපකාරී හැසිරීම් ඔස්සේ ඇතැම් විට(විප්ලවීය) සමාජ වෙනස් කම් දක්වා විෂය පථය පුළුල් කළ හැකි ය. ළමා කෘතිවල කතා වින්‍යාසය සැකසීමේදී අවස්ථා හා සිද්ධි නිර්මාණයේදී මෙන් ම සංවාද භාවිතයේ දී ද මෙම හැකියා ප්‍රයෝජනයට ගත හැකි ය. ඒ සමගම ආපස්සට සිතා ඉදිරිය නිවැරදි කර ගැනීමේ චින්තනය හෙවත් සංරක්ෂණ චින්තන හැකියාවට ළමයා හුරුවීමත් සමග අතීතාවලෝකනය වැනි ශිල්ප ක්‍රම ළමා කතාවලට පහසුවෙන් සම්බන්ධ කරගත හැකිවනු ඇත. අන්තරාවලෝකන චින්තන හැකියාව ද මේ ආකාරයෙන්ම නව යෞවනයා තුළ වර්ධනය වන්නකි. මින් අදහස් කෙරෙන්නේ තමාගේ ජීවිතයට ම ආපසු හැරී බලා ඉදිරිය නිවැරදි කර ගැනීමේ හැකියාවයි.

උපකල්පන හෙවත් අභ්‍යුපගමනයන් අනුව සිතීමේ හැකියාව ද නව යෞවනයේදී සංවර්ධනය වන්නකි. එනම් සිදු නොවූ දෙයක් යම් තත්ත්වයක් යටතේ සිදුවිය හැකි ලෙස විකල්ප වශයෙන් උපකල්පනය කොට සිතීමේ හැකියාව මෙයින් අදහස් කෙරේ. එසේම මෙතෙක් පැවති මධ්‍යගත චින්තනය වෙනුවට විමධ්‍යගත ලෙස සිතීමේ හැකියාව ලබන නව යෞවනයා යම් සිදු වීමකට හේතුකාරක එකක් පමණක් නොව දෙපැත්තක් ඇති බවට කල්පනා කරයි. මෙසේ නව චින්තන ක්‍රමයට හුරු පුරුදු වන නව යෞවනයා පවතින තත්ත්වය අභිබවා ඉන් ඔබ්බට පරිකල්පනය කරනු ඇත. ළමා කතාවක කිසියම් සිදු වීමකට හෝ අවස්ථාවකට මුහුණ පාන ළමයා එහි මතුපිට පවතින තත්ත්වයෙන් ඔබ්බට ගම්‍යමාන අර්ථය ඔස්සේ පරිකල්පනය කිරීම හෝ ස්වකීය පරිකල්පනය තුළ එවැනි පිළිබිඹුවක් පහළ කරගැනීමට මෙම බුද්ධිමය හැකියාව ඉවහල් කර ගනු ඇත. යම් දේකට හෝ සිදු වීමකට මතුපිටින් පෙනෙන සාධකයකට වඩා තවත් සාධක බලපෑ හැකි බවත් ඒ සියල්ල සලකා බලමින් පුළුල් ලෙස චින්තනය මෙහෙයවා වඩාත් පරිණත තීන්දුවක් ගැනීමට හැකිවන බවත් නව යෞවනයාට පෙනී යනු ඇත.

එසේම සංකේතානුසාරයෙන් සිතීමේ හැකියාව ද මේ වන විට නව යෞවනයා සතු වනු ඇත. එනම් යමක් වෙනුවට යොදන වෙනත් දෙයක් ඇසුරු කොට චින්තනයේ යෙදීමේ හෝ එය තේරුම් ගැනීමේ හැකියාවයි. ළමයින් සඳහා නිර්මාණය කරන මාධ්‍යවලදී මෙය ඉතා වැදගත් මූල ධර්මයක් වනු ඇත.

කුඩා ළමයින්ගේ නිර්මාණවලට මෙවැනි සංකේතාර්ථ යෙදීම තේරුමක් නැත. එවැනි සංකේතාර්ථ තේරුම් ගත හැක්කේ අවු:12න් පසුව එළඹෙන නව යෞවන අවධියත් සමගිනි. එම අවධියේ ළමයින් සමඟ සාහිත්‍ය හෝ නිර්මාණ කටයුතු කරන විට උචිත පරිදි මෙවැනි සංකේතාර්ථ යොදා ගත හැකි වනු ඇත.

පරමාදර්ශී ලෙස චින්තනයෙහි යෙදීම මෙකල ඇතිවන තවත් බුද්ධිමය හැකියාවකි. එනම් තමා අසන, දකින, ඇසුරු කරන අය අතරින් තෝරා ගත් එක් අයෙකු හෝ කීප දෙනෙකු පරමාදර්ශී ලෙස සිතනබව නව යෞවනයා තේරුම් ගැනීමයි. ඔහු ඔවුන් අනුගමනය කරයි. ඒ අනුව හැසිරෙයි. කටයුතු කරයි. මෙම පරමාදර්ශී පුද්ගලයා තම හොඳම මිතුරා, ගුරුවරයා. දේශපාලන නායකයා විය හැකිය. චිත්‍රපට නළු නිළියන්, ගායක ගායිකාවන්, ක්‍රීඩා තරු ආදී වශයෙන් විය හැකි ය. මෙම අවධියේ ළමයින් සඳහා කලා කෘති නිර්මාණය කරන විට ළමයින්ගේ මෙම රුචිකත්වය නිර්මාණකරුවාට ප්‍රයෝජනයට ගත හැකි ය.

මේ සියල්ලෙන් පැහැදිලි වන්නේ ළමයින් සඳහා නිර්මාණ කරන විට ළමා සංවර්ධනයේ එක් එක් අවධි හා බැඳී ළමා රුචි අරුචිකම්, හැසිරීමේ ස්වභාවය, සමාජ ඉරියව්, සිරිත් විරිත්, කතාකරන වචන, ඉගෙනීම් ස්වභාවයන්, ඔවුන්ගේ අවශ්‍යතා ඉල්ලීම්, ප්‍රශ්න ගැටලු ආදී වශයෙන් සමස්ත ළමා පෞරුෂ වර්ධනයෙහිලා හේතුකාරක සාධක පිළිබඳ මනා අවබෝධයකින් සිටිය යුතු බවයි.

# Role of libraries in the promotion of reading and information literacy skills of children

Dr. G. D. Amarasiri*

Children represent an important segment of our society. Children have special information needs specially based on their formal and informal education. To fulfil these needs children need the guidance and support of adults specially teachers, librarians and parents. Librarians have special responsibility to fulfil children's information needs and promotion of their reading skills. Public libraries receive an important place in this task. In addition, school libraries can play a significant role in this process. Parents also can make an important contribution by providing a proper home environment and facilities for reading and learning.

Most public libraries have separate children's sections. Children's section is an essential part of the structure of a public library. Maintenance of a children's section in public libraries is one important way of providing services to the children. Children's section should be organized in such a way that children can be attracted to the library. Suitable reading material and equipment required for children should be made available. Various colourful pictures which attract children may be displayed in the children's section. In addition, a collection of suitable audio visual material may also be maintained. Selection of books for children should be made carefully and the reference sources such as children's encyclopeadias, picture books, etc. may also be provided to the children's section.

Another programme which is useful for children is the maintenance of reader societies. Various programmes can be organised for children through reader societies. Members of the public library reader societies can participate in activities such as computer training, essay competitions, etc. organised by the public library. Public libraries can also organise story hour programmes for children. Story hour is an interesting activity that can attract children to the library.

In addition, a separate place in the public library can be prepared to display children's creations such as their drawings, essays, poems, etc. Best creations may be selected and

* Former Director, National Library & Documentation Services Board

offered prizes to encourage the children. Book exhibitions can be conducted on regular basis for the children. Facilities may be provided in these exhibitions to purchase books in concessionary prices. Children of the neighbouring schools may be made aware about these exhibitions.

Development of information literacy skills of children is an important responsibility of public libraries. Children should be made aware about the basic information literacy skills such as proper library usage, using the library catalogue, reading skills such as keeping attention while reading, memorising the facts already learned, quick reading, taking notes while reading, etc. Development of basic information literacy skills is very helpful to encourage the library usage of children. Unfamiliarity of these skills is a great obstacle for their library usage. Improvement of language skills of children is also an important task of librarians. Specially the English language skill is required for successful learning. A considerable amount of books in libraries are in English language. If the children don't have the English language reading skill, it is a barrier for their successful learning.

Development of computer literacy of children is an important role of libraries. Today most public libraries have computer facilities. Some public libraries have seperate computer sections. These facilities can be used to improve the basic computer literacy skills of children. The basic computer literacy skills may include starting the computer, word processing, internet searching, making a power point presentation, getting a print out, using the key board, making a computer file, how to save a file, etc. Providing audio visual facilities is also an important service, public libraries can maintain for children. A separate room may be arranged for children to watch audio visual programmes. Regular video programmes may be organised for children. The dates and times of programmes can be displayed in the library notice board to make aware the children.

Librarians should pay a special attention to children with special needs. There may be visually handicapped children in the area. In addition, there may be children with other physical disabilities. Special information material such as talking books are available for visually handicapped children. Public libraries can maintain a separate unit for children of this nature. The attitude of librarians and their relationship with children considerably influence to keep the interest of children to library usage. Librarians should have a friendly and supportive attitude to children and also a good understanding about the children's behaviour. Librarians should never react to children in such a way that they are discouraged to come to the library. School libraries also have a significant role for the development of reading and learning of children. School librarians always deal with the children and they should be specialised on students information needs. Development of information literacy skills of students should be a role of the school library. Providing library periods for all grades is very important to improve reading and interest for the library. Improving the knowledge of students' on proper and efficient library usage is essential. Teachers should encourage children to use library and provide them assignments based on library usage.

Resource based learning should be an essential process in schools. There are various institutions which implement reading promotion programmes. The National Reading Month programme of the National Library and Documentation Services Board is a leading project on reading.

The role of the parents in the promotion of reading among children is also important. Parents' attitudes and behaviour strongly affect the attitude and behaviour of children. It is the responsibility of the parents to creat a sound environment at the home for reading. Calm and peaceful environment in the home is extreamly helpful for learning and intellectual development of the children. Maintenance of a book collection at home is also helpful for children's reading habit development. Parents can also allocate a time for their children to read. Parents also can join with their children during this reading time. In addition, parents should encourage to learn languages specially English. Learning languages widens the knowledge of children and thereby widens their reading capacity.

Taking the children to libraries regularly is also an important habit. Regular library visits increase the children's interest for reading and library use. Taking the children to book exhibitions helps to make them aware on new books on various subject areas. Visiting book exhibitions also helpful to maintain children's interest for books and reading. Spending time unnecessarily for watching television is a harmful habit. Parents should control this situation and should minimize watching television as far as possible. Parents should guide the children to select and watch only the useful programmes. Too much watching television results in declining children's interest for reading and destroys their imaginative ability.

Due to the rapidly increasing demand for information technology and information literacy, school librarian has become a very important person. School librarian is no more a person who only protects the library material. School librarian has become a person who supports teaching. The role of the school librarian in developing the information literacy of students can be discussed in different ways. Some of the responsibilities of school librarian can be mentioned as follows :

- Preparing future plans for the school library and students.
- Implementation of resource based learning programmes for all students.
- Organisation and supervision of facilities and resources effectively.
- Supervision of selection and acquisition of learning resources.
- Utilization of information technology in information processing.
- Analysing the curriculum needs of students.
- Findout the opportunities for the development of school library.
- Maintaining relationship with other libraries.

• Evaluation of teaching and student learning

Libraries should go out of their traditional role and think of new ways of providing services to children. The role of libraries should be redefined according to the new world trends and changing information and learning environment. Modernisation of library services are needed to suit the present requirements. The library services for children should mainly focus on their learning requirements and extra reading needs. Libraries should equip with information resources to meet this requirement. Most public libraries in Sri Lanka have children's sections. However, some public libraries have no separate children's sections. Children's section should be an essential part of a public library. It should have suitable information resources and specially designed furniture and equipment for children.

Children receive books mainly from adults, parents, teachers or librarians. Children have to depend on adults in obtaining books. Children are not concerned about books which are not interesting to them. Therefore, libraries should try as far as possible to provide them books which are interesting to them. Moreover, librarians should encourage children to read qualitatively advanced books. All books in a children's library should be qualitatively appropriate books.

The staff of the public and school libraries should be knowledgable on children and their needs. Staff of public and school libraries always deal with children. They should have training on children's librarianship. However, most librarians have not gained formal training on children's activities. All public libraries should have a librarian specialised in children's librarianship. Some of the responsibilities of a children's librarian should be able to findout whether a reasonable amount of resources have been allocated for children, planning library services for children, selecting books for children, development of children's collections, etc.

A main problem faced by librarians in providing services to children is keeping the silence in the library. Normally in public libraries, children's sections are kept away from the reference section in order to maintain silence for reference work. In designing the children's section, security and supervision should be taken into consideration. Supervision of the children's section should be convenient. It is more appropriate to maintain the children's section in the ground floor. Some libraries have been set up in places where children cannot access conveniently.

Some libraries are not attractive. Libraries should pay attention to attract children. Conducting book exhibitions is another way of attracting children. Book exhibitions can be conducted inside or outside the library. Conducting book exhibitions should be a regular feature of a library. In addition to books, various items produced by children as part of their school activities may also be displayed in these exhibitions. In conjunction with the exhibitions, various competitions may be organized and winners can be presented prizes in the conclusion of the exhibition.

Organising a mobile service for children living in remote places is another important service which can be provided by the public libraries. There are children who are unable to come to the public libraries due to various difficulties. The children of this nature may be much benefited through such services.

Another important requirement is conducting more and more research and surveys on children's reading. Research helps to understand children's reading needs and existing situation of their reading. The research studies on children's reading conducted in Sri Lanka is very limited. The relevant authorities should take initiatives in this regard. In addition, evaluation of children's reading on regular basis is important. Development of children's reading skills should be included to the school curriculam. Through the inclusion to school curricular, reading skills of students can be developed on a stable foundation.

In conclusion, it is clear from the above facts that libraries can play a significant role for the development of reading skills and information literacy skills of children. Librarians have an important responsibility in the fulfilment of this task. In addition, teachers, teacher librarians as well as parents can contribute significantly to achieve this objective. Finally all of us should dedicate our selves to create a children generation with reading competency and information literacy.

**References**

Amarasiri, G. D., (2007). Information Literacy and Learning process, Library News, Vol. 28, No. 34, July - Sept., Oct.- Dec., Colombo. National Library and Documentation Services Board.

Gunaratna Banda, H. M., (2012). Developing Life time Reading habit in Sri Lankan context, National Reading Month, 2012. - Commemorative volume, Colombo. National Library and Documentation Services Board.

Moor, Penny (2002). Information Literacy. New Zealand Council for Educational Research,

Report of the survey on Reading habit of school children in Northern and Eastern Provinces, (2017). Colombo. National Library and Documentation Services Board.

# කියවීම දරුවන්ගෙන් ආරම්භ කරමු

- මෞලවි ෆරූද් ෆාරුක් ඉහ්සානි*

අල්ලා දෙවියෝ මෙලොවේ මැවීම් රාශියක් කර ඇත්තාහ. එම මැවීම්වලින් ශ්‍රේෂ්ඨ මැවීම මිනිසාය. පරිශුද්ධ කුර්ආනයෙහි (51/21) අල්ලාහ්තආලා ''තවද නුඹලා තුළ ද (සංඥාවන් ඇත) නුඹලා (එය) නිරීක්ෂණය නොකරන්නෙහු ද?'' යනුවෙන් ප්‍රශ්න කරන අතර තවත් තැනක (17/70) ''තවද සැබැවින්ම අපි ආදම්ගේ දරුවන් ගෞරවයට පත් කළෙමු'' යනුවෙන් පවසා ඇත. තවද ''සැබැවින්ම අලංකාර සංයුතියකින් අපි මිනිසා මැව්වෙමු'' යනුවෙන් (95/04) අල්ලාහ් දෙවියෝ පවසති. තවද එකිනෙකා දැන හඳුනා ගන්නා පිළිවෙළට මිනිසා මවා ඇති බව අල්ලාහ් දෙවියන් (49/13) පරිශුද්ධ කුර්ආනයේ ''ජනයිනි, සැබැවින්ම අපි නුඹලාව පිරිමියෙකු හා ස්ත්‍රියකගෙන් මැවුවෙමු''. තවද නුඹලා එකිනෙකා හඳුනා ගනු පිණිස ජාතීන් හා ගෝත්‍ර බවට පත් කළෙමු, සැබැවින්ම අල්ලාහ් අභියස නුඹලාගෙන් ඉතා ශ්‍රේෂ්ඨයා නුඹලාගෙන් ඉතා බිය භක්තිකයා ය.'' යනුවෙන් ඉතා පැහැදිලිව පවසා ඇත. ලොවෙහි ඇති සෑම දෙයක් ගැනම මිනිසාට අල්ලාහ් දෙවියන් පවසා දී ඇත. මේ ගැන ''ඔහු (අල්ලාහ්) ආදම්ට නාමයන් සියල්ලක්ම උගන්වූවා'' යනුවෙන් පරිශුද්ධ කුර්ආනය (02/31) පවසයි.

මෙලෙස අලංකාරව ගෞරවාන්විතව එකිනෙකා දැන හඳුනා ගැනීමට හැකිවන පරිදි ලොවෙහි ඇති සියලු දේවල් දන්නා ආකාරයට මවනු ලැබ ඇති මිනිසාට මෙලොවෙහි යහපත්ව සැනසීමෙන් ජීවත්වීමට අවබෝධය හා අධ්‍යාපනය අවශ්‍ය වේ. මිනිසා අවබෝධය හා අධ්‍යාපනය නිසි ආකාරව ලබා ගැනීමට හැකිවන සේ මිනිසාට අවයවයන් හා ශක්තිය ලබා දී ඇත. මෙම අවබෝධය හා අධ්‍යාපනය මිනිසා කෙසේ ලබා ගන්නේද යන පිළිවෙළ පරිශුද්ධ කුර්ආනයේ (16/78) අල්ලාහ් දෙවියන් පවසා ඇත. ''නුඹලා කිසිවක් නොදැන සිටියේ දී නුඹලා ගේ මව්වරුන්ගේ කුසින් අල්ලාහ් නුඹලා ව පිට කළේය. තවද නුඹලා කෘතඥ වනු පිණිස නුඹලාට ශ්‍රවණ ද දෘෂ්ටීන් ද හදවත් ද ඇති කළේය.'' යනුවෙන් අලංකාරව පවසා ඇත. මිනිසා මෙලොව එළිය දකින විට ඔහුගේ මව, පියා, හොඳ, නරක යන කිසිදෙයක් නොදැනුවත්වම සිටියේය. පසුව ලොව එළිය දුටු මිනිසාට අල්ලාහ් සෑම දෙයක්ම ශ්‍රවණය කිරීමට සලස්වා අවබෝධ කර දුන්නෝය. අල්ලාහ් දෙවියෝ අම්මා, තාත්තා, කිරි, වතුර යනුවෙන් එක එක වචන ශ්‍රවණය කරවා අවබෝධය හා අධ්‍යාපනය ලබා දුන්නෝය. පසුව එක් එක් දේවල් පෙන්වා දෘෂ්ටියෙන් අවබෝධය සහ අධ්‍යාපනය ලබා දුන්නෝය. ඈ අම්මා, ඔහු තාත්තා, මේ කෙසෙල්, වතුර, ඇපල්, සිංහයා, අලියා යනුවෙන් එක් එක් දේ පෙන්වා දෘෂ්ටියෙන් එම දැනුම ලබා දුන්නෝය. එම කාල පරිච්ඡේදය අවසන් වනවිට තම හදවතින් එකිනෙක තෝරා බේරා ගැනීමේ හැකියාව එන විට ඒ හා සම්බන්ධ දැනුම ලබා

* නියෝජ්‍ය විදුහල්පති, ඉහ්සානියියා අරාබි විදුහල, කොළඹ-12

දුන්නෝය. මෙසේ මිනිසා තමාගේ දැනුම, අවබෝධය හා අධ්‍යාපනය වර්ධනය කරගත්තේය. මෙම දැනුම අධ්‍යාපනය ලබා ගන්නා පිළිවෙළ ඉහත සඳහන් පාරිශුද්ධ කුර්ආන් වැකියේ අල්ලාහ් දෙවියන් පවසා ඇත.

මෙසේ දැනුම අවබෝධය හා අධ්‍යාපන ලබාගන්නා මිනිසා මෙම දැනුම වර්ධනය කිරීමත් ඒවා රැස්කර තබා ගැනීමත් අනිකුත් සියලු දෙනාට පවසාදීමත් එය මුළු ලොවටම පැතිරවීමත් අත්‍යවශ්‍ය වේ. එනිසා එකිනෙකා ළඟ තිබෙන්නා වූ දැනුම අනිකා සමග බෙදාගැනීමෙන් මිනිසාගේ දියුණුව සංවර්ධනය බලාපොරොත්තු විය හැක. මෙසේ ලෝකයේ, මිනිසාගේ දියුණුව, සංවර්ධනය වැඩි කළ යුතු නම් මිනිසාගේ දැනුම වැඩි විය යුතුය. මිනිසාගේ දැනුම වැඩි වීමට මිනිසා වැඩිවැඩියෙන් ශ්‍රවණය කර, දෘෂ්ටියෙන් බලා, මනසින් සිතිය යුතුය. එසේ ශ්‍රවණය කරන්නා වූ, දෘෂ්ටියෙන් බලන්නා වූ මනසින් සිතන්නාවූ සියලු දේ බෙදා ප්‍රචාරය කළ යුතු නම් ඒවා රැස්කර තිබිය යුතුය. ඒවා රැස් කිරීමට ඒවා ලියා තිබිය යුතුය. ලියා ඇති දේ දැනුම වර්ධනය කර ගැනීමට කියවිය යුතුය. මෙසේ මේ පිළිවෙළ යහපත්ව සිදුවන්නේ නම් මිනිසාගේ දැනුමේ මට්ටම ඉහළ යන්නේය. කෙසේ වෙතත් දැනුම ඉහළ යාමට නම් මෙම දැනුම් ක්‍රියාවලියේ ඇත්තාවූ 'කියවීම' යන්න ප්‍රථම හා ශ්‍රේෂ්ඨම ක්‍රමය වන්නේය යන්න අප සක්සුදක් සේ පැහැදිලි කරගත යුතුය.

දැනුම ඇත්තන් හා දැනුම නොමැත්තන් සම වන්නේ ද යන්න පාරිශුද්ධ කුර්ආන් වැකියක අරුතකි. කිසිසේත් සම වන්නේ නැත. එසේ නම් දැනුම ලබාගත යුතුය. දැනුම ලබා ගැනීම සෑම මිනිසෙකුටම අනිවාර්ය වේ යන අරුතෙන් මුහම්මද් නබි (සල්) තුමාණන් පවසා ඇත. එසේනම් ගෞරවාන්විත පුද්ගලයකු ලෙස මිනිසාට ජීවත් වීමටත් දියුණුවට හා සංවර්ධනයටත් දැනුම අනිවාර්ය වේ, දැනුම වර්ධනය කිරීමට ලිය වී තිබීමත්, කියවීමත් අනිවාර්ය වේ.

ලිවීමටත්, කියවීමටත් ඉස්ලාම් ධර්මය ඉහළ තැනක් ලබාදී ඇත, මේ නිසාම ලිවීම ගැනත් එයට අවශ්‍ය පෑන ගැනත් කියවීම ගැනත් පාරිශුද්ධ කුර්ආනයේ අල්ලාහ් දෙවියන් ද අල් හදීස් වල මුහම්මද් නබි (සල්) තුමාණන් ද පවසා ඇත. පාරිශුද්ධ කුර්ආනයේ (68/01) ''පෑන මතද ඔවුන් සටහන් කරන දෑ මතද දිවුරමින්'' යනුවෙන් අල්ලාහ් දෙවියයෝ පවසති. අල්ලාහ් දෙවියෝ ම පෑන මතත් එම පෑනෙන් සටහන් කරනු ලබන දෑ මතත් දිවුරා පවසනවා නම් එම දෑ කොයි තරම් වටිනා විය යුතු ද යන්න තේරුම් ගත හැකිය, මුහම්මද් නබි (සල්) තුමාණන් පවසා ඇත. ''අල්ලාහ් දෙවියන් ප්‍රථමයෙන්ම පෑන මැව්වේය. පෑනට ලියනු'' යනුවෙන් දෙවියෝ පැවසූහ. මා කුමක් ලියන්නේ ද යනුවෙන් පෑන ඇසීය. ලෝක අවසාන දිනය දක්වා සිදුවෙන දේ (ලියනු)'' යනුවෙන් අල්ලාහ් දෙවියයෝ පැවසූහ යන්න තිර්මිදි නැමැති ග්‍රන්ථයෙහි සඳහන්ව ඇත. ලොවෙහි පළමුවෙන් පෑනෙන් ලියූ තැනැත්තා ඉද්රීස් නබිතුමාණෝ බව නබි මුහම්මද් (සල්) තුමාණන් පැවසූහ. මෙසේ කියවීමට අවශ්‍ය ලිවීමේ වැදගත්කම පිළිබඳව ඉස්ලාම් ධර්මය ඉතා පැහැදිලිව පවසා ඇත. තවද නබි මුහම්මද් (සල්) තුමාණෝ මෙම අරුතින් පැවසූහ. ''දරුවන්ට දෙමවුපියන් කළ යුතු වගකීම වන්නේ ඔවුන්ට ලිවීම, පිහිනීම ඉගැන්වීමත් (පිරිසිදු) හලාල් ආහාර ලබා දීමත් වේ. මෙසේ ලිවීමේ වැදගත් කම තහවුරු කරන ඉස්ලාම් ධර්මය කියවීම පිළිබඳවද ඉතා ඉහළින් තහවුරු කර පවසා ඇත.

පරිශුද්ධ කුර්ආනයේ අල්ලාහ් දෙවියන් මෙසේ පවසා ඇත. (96/01-07) ''(සියලු දෑ) මැවූ නුඹේ පරමාධිපතිගේ නාමයෙන් නුඹ කියවවු. ලේ කැටියෙන් මිනිසාව මැව්වේ ය. නුඹ කියවවු. තවද නුඹගේ පරමාධිපති මහත් පරිත්‍යාගශීලීය. ඔහු පෑන මගින් දැනුම බෙදා දුන්නේය. මිනිසාට නොදන්නා දෑ ඔහු ඉගැන්වූයේය. ඒත් සැබැවින්ම මිනිසා සීමාව ඉක්මවා යන්නේ ය. (මක්නිසාද යත්) තමන්ව අවශ්‍යතාවන් ගෙන් තොර වූ (කෙනෙකු) යැයි සිතන හෙයිනි.'' ඉස්ලාම් ධර්මය කියවීමට කෙතරම් ඉහළ තැනක් ලබාදී ඇත්දැයි මෙම පාරිශුද්ධ කුර්ආන් වැකි කිහිපයෙන්

අප හට වටහා ගත හැකිය. පාරිශුද්ධ කුර්ආනයේ පළමු වැකිය ''කියවන්න'' යන්නයි. තවද කුර්ආනයේ අල්ලාහ් දෙවියන්ගේ පළමු අණ කිරීම හා දෙවන අණ කිරීමත් ''කියවන්න'' යන්නයි. අණ කිරීමෙන් අනතුරුව ඔහු පෑන මගින් දැනුම බෙදා දුන්නේ ය යනුවෙන් පවසා ඇත. එනම් කියවීම සඳහා දැනුම ලියා තිබිය යුතුය යන්න තරයේ ප්‍රකාශ කිරීම මගින් ලිවීමේ වැදගත්කම පැහැදිලි කර දී ඇත. ඉන් අනතුරුව මිනිසාට නොදන්නා දෑ ඉගැන්වූයේය යැයි අල්ලාහ් දෙවියන් පවසා ඇත. එමගින් අල්ලාහ් දෙවියන් ලබා දුන් දැනුම ලිවිය යුතුයි. පසුව එය කියවිය යුතුයි. එමගින් දැනුම ලබාගත යුතුයි යන්න ඉතා අලංකාරව අප හට පැහැදිලි කර දී ඇත. පසුව අල්ලාහ් දෙවියන් එහෙත් සැබැවින් ම මිනිසා සීමාව ඉක්මවා යන්නේ ය. මක්නිසාදයත් තමන් අවශ්‍යතාවන්ගෙන් තොර වූ කෙනකු යැයි සිතන හෙයිනි යනුවෙන් පවසා ඇත. මිනිසා ලිවීමට කියවීමට වැදගත්කමක් නොදක්වන්නේ ය යන්න පැහැදිලි කර ඇත. දැනුම නොමැති නිසා මිනිසාගේ දියුණුව හා සංවර්ධනය ද ඇති නොවන්නේ ය. දැනුම ඇත්තා හා දැනුම නොමැත්තා සම නොවන නිසා ඔවුන් අතර පන්ති භේද ඇති වී අගෞරව කිරීම හා නොයෙකුත් ප්‍රශ්න ඇති වන්නේය.

රටේ සමාජයේ ලෝකයේ දියුණුව, සංවර්ධනය, ජයග්‍රහණය, සතුට, සැනසීම, නිදහස අවශ්‍ය නම් දැනුම අවශ්‍ය වේ. දැනුම ලබාගැනීම සඳහා ලිවීම හා කියවීම අත්‍යවශ්‍ය වේ. දැනුම ඇත්තන්ගේ දෙසුම්වලට සවන් දී දැනුම ලබා ගන්නා සේ දැනුම ඇත්තන් ලියූ දේ කියවීමෙන්ද දැනුම ලබාගත් විට, තමාට ද එම දැනුම වර්ධනය කර, එම දැනුම ප්‍රචාරය කිරීම සඳහා ලිවීමට හා කතා කිරීමට හැකියාවක් ලැබේ. මෙම ලිවීමේ හැකියාව වර්ධනය කළ යුතු නම් ආරම්භයේදී ම සවන් දීමට හා කියවීමට පුරුදු පුහුණු විය යුතුය. මෙම පුරුදු පුහුණුව ලබාගත හැක්කේ ආරම්භ කාලයේ ම එනම් කුඩා කාලයේදීම පුරුදු පුහුණු වුණොත් පමණි. නොමැති නම් වැඩිවියට පත්වූ පසුව එම කියවීමේ පුරුද්ද ලබාගැනීම ඉතා බැරෑරුම් කටයුත්තක් බවට පත්වන්නේය. අරාබි කියමන් දෙකක මෙසේ සඳහන් වේ. කුඩා කල දැනුම ලබාගැනීම ගලක කෙටුවා හා සමාන වේ. වැඩිවියේ දී දැනුම ලබාගැනීම ජලයේ කෙටුවා හා සමාන වේ. එයින් ඵල ප්‍රයෝජන ලබාගැනීම දුෂ්කර වන්නේය. ඒ නිසා කියවීමට පුරුදු පුහුණු වීමත්, කියවීම ආරම්භ කිරීමත් කුඩා කල සිටම කළ යුතුව ඇත.

කුඩා කල සිටම කියවීම, මනනය කිරීම, දැනුම ලැබීම ඉතා වැදගත් බවත් අත්‍යවශ්‍ය බවත් යන්න පිළිබඳව විද්වතුන් නොයෙකුත් අදහස් පළකර ඇත. හසන් නැමති විද්වතා මෙසේ පැවසුවේය. කුඩාකල දැනුම ලබාගැනීම ගලෙහි කෙටුවා හා සමාන වේ. අල්කමා යන විද්වතාණන් මා කුඩා කල මනනය කළ දේ, එය එම කොළේම තිබෙන්නා සේම දකින්නෙමි යැයි පවසා ඇත. හසන් ඉබ්නු අලි යන විද්වතාණෝ ඔබ දැනුම ලබා ගන්න, ඔබ කුඩා අයව සිටියත් හෙට ඔබ වැඩිහිටි වියට පත් වන්නේ ය. ඒ නිසා මනනය නොකළ තැනැත්තා එය ලියා ගනිත්වා! යැයි පැවසුහ. මුහම්මද් නබි (සල්) තුමාණන්ට පෙර පැමිණි ලුක්මාන් අලෙෙ නම් විද්වතා තමාගේ පුත්‍රයා මෙසේ දැනුවත් කළේය. මගේ කුඩා පුත්‍රයාණෙනි, ඔබ විද්වතුන් සමඟ වාඩිවී සිටින්න ඔවුන්ගේ දණහිසට ළංවී වාඩිවී සිටින්න වියළී ගිය භූමියක් වැසි ජලය ප්‍රාණවත් කරන්නා සේ ඔවුන්ගේ දැනුමෙන් හදවත් ප්‍රාණවත් කෙරෙන්නේය. තවත් කවියෙක් මෙසේ පැවසීය. වැඩිවියෙහි මා ලබාගත් දේ ඉක්මනින් අමතක වනවා මම දකිමි. කුඩා කල මා ලබාගත් දේ අමතක නොකරන්නෙමි. තවත් එක් විද්වතෙක් මෙසේ පැවසීය. කුඩා කල දැනුම නොලැබූ පුද්ගලයා ඉදිරියට නොයන්නේ ය.

කුඩා කාලයේ සිටම දැනුම දියුණු කිරීම සඳහාත් වැඩිවියට පත්වූ පසුව එම දැනුම රඳා පවත්වා ගැනීම සඳහාත් දරුවන්ට කුඩා වියේදීම කියවීම පුරුදු පුහුණු කළ යුතුය. ඒ සඳහා ඔවුන්ට අවශ්‍ය සියලු දේ ලබා දිය යුතුය. ඔවුන් ඉදිරියට යැවෙන විෂයට අදාළ පොත්, නවකතා, පුවත්පත්, සඟරා වැනි දේවල් තෝරා බේරා ලබාදිය යුතුය. ඒ සඳහා නිවසේ පරිසරය සකසා දිය

යුතුය. දෙමව්පියන්ද එම පරිසරයට උචිත ලෙස ක්‍රියා කළ යුතුය. කුඩා කල කියවීම මගින් යහපත් දියුණු සමාජයක් බිහිකළ හැකිය. කුඩා කල දරුවාගේ බුද්ධිය ඉතා ක්‍රියාශීලීව තිබේ. ඔවුන්ගේ මතක ශක්තිය මනනය කිරීමේ හැකියාවද ඉතා දියුණුය. එනිසාම දරුවන් දැනුම් සම්භාරයක් ඇති පුද්ගලයකු වන්නේය. මෙවැනි ළමයින්ට කියවීමට අවශ්‍ය පරිසරයක් ලැබුණු විට ඔවුන් වෙනත් දේවල්වලට නැඹුරු වීම අවම වන්නේය. කුඩා දරුවෙකු තුළ දැනුම ලබාගැනීමේදීත්, කියවීමේ ලිවීමේදීත් බිය වීමක් හෝ ලැජ්ජා වීමක් දැකීම ඉතා අවමය. තවද ඔවුන් තුළ අහංකාරකම හා ආඩම්බර කම ද දැකීමට නොහැකි තරම්ය. නමුත් මෙම බිය වීම හා ලැජ්ජා වීම කුඩා දරුවන්ට වඩා වැඩිවියේ අයට වැඩියෙන්ම තිබෙන අතර අහංකාර කම ද වැඩියෙන්ම තිබෙනු දකින්නට පුළුවන. එ නිසා කුඩා කාලයේදීම කියවීමට ලිවීමට පෙළඹවීම වැදගත් වේ.

ළමයින් මල් වගේ යයි කියමු. එසේ කියා ළමයාට තෙල් ගා හිස පීරා පියරු මුව තවරා කණ්ණාඩිය ඉදිරියේ සිටුවා ලස්සන බැලුවාට මල් වාගේ නොවන්නේය. එහි නියම අරුත ය මෙම පාරිශුද්ධ කුර්ආන් වැකිය පවසන දේ හා සමාන වන්නේය. එහි අල්ලාහ් දෙවියෝ මෙසේ පවසති. (07/58) ''සරුබිම, එහි ශාකයන් තම පරමාධිපතිගේ අනුබලයෙන් හටගන්නේය. නිසරු වූ දෙය (බිම) අසීරුවෙන් හැර හටනොගනී. කෘතවේදී වන පිරිසට අප (අල්කුර්ආනයේ) වදන් ගෙන හැර පාන්නේ මෙලෙසය''. ශාකයක් මගින් ප්‍රයෝජන ලබාගත යුතු නම් එම ශාකය හොඳින් වැඩෙන පසෙක වැවිය යුතුය. එයට අවශ්‍ය ප්‍රමාණයේ පොහොර අවශ්‍ය ප්‍රමාණයේ ජලය ලබාදිය යුතුය. පොහොර හෝ ජලය වැඩිපුර දැමූ විට නරක් වී ශාකය මැරෙයි. ජලය නොදැමූ විට ශාකය වියළී මැරී යයි. පොඩි වැටක් නොහැදුවහොත් එළුවන් ගවයන් වැනි සත්තු ශාකය කා දමති. ශාකය වැඩීමට උචිත පසක් නො ලැබූ විට එම ශාකයට පොහොර හා ජලය දැමුවත් එය වඩා හදා ගැනීම ඉතාමත් දුෂ්කර දෙයක් වෙයි. එනිසා අවශ්‍ය උචිත පරිසරයක හා පසක ශාකය සිටුවා ඊට අවශ්‍ය පොහොරත් ජලයත් දමා පොඩි වැටක්ද බැඳ එය ආරක්ෂා කර හදාගන්නේ නම් ටික කලකින් එම ශාකය වැඩී ස්ථිර වී පසුව එය පොළොවෙන් ලැබෙන පොහොරවලින් ශක්තියක් ලැබ පරිසරයට ලස්සන මල් පලතුරු ලබාදෙයි. මෙලෙසම කුඩා දරුවන්ට කුඩා කාලයේදී කියවීමට ඒ වගේම ලිවීමට හැකි හොඳ පරිසරයක් ඇති කර ඒ ඒ වයසට සරිලන පොත් සඟරා පුවත්පත් වැනි දේ, ජලය හා පොහොර මෙන් ලබාදී, ජංගම දුරකථන, මුහුණුපොත්, යූ ටියුබ්, වට්ස්අප් වැනි දේවල් වලින්, එළුවන් ගවයන් ගෙන් ආරක්ෂා කිරීමට වැටක් දමනවා සේ ආරක්ෂා කර දුරස් කර තබන්නේ නම් ශාකයෙහි ලස්සන මල් පිපී පරිසරය අලංකාර කරන්නා සේ එම කුඩා ළමයි හොඳට කියවා දැනුම වැඩි දියුණු කර සමාජයට සේවාවක් කරන යහපත් පුරවැසියන් බවට පත්වෙති. මෙය තමා ළමයින් මල් වගේය යන්නෙහි නියම අරුත වන්නේ.

මෙනිසා යහපත් ලෝකයක් බිහිකර ගැනීමට යහපත් දැනුම බුද්ධිය ඇති පුරවැසියන් බිහි කරගත යුතුය. ඒ සඳහා දරුවන් කුඩා කාලයේ සිටම කියවීමට පුරුදු කළ යුතුය. රටක සමාජයක දියුණුව රඳා පවතින්නේ එහි ජනතාව මතය. ජනතාව දැනුම ඇත්තන් නම් එහි ප්‍රශ්නයක් හෝ කෝලාහලයක් ඇති නොවන්නේය. එම ජනතාව දැනුම ඇත්තන් බවට පත් කරන්නේ කුඩා කල සිටම ඔවුන් දැනුමට වැදගත්කමක් දුන් විටය. කුඩා කාලයේ දැනුම ලැබෙන ඉතා වැදගත්ම මාර්ගය වන්නේ කියවීමය. එනිසා අපි කියවීම දරුවන්ගෙන් ආරම්භ කරමු.

ලියා කියවා දැනුම ලබා යහපත් සමාජයක් බිහි කිරීමට අල්ලාහ් දෙවියන් භාග්‍යය ලබා දෙත්වා! ආමීන්!

# வாசிப்புப் பழக்கத்தை ஊக்குவித்தல்

- எஸ்.சிவகுருநாதன்

வாசிப்பினால் ஏற்படும் நன்மைகள் என்ன என்பது உங்களுக்குத் தெரியுமா? முதலில், வாசிப்பு பழக்கமானது சிறந்த மொழியறிவுத் திறனை ஏற்படுத்தும். பிள்ளைகள் தமது தாய்மொழியை மிகவும் சிறந்த முறையில் உபயோகப்படுத்துவதாயின், விஞ்ஞானம் - சுற்றாடல் போன்ற அனைத்துப் பாடங்களைக் கற்கவும், அதன் மூலம் பரீட்சையில் நல்ல பெறுபேறுகளைப் பெறுவதற்கும் ஏதுவாகின்றது. வாசிப்பதனால் பல்வேறு புதிய விடயங்களை அறிந்து கொள்ளலாம். மேலும், மற்றவர்களின் எண்ணங்கள் பற்றி அறிந்து கொள்ளவும் அவர்களை புரிந்து கொள்ளவும் அதனூடாகத் தனக்குள் புதிய எண்ணங்களைத் தோற்றுவிக்கவும் இது பேருதவியாக அமையும். வர்ணிக்கும் ஆற்றல் பெருகும். ‘‘கல்கி’’ என்னும் பிரபல தமிழ் எழுத்தாளரின் ‘‘பொன்னியின் செல்வன்’’ என்னும் படைப்பிலக்கியத்தை வாசித்துப் பார்த்தோமானால், அவரின் படைப்பாற்றல் திறமையை அறிந்துகொள்ள முடியும். இந்த வாசிப்புப் பழக்கத்தினால் குழந்தையினது மூளையின் வளர்ச்சி இயல்பாகப் பெருகும். வாசிப்புப் பழக்கம் கொண்ட பிள்ளை வகுப்பினுள் ஒரு நாளும் தோல்வியடையாது. அப்பிள்ளை சிலவேளை பரீட்சையில் அதிக புள்ளிகளைப் பெறாமல் போனாலும், தனக்குள் உள்ள விசேடத் திறமையினை வளர்த்துக் கொண்டு வாழ்க்கையை வெற்றிகரமாக்கிக் கொள்ளும்.

குழந்தையின் ஒரு வருட வயது பூர்த்தியடையும் தருவாயில் வாசிப்புப் பழக்கத்தை அக்குழந்தைக்கு ஏற்படுத்தலாம். பெரிய படங்கள் கொண்ட புத்தகங்களை குழந்தை கையில் கொடுக்க வேண்டும். அதிலுள்ள ஒவ்வொரு படங்களிலும் என்ன கூறப்படுகின்றது? எனக் காட்டி அதனை வார்த்தை மூலம் உச்சரிக்கலாம். குழந்தையை நல்ல முறையில் கதைக்க ஊக்குவிப்பதாயின், குழந்தைக்கு இரண்டு வயதாகையில் கதைப் புத்தகங்கள் வாங்கிக் கொடுத்தல் நல்லது. இலகுவான, பெரிய எழுத்துக்களுடன் கூடிய சிறு கதைகள் அவர்களுக்கு கேட்க வாசித்துக் காட்டுதல் நலம். இரவு படுக்கைக்குச் செல்வதற்கு முன்பு, வாசிப்பது இலகுவானதாகும். அனைத்து வேலைகளையும் முடித்த பின்பு, தாய்மார் குழந்தையுடன் இருக்க முடியும். பிள்ளையின் தாய்க்கு வாசிக்கும் பழக்கம் இல்லையென்றால், பாடசாலை செல்லும் வயதிலுள்ள அக்காமார் அண்ணன்மார்களின் உதவியைப் பெற்றுக் கொள்ளலாம்.

பிள்ளையின் பிறந்தநாள் அல்லது வேறு ஏதாகினும் விசேட தினங்களில் பிள்ளைக்கு புத்தகம் ஒன்றை பரிசாகக் கொடுப்பதைப் பழக்கமாக்கிக் கொள்ள முடியும். மற்றவர்களையும் அவ்வாறு செய்யும் படி தூண்டலாம். இதனூடாக ஒவ்வொரு வீட்டிலும் புத்தகங்கள் மற்றும்

சஞ்சிகைகள் திரட்டப்படும் வாய்ப்பு ஏற்படும். பிள்ளைகள் வளரும் சூழலில் அவர்களுக்கு வாசிக்க புத்தகங்கள் குறையாமல் இருக்க வேண்டும். தன்னைச் சுற்றியுள்ளவர்களிடம் வாசிக்கும் பழக்கம் இருப்பதைக் காணும் பிள்ளை, தானும் வாசிக்கும் பழக்கத்தை வளர்க்க பழகிக்கொள்ளும். ஒவ்வொரு வீட்டிலும் ஒரு நூலகம் இருத்தல் நல்லது. பிள்ளையின் வயது ஏழு அல்லது எட்டு ஆகும் வரை இந்நிலைமை காணப்பட்டால், பின்னர் அவர்களே புத்தகங்களைத் தேடி வாசிக்கத் தூண்டப்படுவார்கள். அப்பொழுது பெற்றோர் பேசாமல் இருக்கலாம். வளரும் பிள்ளைகள் அறிவில் சிறந்திருந்தால், அதனை வார்த்தையில் சொல்லி முடிக்க முடியாத அளவு மகிழ்ச்சி பெற்றோருக்குக் கிடைக்கும்.

''வாசிப்பு ஒரு மனிதனை முழு மனிதனாக்குகின்றது'' என்பது ஆங்கிலப் பழமொழியாகும். வாசிப்பின் போது வளர்ந்த ஒரு மனிதனின் உடல், உயிர், ஆன்மா அனைத்துமே புடம் போடப்படுகின்றன. வயிற்றுப் பசிக்கு உணவு உண்டால் அடங்கிப் போகின்றது. ஆனால், மூளையின் பசியோ வாசிக்க அடங்காது மேலெழுகின்றது. இந் நிலையில் வாசிப்பின் மூன்று அம்சங்களை நாம் அவதானிக்க முடிகின்றது. முதலாவது, வாசிப்பின் போது புற விஷயங்கள் அனைத்தையும் உள்வாங்கக் கூடியதாக உள்ளது. இதன் விளைவாக வாசித்த விஷயங்கள் மூளையில் களஞ்சியப்படுத்தப்படுகின்றன. களஞ்சியப்படுத்தலுக்கேற்றவாறு அறிவாளிகள் உருவாக்கம் பெறுகின்றனர். இரண்டாவது வாசிக்கும் ஒருவன் வாசிக்கப்படும் ஒருவனாக மாறுகின்ற கட்டமாகும். இவ்வாறு ஒருவன் வாசிக்கப்படுபவனாக மாறும் போது அவனது பார்வை அவனை நோக்கித் திரும்புகிறது. இது வாசிப்பின் மூன்றாவது கட்டமாகும்.

இந்திய மாபெரும் விஞ்ஞானியும் முன்னை நாள் இந்திய ஜனாதிபதியுமான அப்துல் கலாம் புத்தகங்களைப் பற்றி எழுதிய பின்வரும் கவிதையை இளைஞர்களுக்கு அவர் அடிக்கடிப் படித்துக் காட்டுவார். வாசிப்பின் முக்கியத்துவம் இங்கு வலியுறுத்தப்படுவதோடு, புத்தகங்கள் குறித்த தனது உணர்வுகளை இது தொகுத்துக் கூறுகிறது.

''புத்தகங்கள் எப்போதும் என் தோழர்கள்
கடந்த ஐம்பது வருடங்களுக்கு மேலாக
அவை எனக்கு கனவுகளைக் கொடுத்துள்ளன.
கனவுகள் பணித்திட்டங்களில் முடிவடைந்தன.
நம்பிக்கையோடு பணித்திட்டங்களை ஏற்றுக்கொள்வதற்கு
அவை எனக்கு உதவியுள்ளன.
தோல்வி நேரங்களில் அவை எனக்குத்
துணிச்சலைக் கொடுத்துள்ளன.
நல்ல புத்தகங்கள் எனக்கு
தேவதைகளைப் போல இருந்து வந்துள்ளன.
அவை என் இதயத்தை மென்மையாகத் தொட்டுள்ளன.
எனவே, புத்தகங்களை உங்களது நண்பர்களாக
ஆக்கிக் கொள்ளுங்கள்,
என் இளைய தலைமுறையினரே!
புத்தகங்கள் உங்களது நல்ல நண்பர்களாக
விளங்கட்டும்.''

தனிப்பட்ட முறையில், அப்துல் கலாமைப் பொறுத்தவரை புத்தகங்கள் எப்போதுமே அவருக்குத் துணையாக இருந்து வந்துள்ளன. அவர் சிறுவனாக இருந்த போது சில புத்தகங்களைக் கண்டறிந்தார். அவற்றை அவர் ஒரு போதும் மறக்கவில்லை. தன் கையை பிடித்து அழைத்துச் சென்று, வாழ்நாள் நெடுகிலும் தன்னை வழிநடத்திய நண்பர்களைப் போன்றவை அவை, என அவர் குறிப்பிட்டுள்ளார். அப்புத்தகங்களின் வார்த்தைகள் பல சூழ்நிலைகளுக்கு அர்த்தத்தைக் கொடுக்கின்றன. ஏனெனில், அப்துல் கலாமைச் சுற்றியிருக்கும் உலகத்தைப் புரிந்துகொள்வதற்கு அவர் அவற்றைப் பயன்படுத்தினார். அவர் எந்தவோர் இடத்திலும் இளைஞர்களிடம் பேசும் போது, தவறாமல் ஒரு கேள்வியை இளைஞர்கள் அவரிடம் கேட்பார்; ‘‘உங்களுக்கு மிகவும் பிடித்த புத்தகங்கள் எவை? நவீன வாழ்க்கை நமது பல பழக்கங்களை மாற்றியிருந்தாலும் கூட, படிக்கும் பழக்கம் இன்றும் நம் நாட்டில் மிகப் பிரபலமாக இருந்து வருகிறது. செய்தித் தாள்களில் தொடங்கி, சஞ்சிகைகள் மற்றும் புத்தகங்கள் வரை, படிப்பதற்கு பஞ்சமின்றி நம்மிடம் ஏராளமான வளங்கள் இருக்கின்றன. இந்தியாவின் எழுத்தறிவு வீதம் அதிகரித்திருப்பதால், பல்வேறு வகையான புத்தகங்களுக்கு ஏற்பட்டிருக்கும் கிராக்கியைக் கண்டு மனம் நெகிழ்கிறது. பள்ளிகளில் பிள்ளைகள் வெறுமனே எழுதவும் படிக்கவும் மட்டும் கற்றுக்கொள்வதில்லை என்பதை இது காட்டுகிறது. அவர்கள் கல்வி அறிவு பெறுவதோடு, தங்கள் சிந்தனை முறையை மேம்படுத்துகின்றனர். தங்கள் புரிதல் சக்தியைக் கூர்மையாக்கிக் கொண்டிருக்கின்றனர். விலைமதிப்பிட முடியாத இந்தப் பண்பு நலன்களை உருவாக்குவதற்கு வாசிக்கும் பழக்கம் பெரிதும் உதவுகிறது. வாசிக்கும் பழக்கத்தை ஊக்குவிப்பதற்கு எல்லையே கிடையாது.

பல சுவாரசியமான புத்தகங்களை வாசிப்பதன் மூலம் தணியாத தாகம் கொண்ட ஒரு படிப்பாளியாக முடியும். எமது சொந்த உணர்ச்சிகளால் திக்குமுக்காடிப் போகும் ஆபத்தான சூழலில் இருக்கும் போது சிறந்த புத்தகங்கள் எம் சிந்தனையில் ஒரு சமநிலையைக் கொண்டு வருகின்றன. திருக்குறள் போன்ற நூல்கள் எமது சிந்தனை மீது தாக்கத்தை ஏற்படுத்தும். எமது வாழ்க்கைக்கான நன்நடத்தைக் கோட்பாட்டை இது வழங்குகின்றது. மனத்தை உண்மையிலேயே உயர்த்துகின்ற ஒரு படைப்பாகவும் திருக்குறளைக் அப்துல் கலாம் குறிப்பிட்டுள்ளார்.

பல்வேறு மதங்களின் புனித நூல்களும் எம்மீது பெரும் தாக்கத்தை ஏற்படுத்துகின்றன. வேதங்கள், பகவத்கீதை, தம்மபதம், பைபிள், குரான் ஆகிய அனைத்தும் மனிதனின் நிலை குறித்த ஆழ்ந்த தத்துவ ரீதியான உள்நோக்குகளைக் கொண்டுள்ளன. லூயிஸ் கேரலின் பின்வரும் வரிகள் எவ்வளவு வியப்புக்குரியவை!?

‘‘பலவீனம் பலமாக மாறும் வரை
இருள் வெளிச்சமாக உருவெடுக்கும் வரை
தவறு சரியானதாகத் தோற்றம் எடுக்கும் வரை
தந்திரம், பேராசை, வஞ்சம் ஆகியவை
பகுத்தறிவின் இரவில் கரையட்டும்.’’

‘‘விளக்குகள் வித்தியாசமாக இருக்கலாம் ஆனால் ஒளி ஒன்றே தான்.’’ உண்மையான தேச உருவாக்கத்திற்கு தியாகம், கடும் உழைப்பு, நற்பண்பு ஆகியவற்றின் சக்தி தேவையென்பதையும் சிறந்த நூல்களே எமக்கு எடுத்துக் கூறியுள்ளன. மனித உறவுகளைப்

பற்றிய கதைக் களங்களும், சமுதாயத்தைப் பற்றிக் கொண்டுள்ள கண்ணோட்டங்களும் தத்துவவியலாளர்களின் படைப்புக்கள் மூலம் நாம் கண்டறிய முடியும். தூய்மையான எண்ணங்கள் குறித்த கோட்பாடுகளுக்கும் உலகளாவிய உண்மைகளை அறிவதற்கும் புத்தகங்களே உதவுகின்றன. நாம் நினைப்பதெல்லாம் உயர்வான எண்ணங்களாகவே இருக்க வேண்டும். அவை கைகூடாவிட்டாலும் அந்த நினைப்பை கைவிடக் கூடாது.

# ශ්‍රී ලාංකේය ළමා සාහිත්‍යය තුළ ළමයා කියවීම සහ ළමයාගේ කියවීම

- සේනානි ගුණතිලක බණ්ඩාර*

ශ්‍රී ලංකාවේ සාහිත්‍යය ක්ෂේත්‍රය තුළ මෑත කාලීන ප්‍රවණතා සැලකිල්ලට ගැනීමේදී සංඛ්‍යාත්මකව පොතපත ප්‍රකාශයට පත් වීම ඉහළ ගොස් ඇති තත්ත්වයක් දක්නට ලැබේ. මේ අතරින්ද බහුතරය ළමයින් උදෙසාවන කෘති වීම විශේෂයෙන් කැපී පෙනේ. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් සිදු කෙරෙන අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක (ISBN) නිකුත් කිරීමට අනුව පසුගිය දශකයේ එනම් වර්ෂ 2000 සිට 2004 අතර කාලය තුළ දළ වශයෙන් වසරකට 3000 - 4000ක් පමණ වූ ශ්‍රී ලාංකික ප්‍රකාශන සංඛ්‍යාව 2015 සිට 2018 කාලය වන විට වසරකට දළ වශයෙන් ප්‍රකාශන 11000 - 12000ක අගයක් දක්වා ඉහළ ගොස් ඇත. වාර්ෂිකව ප්‍රකාශයට පත් කෙරෙන මෙම ප්‍රකාශන අතරින් 2015-2018 කාලය තුළ 15%ක පමණ ප්‍රතිශතයක් ළමයින් සඳහා වන අතිරේක කියවීම් පොත් වශයෙන් නිකුත්වී ඇත. ඕනෑම සමාජයක තම අනාගත පරපුරේ යහපත අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කිරීම ප්‍රමුඛව අවධානය යොමුකළ යුතු අංශයක් බව අවිවාදිත කරුණකි. නමුත් සාහිත්‍යය වේවා වෙනත් මොනයම් හෝ ක්ෂේත්‍රයක හෝ වේවා හුදු සංඛ්‍යාත්මක වර්ධනය එහි සාධනීය ලක්ෂණයක් ලෙස සැලකිය නොහැකි අතර වැදගත් වන්නේ ගුණාත්මක මට්ටමේ උසස් ප්‍රමිතිගත නිමැවුම් හෝ නිර්මාණයන් ය.

''ළමයා සඳහා හොඳම දේ'' යන පොදු සම්මතය ළමා පොතපත සම්බන්ධයෙන් සැලකීමේදී අද වන විට ශ්‍රී ලංකාව තුළ ගැටලුකාරී තත්ත්වයකට පත්ව ඇති අතර විද්වතුන්ගේ හා බලධාරින්ගේ අවධානයට අනිවාර්යයෙන්ම ලක්විය යුතු තත්ත්වයක පවතින බවක් පෙනෙන්නට ඇත. මෙය අංශ කීපයක් යටතේ විග්‍රහකොට දැක්විය හැක. පළමුවෙන්ම ළමයින් සඳහා ග්‍රන්ථකරණය පහසු හා සරල කටයුත්තක් බවට අද වනවිට ළමා සාහිත්‍යය ක්ෂේත්‍රයට අවතීර්ණය වී ඇති බහුතර පිරිසක් ලඝුකොට සැලකීම විශේෂයෙන්ම සඳහන් කළ යුතුය. මේ යටතේ හුදු වාණිජමය අරමුණු මුදුන් පමුණුවා ගැනීම අරමුණු කර ගත් පොතපත මෙන්ම තමා ලේඛකයෙකු බවට පත්වීමේ වැඩිහිටි සිහිනය, ළමා පොත් පළකිරීම ඔස්සේ මුදුන් පමුණුවා ගනු වස් එළිදකින පොත්පත් ද වේ. නිර්මාණාත්මක ගුණයෙන් හීන හා තාක්ෂණික මට්ටමින් දුර්වල වූ යම් කථාවක් හෝ සිදුවීමක් දියාරු බස්වහරක් හා රූප පෙලක් හරහා ගෙන හැර දක්වන ප්‍රකාශන ළමා සාහිත්‍යය ලෙස සමාජ ගතවීම සමාජ ව්‍යවසනයකි. ළමා ලෝකයට සිදුකෙරෙන බලවත් අසාධාරණයකි.

දේශීය මෙන්ම ජාත්‍යන්තර වශයෙන්ද සාහිත්‍යධරයන්, විද්වතුන්, අධ්‍යාපනඥයන්, මනෝවිද්‍යාඥයන්ගේ අදහස් මගින් මෙන්ම ළමයින් සම්බන්ධ ජාත්‍යන්තර සංවිධාන, ප්‍රතිපත්ති හා ප්‍රඥප්ති මගින්ද තහවුරු වන්නේ ළමයින් වෙනුවෙන් නිර්මාණකරණය ඉතා වගකීම් සහිත

---

* අධ්‍යක්ෂිකා, පුස්තකාල ප්‍රවර්ධන ප්‍රමිතිකරණ හා ප්‍රකාශන, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

බැරෑරුම් කටයුත්තක් බවයි.

විශ්ව සාහිත්‍යය සැලකීමේදීද විශිෂ්ට ලේඛකයන් සේ සැලකෙන ලියෝ තෝල්ස්තෝයි වැනි ලේඛකයන් පවා ළමා ග්‍රන්ථකරණයට අවතීර්ණ වන්නේ ඉතා අත්දැකීම් බහුල පරිණත ලේඛකයන් බවට පත්වීමෙන් අනතුරුවය.

අදහස් ප්‍රකාශ කිරීමේ හා භාෂණයේ නිදහස පොදු මානව හිමිකමක් සේ සැලකෙන වර්තමාන ලෝකයේ, ඇතැම් යුරෝපා රටවල් පවා ළමා ග්‍රන්ථ රචනයේ දී යම් නියාමනයක් රාජ්‍ය මට්ටමින් සිදු කිරීමට කටයුතු කරනු ලබන අතර එසේ කිරීමෙන් ළමා මනසට නොගැළපෙන හෝ අහිතකර යමක් සම්ප්‍රේෂණය වීම වැලැක්වීම බලාපොරොත්තු වේ.

ශ්‍රී ලාංකේය ළමා සාහිත්‍ය ක්ෂේත්‍රය සැලකීමේ දී ළමයින් වෙනුවෙන් ළමා ග්‍රන්ථ ප්‍රකාශයට පත්කරනු ලබන ළමා ලේඛක පරපුරක් බිහිකර තිබීමක්ද දැකිය හැකිය. සමාජයට ලේඛකයෙකු යනු බිහිකළ යුතු අයෙකු නොව බිහිවිය යුතු අයෙකි. මෙම ග්‍රන්ථ බිහිකරනු ලබනවා යැයි සඳහන් කළ හැක්කේ අද වනවිට ඇතැම් ප්‍රධාන පෙළේ පාසල් හා අධ්‍යාපන කලාප මට්ටමින් තරගකාරීව ළමා පොත් එළිදැක්වීමේ ප්‍රවණතාවක් දක්නට ලැබීමයි. අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක (ISBN) නිකුත් කිරීමට අනුව 2016 - 18 වසරවල සමස්ත (ISBN) අංක නිකුත් කිරීම්වලින් 4%ක් ළමා ලේඛක ලේඛිකාවන්ගෙන් වූ අතර 2019 වර්ෂය වන විට එය තවදුරටත් වර්ධනය වෙමින් 2019 ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලය තුළ සමස්ත ප්‍රකාශන සංඛ්‍යාව වූ 10571න් ප්‍රකාශන 1349ක් පමණ ළමා ලේඛක ලේඛිකාවන් විසින් රචිත ළමා සාහිත්‍යයට අයත් ග්‍රන්ථ වීම විශේෂත්වයකි. මෙය එක් අතකින් ළමයින්ගේ නිර්මාණ කෞශල්‍ය පරිකල්පනය, එළි දැක්වීමක් වෙනුවෙන් පාසල් මට්ටමින් දිරි දීමක් වශයෙන් කෙනෙකුට අර්ථ දැක්විය හැකි වුවත් ඒ සඳහා තොග වශයෙන් ළමයින් විසින් රචිත මුද්‍රිත ග්‍රන්ථ වෙළෙඳපොලට නිකුත් කිරීමක් අවශ්‍යම නොවේ. ළමයින්ගේ නිර්මාණාත්මක හැකියාව ඔප්නැංවීම සමාජගත කිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාකාරකම් පවතින අතර ඒ හරහා ළමයාට ක්‍රමිකව වැඩෙන්නට අවස්ථාව සලසා දිය යුතු වේ. පහත උදාහරණය විමසීම මගින් මෙවැනි පොත් පරිශීලනය කරනු ලබන ළමා පාඨකයෙකු තුළ කියවීම කෙරෙහි ඇති ආකර්ෂණය ගිලිහීයාමට හේතු සාධක වනු ඇති බව පෙනී යයි.

''එක්තරා ගමක පොහොසත් ව්‍යාපාරික සුනන්ද විජේකෝන් මහතාගෙත් කල්‍යාණි මහත්මියටත් දාව උපන් බිලිඳන් පස් දෙනෙකු විය. පළමුව භාතිය දරුවා හය වන ශ්‍රේණියේ ඉගෙනුම ලබයි. ඔහු ඉගෙනීමට මහත් ඇල්මක් හා දක්ෂතාවයක් දක්වයි. නමුත් ඉක්මනින් කේන්ති යන ස්වභාවයක් ඇත.

දෙවෙනියා කමල්ය. ඔහු ඉගෙනීමට එතරම් දක්ෂ නැත. ඔහු සෙල්ලක්කාරය. මව් පියන් කියන දේ අසන්නේ ද, නැත. පියාගේ ධනය පිළිබඳ ආඩම්බරයකින් යහළුවන් අතර වාසය කරයි. ඔහු පස්වන ශ්‍රේණියේ ඉගෙනුම ලබයි. තෙවැනියා සචිනිය. ඇය පාසලේ සෑම විෂය බාහිර ක්‍රියාකාරකම් වලට හා ඉගෙනීමට දක්ෂ, ඉතා සාමකාමී දරුවෙකි. මව්පියන්ගෙන් ලැබෙන අවවාද පිළිගෙන, දැහැමි ජීවිතයක් ගත කිරීමට ඇය කැමතියි. ඇය තුන්වන ශ්‍රේණියේ ඉගෙනුම ලබයි.

හතරවෙනි දරුවා පූර්ණය. ඔහු ඉගෙනීමට දක්ෂ සිසුවෙකි. ඔහු මව්පියන්ට කීකරු ආගමට දහමට ලැදි දරුවෙකි. ඔහු පළවන ශ්‍රේණියේ ඉගෙනුම ලබයි. පස්වන දරුවා පෙර පාසල් යන වයසේය. ඇය නමින් දූලංගාය. ඇය පවුලේ බඩපිස්සාය. '' (සොයුරු පෙම්කැළ රකී මිනිසත්බව ISBN 978-955-692-15-02)

ඉහත ළමා කතන්දර පොත පාසල් දරුවෙකු විසින් රචිත පිටපත් 500ක් මුද්‍රණය කර බෙදාහරින ලද ග්‍රන්ථයකි. මෙහි යොදා ඇති වාග් මාලාව හා කතා සන්දර්භය වැනි මූලික කරුණු

විමසා බැලීමේ දී ද පැහැදිලි වන්නේ එම ග්‍රන්ථයෙහි සමස්තය තුළ ඇති අනුචිතභාවයයි. එක් උදාහරණයක් විමසුවහොත් කුඩා දරුවෙකු හැඳින්වීම සඳහා යොදා ඇති ''සෙල්ලක්කාර වැනි වචන තවත් දරුවෙකු පොත පරිශීලනයේදී ග්‍රහණය කර ගන්නේ කුමන ආකාරයකට ද යන්න පිළිබඳ මෙවැනි පොතපත මුද්‍රණය කිරීමේ කාර්යයට දායක වූ මව්පියන් හෝ ගුරුවරුන් කිසිදු ආකාරයේ වගකීමක් ගෙන නොමැත.

ළමා සාහිත්‍ය කෘතියක් මගින් සිදුවිය යුතු ළමයාගේ හදවත ස්පර්ෂ කළ හැකි නිර්මාණාත්මක සෞන්දර්යාත්මක සාර්ථක ග්‍රන්ථයක් රචනා කළ හැක්කේ ළමා ලෝකය අත්විඳ ඇති ළමයාගේ සිතුවිලි, මනස තේරුම්ගත හැකි, කෙටියෙන් සඳහන් කළහොත් ළමයා කියවිය හැකි, ළමයා පිළිබඳ මනා පරිචයක් සහිත නිර්මාණශීලි අයෙකුට පමණි. වර්තමානය වන විට ශ්‍රී ලංකාව තුළ සංඛ්‍යාත්මකව ඉතා අතළොස්සක් වූවද එවන් නිර්මාණකරුවන් තුළින් එළිදකින උසස් මට්ටමේ ළමා සාහිත්‍යය නිර්මාණ කෘති බිහිවීමක් සිදු වේ. මෙවන් හොඳ මට්ටමේ නිර්මාණ පාඨකයා එනම් ළමයා වෙත ළඟාවීම, සමාජගත වීම ප්‍රමාණවත් පරිදි සිදුවේද යන්න විමසා බැලිය යුතුව ඇත. උදාහරණයක් වශයෙන් රත්න ශ්‍රී විජේසිංහයන් විසින් රචනා කරන ලද පහත පද්‍ය නිර්මාණය කොතරම් අර්ථපූර්ණ සෞන්දර්යාත්මක පබැඳුමක් වන්නේ ද?

''ගොළුබෙල්ලෝ ගොළුබෙල්ලෝ ඔහොම ගියාට
පුළුවනිදෝ ගහ මුදුනට යන්න ඔයාට

උසට උසේ ගහ හැදුනේ නෑ එක රැට
ඇයි ළමයෝ තේරෙන්නේ නැද්ද ඔයාට

ගහ මුදුනේ කොළ විතරයි මල් නෑ පාට
වෙහෙස වෙලා මොකටද ලස්සන නැති දේට

එක රැයකින් ලස්සන හිමි වෙනවද කාට
දළඹු වෙසක් තිබුන නේද සමනලයාට

හිමින් හිමින් ගාට ගාට ඔහොම ගියාට
හිස් අතින්ම බිමට එන්න වේවි ඔයාට

හිමින් හිමින් ගහ මුදුනට මම යනදාට
ගහ මුදුනේ මල් පිපේවි ලස්සන පාට''

නමුත් මෙවැනි හරවත් අගනා නිර්මාණ ළමයා වෙත සම්ප්‍රේෂණය වීම අඩුවීම කෙරෙහි පාඨකයා තුළ එනම් ළමා ග්‍රන්ථ සැලකීමේදී ළමයා, මව්පියන් හා ගුරුවරුන් යන පාර්ශව අතරින් බහුතරයක් තුළ හොඳ මට්ටමේ පොතපත තෝරා ගැනීම පිළිබඳව ඇති දැනුම අවබෝධය අඩුවීමද බලපා තිබේ. ළමයාට මග පෙන්වීම සඳහා වැඩිහිටියන්ගේ කියවීම හා රසඥතාවය හොඳ මට්ටමක පැවතිය යුතු වේ. එසේ නොමැතිව බාහිරව ළමා පොතක් ලෙස විද්‍යාමාන වීම පමණක් ප්‍රමාණවත් නොවේ.

අනෙක් අතින් පරම්පරා ගණනාවක්ම සීමිත ළමා සාහිත්‍යය නිර්මාණ අතළොස්සක්

තුළ පමණක් කොටු වී සිටින පාඨක පිරිසක් සිටීම, සාහිත්‍යයේ විවිධ ඉසව් හා පැතිමාන ඔස්සේ ඒකාකාරිත්වයෙන් මිදී ගමන් ගන්නා වගකීම හඳුනාගත් නිර්මාණකරුවන්ට ද සිදුවන අසාධාරණයකි. සම්ප්‍රදායිකව එකම රාමුවක් ඔස්සේ සිදු කෙරෙන බහුතරයක් ඒකාකාරී නිර්මාණ ළමා සාහිත්‍යය තුළ ප්‍රකාශයට පත්වීම පොතපතින් ළමයා දුරස්වීමට හේතු සාධක වේ. නිදසුනක් වශයෙන් නූතන ළමයාගේ සමාජ වටපිටාව, පරිසරය හා සබඳතාවකයක් නොදක්වන බේබිලා, අප්පොලා, පුෂ්ටිමත් නාගරික දරුවා, අහිංසක අනුකම්පාව දක්විය යුතු අණ්ඩ දමූ ඇඳුම් අඳින ගැමි දරුවන් වැනි චරිත ඇතුළත් නිර්මාණ අද්‍යයතන නිර්මාණ තුළින්ද එළිදැක්වීම සුදුසුවේ. මෙවැනි කතා නූතන දරුවාට ගෝචරවීම හා ඔවුන්ගේ ලෝකය හා ගැලපීම සම්බන්ධයෙන් මෙවන් ප්‍රකාශන එළි දක්වන ලේඛකයන්ගේ මෙන්ම විචාරකයන්ගේද අවධානය යොමු විය යුතුව ඇත. ග්‍රන්ථකරණයට ප්‍රථම ලේඛකයා හොඳ පාඨකයෙක් විය යුතු අතර දේශීය මෙන්ම ලෝක ළමා සාහිත්‍යයේ ධනාත්මක ප්‍රවණතා සම්බන්ධයෙන් අවදියෙන් සිටිය යුතුය. මීට දශකයකට දෙකකට පෙර පැවති තත්ත්වයට වඩා මුද්‍රණ කර්මාන්තයේ ඇති වී ඇති පෙරලියත් සමඟ භෞතික වශයෙන් පොතපත මුද්‍රණය පහසු හා සුලබ වීම හේතුවෙන් ඕනෑම දෙයක් දරුවා අතට පත් නොකිරීමට කටයුතු කිරීම ලේඛක, ප්‍රකාශක දෙපාර්ශවයේම වගකීම වන්නේය.

ළමා සාහිත්‍යය සම්බන්ධයෙන් සලකා බැලීමේ දී ශ්‍රී ලංකාවේ ළමා සාහිත්‍ය විචාර කලාවක් නොමැතිවීම හා විශ්වවිද්‍යාල මට්ටමේ අධ්‍යයන, පර්යේෂණ සීමිත වීමත් මෙම අංශයේ ප්‍රගමනයට අහිතකර ලෙස බලපා ඇත.

ශ්‍රී ලාංකේය ළමා සාහිත්‍යය පිළිබඳ විමසා බැලීමේ දී ලාංකික දෙමළ ළමා සාහිත්‍යය කෘති පළවීම පසුගාමී තත්ත්වයක පැවතීම අවධානයට ලක්විය යුතු තත්ත්වයක් වේ. ජනගහනයෙන් 30% ක් වන දෙමළ බස වහරන ජනතාවගේ මව්බසින් රචිත ළමා ග්‍රන්ථ පළවීම වාර්ෂිකව ISBN අංක නිකුත් කිරීමට අදාළව 1% කටත් වඩා අඩු ප්‍රතිශතයක පවති. එම රික්තය පිර වෙන්නේ දකුණු ඉන්දියානු ළමා සාහිත්‍යය හරහා බහුතරයක් පළවන පළිගැනීම, එකට එක කිරීම වැනි හැඟීම් මත පදනම් වූ කතන්දර හෝ නිර්මාණ හරහා වීම විශේෂයෙන් සලකා බැලිය යුතු වේ. එය ලාංකේය දෙමළ බස වහරන දරුවා දේශීය සංස්කෘතියෙන් ඈත් වීමට බලපෑමක් වන අතර සාහිත්‍ය මගින් සිදුවිය යුතු සංස්කෘතියේ යහපත් අංග පවරා දීමට ඇති ඉඩ ප්‍රස්ථාව ඇහිරී යාමක් ද වේ.

ළමයා යනු කවරෙක් දැයි අර්ථ දැක්වීමේදී මනෝ විද්‍යාඥ ජීන් පියාජේගේ වර්ගීකරණය පොදුවේ අද ලෝකය විසින් පිළිගනු ලැබේ. ඔහුගේ අර්ථ දැක්වීමට අනුව ළමා විය ඉන්ද්‍රිය චාලක අවධිය (උපතේ සිට අවු. 2 දක්වා), පූර්ව සංකල්පක අවධිය (අවු. 2 සිට 4 දක්වා) ප්‍රතිභා චින්තන අවධිය (අවු. 4 සිට 7 දක්වා), සංයුක්ත ක්‍රියාකාරී අවධිය (අවු. 7 සිට 11 දක්වා), විධිමත් චින්තන අවධිය (අවු. 11 සිට 16 දක්වා) යනුවෙන් අවධි පහකට බෙදා දක්වා ඇත. මෙහිදී ශ්‍රී ලාංකේය ළමා සාහිත්‍යය විමසා බැලීමේ දී දැකිය හැකි පොදු ලක්ෂණයක් වන්නේ බහුතරයක් ළමා සාහිත්‍යය නිර්මාණවල තමාගේ ඉලක්කගත පාඨකයා එනම් කුමන වයස්කාණ්ඩවල දරුවන් සඳහා අදාළ ග්‍රන්ථය ගැලපේද යන්න පිළිබඳ නිසි අවබෝධයකින් හෝ විමසා බැලීමකින් තොරව බහුතර පිරිසක් ලේඛනකරණයේ නියැලෙන බවයි. ළමා ග්‍රන්ථයක තේමාව තෝරා ගැනීමේ සිට කතාව ගලායාම, භාෂාව හැසිරවීම, සිද්ධි ගැලපීම, චිත්‍ර යෙදීම යන සියල්ල ඉලක්කගත වයස් කාණ්ඩවලට උචිත පරිදි සියුම්ව කළ යුතුය. සාර්ථක ළමා ග්‍රන්ථයක භාවිත කරන වචන, වාක්‍යඛණ්ඩ ආදිය ද ළමයාගේ රසඥතාවය පරිකල්පනය, නිර්මාණශීලි බව, වාග්කෝෂය හා පෞරුෂ වර්ධනයට ඉවහල්වන පරිදි යෙදිය යුතු අතර මානව සංස්කෘතියේ යහපත් අංග ග්‍රහණය කරන ගැනීම මනා රුකුලක් සැපයිය යුතු ය. භාෂාව සරල, සුගම, සුපෝෂිත බස් වහරක් විය යුතුය. විවිධ සිද්ධි හා

ගැටුම් යොදා ගනිමින් කතාව පුරා දුක, සතුට, ත්‍රාසය, භීතිය, දයාව, මෛත්‍රිය, කෝපය වැනි විවිධ මනෝභාවයන් දෝලනය වන ආකාරයට කතාවේ ගලායාම සිදු වුවත් කිසිදු අවස්ථාවක වෛරී සිතුවිලි හෝ ඍණාත්මකව මනස බිඳ වැටෙන ආකාරයේ ප්‍රවේශයකින් කතාව අවසන් නොවිය යුතුය. ධනාත්මක හෝ වින්දනීය ප්‍රවේශයකින් ළමා කතාවක් අවසන් විය යුතුය. හොඳ මට්ටමේ ළමා ග්‍රන්ථයක් එක් අතකින් හොඳින් සංස්කරණය කළ සාර්ථක චිත්‍රපටයකින් හෝ කවියකින් වෙනස් වන්නේ ධ්වනිතාර්ථ හෝ සැඟවුණු අරුත්වලින් ව්‍යුක්ත වීමෙන් පමණි.

විවිධ වයස් කාණ්ඩ සඳහා පළවෙන පොත්පත් අතර ශ්‍රී ලාංකේය ප්‍රකාශන ක්ෂේත්‍රයේ වයස අවු. 2 සිට 4 අතර ප්‍රතිභා චින්තන අවධියේ දරුවන් සඳහා වන ග්‍රන්ථ ප්‍රකාශයට පත් නොවන තරම්ය. මෙම අවධියේ ළමයින්ගේ චිත්තවේගී සාක්ෂරතාව වර්ධනය කිරීමට ලෝකයේ බොහෝ රටවල් පින්තූර කතාපොත් (Board Books) භාවිත කරන අතර එය මුල් අවධියේම ළමයා පොත්පත් වෙත හුරු කරවීමටද පිටුවහලක් වේ.

ශ්‍රී ලාංකීය ළමා සාහිත්‍ය කේෂ්ත්‍රය තුළ දක්නට ලැබෙන ඉහත තත්ත්වයන්ට සමගාමීව අනෙක් අතින් ළමයාගේ කියවීම ප්‍රශස්ත මට්ටමක නොපවතින බවට හා කියවීම ප්‍රවර්ධනය සම්බන්ධයෙන් විශාල සමාජ කතිකාවතක් ගොඩනැගී ඇත. එය අධ්‍යාපන අමාත්‍යංශය පොතපත හා සම්බන්ධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන, සංවිධාන හා විශ්වවිද්‍යාල යන විවිධ අංශ හරහා කරළියට පැමිණ ඇත. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ මූලිකත්වයෙන් 2004 වසරේ සිට ආරම්භ කර ඇති ඔක්තෝබර් ජාතික කියවීමේ මාසයට සමගාමීව රට පුරා විහිදී ඇති, පාසල් පුස්තකාල, මහජන පුස්තකාල ඇතුළු සංස්කෘතික මධ්‍යස්ථාන වැනි ආයතන සම්බන්ධ කර ගනිමින් විවිධ කියවීම් ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අතර කියවීම් කඳවුරු, රස වින්දන වැඩසටහන් , නිර්මාණ එළිදැක්වීම්, කියවීම් ප්‍රවර්ධන විවිධ තරග සංවිධානය, නිවැරදි කියවීම් ක්‍රමවේද සම්බන්ධ පුහුණුකරුවන් පුහුණු කිරීම වැනි වැඩසටහන් දැක්විය හැකිය. 2019 වසරේ ජාතික කියවීම් මස තේමාව වශයෙන් තෝරා ගනු ලැබූ ''දරුවොත් එක්ක කියවමු.'' පාඨය මඟින් ද මෙම වසර තුළ දරුවාගේ කියවීම සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කිරීමට බලාපොරොත්තු විය. අධ්‍යාපන අමාත්‍යංශය මගින් ද ''කළණ මිතුරු පොත් සුමිතුරු'' වැනි වැඩසටහන් හරහා කියවීමේ සංස්කෘතියක් වෙත දරුවා අනුගත කිරීම සඳහා ප්‍රයන්ත දරනු ලබයි. මෙවැනි විවිධ ව්‍යාපෘති හරහා ඇතැම් අංශවලින් යම් මට්ටමක ප්‍රගතියක් ඇති වී ඇතත් ශ්‍රී ලංකාවේ අනාගත පරපුරේ කියවීම සම්බන්ධයෙන් සතුටු විය හැකි තත්ත්වයක් පවතින්නේ යැයි කිව නොහැක. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් 2013,2015 හා 2017 යන වර්ෂවල පාසල් ළමුන් යොදා ගනිමින් සිදු කළ සමීක්ෂණ තුනකට අනුව ඔවුන්ගේ කියවීම් පුරුද්ද ප්‍රමාණවත් මට්ටමක නොපවතින බව අනාවරණය වී ඇත. එසේම ළමයින්ගේ කියවීම් ද්‍රව්‍ය එනම් කියවා ඇති අතිරේක ග්‍රන්ථ මීට දශක තුන හතරකට පෙර රචිත ලේඛකයන් කිහිපදෙනෙකුගේ සීමිත ග්‍රන්ථ කිහිපයකට පමණක් සීමාවීමද විශේෂයෙන් කැපී පෙනෙන තත්ත්වයකි. උතුරු නැගෙනහිර පළාත්වල දරුවන්ගේ කියවීම් ද්‍රව්‍ය බොහෝ දුරට හින්දු සාහිත්‍ය හා සම්බන්ධ මහා වීර කාව්‍ය වෙත සීමාවීමත් සමීක්ෂණ අනුව හෙළි වී ඇත.

ඒ අනුව 21 වැනි සියවසේ අධ්‍යාපන ක්‍රමය තුළින් බිහිවන දරුවා නිශ්චිත අධ්‍යාපන රාමුවක් තුළ කොටු වූ දැඩි තරගකාරීව හා අතිධාවනකාරීව විභාග වෙනුවෙන් පමණක් මෙහෙයවනු ලබන යාන්ත්‍රික දරුවෙකු නොවිය යුතුය. රටක් වශයෙන් ඕනෑම සමාජයක් සංවර්ධනයේ දී අනාගත පරපුර තාර්කික චින්තනයෙන් හා නිර්මාණශීලී චින්තනයෙන් හෙබි පුද්ගලයන්ගෙන් සමන්විත විය යුතුය. ඒ සඳහා කියවන සමාජයක්, කියවන සංස්කෘතියක් මගින් ලැබෙනුයේ මහඟු පිටුබලයකි. ළමයාගේ කියවීම රටක් හා ලෝකයක් වශයෙන් කෙතරම් අවධානයට ලක් කළ යුතු කරුණක් ද යන්න 1916 දෙසැම්බර් අගභාගයේ හෝ 1917 ජනවාරි මස මුල් භාගයේ රුසියානු මහා ලේඛක

මැක්සිම් ගෝර්කි විසින් ඉංග්‍රීසි ජාතික විශිෂ්ට ලේඛක එච්. ජී. වේල්ස් වෙත යැවූ ලිපියක සඳහන් පහත උපුටා ගැනීම් මගින් ද මැනවින් ස්ඵුට වේ.

''ආදරණීය මිත්‍රය දැන් ඉතින් ඔබට තවත් කාරණයක් කියන්නට තිබෙනවා.... අන් හැම කාලයකටම වඩා අද අපට මහ පොළොව මත වැදගත්ම වස්තුව වෙලා තියෙන්නේ ළමයි. ලෝකයේ අනෙක් සියලුම ළමයින්ට වැඩිය විශේෂයෙන් රුසියන් ළමයි ලෝකය ගැනත් ඒ ලෝකයේ ශ්‍රේෂ්ඨ මිනිසුන් ගැනත් ඔවුන් මිනිසාගේ ප්‍රීතිය සඳහා නිම කළ කෘතීන් ගැනත් දැනගතයුතුව තියෙනවා. මේ දුෂ්ට නිස්සාර උන්මත්තක යුද්ධයේ ලේ ගැවුණු මළකඩවලින් ඔවුන්ගේ හදවත් පිරිසිදු කිරීම අපට අයත් කාර්යයක් වෙලා තියෙනවා. ඒ හදවත්වල මනුෂ්‍ය වර්ගයා කෙරෙහි ආදර භක්තියක් හා ගෞරවයක් ජනිත කරවන්න ඕනෑ. ඒ හදවත් භක්තියෙන් පුරවන්න ඕනෑ. ඒ නිසා ආදරණීය වේල්ස් මම ඔබෙන් එක ඉල්ලීමක් කරනවා. එඩිසන්ගේ ජීවිතයත්, ඔහුගේ සොයා ගැනීම් හා සේවාවන් ගැනත් ළමයින්ට ගැලපෙන පොතක් ලියා එවන්න. ළමයි තුළ විද්‍යාව ගැනත් වැඩ කිරීම ගැනත් ආදරය ඇති කිරීම සමත් වන පොතක අගය කුමක් ද කියා ඔබ හොඳින් දන්නවා. ඒවගේම මම බලාපොරොත්තු වෙනවා බිතෝවන් ගැනත්, නැන්සන් සහ කොළොම්බස් ගැනත් පොතක් ලියන්න කියා රොමෙන් රෝලන්ඩ්ගෙන් ඉල්ලා සිටින්නට මේ විදියට ලෝකයේ ශ්‍රේෂ්ඨ මිනිසුන් ගැන අපේ ළමයින්ට ප්‍රතිරූප පේළියක්ම ඉදිරිපත් කරන්න පුළුවන්.''

ලෝකය විද්‍යාත්මක හා තාක්ෂණික වශයෙන් කොතරම් ඉදිරියට ගමන් කළද ''කියවීම'' සම්බන්ධ ඉහත ඓතිහාසික ප්‍රකාශයට හිමි සදාතනික වටිනාකම කිසිදිනක හීන වී නොයනු ඇත.

## ආශ්‍රිත මූලාශ්‍ර

අබේසිංහ, ඩබ්ලියු. ඒ. (2003) ළමා සාහිත්‍යයට පෙරවදනක්. කොළඹ. ඇස්. ගොඩගේ

කාරියවසම්, තිලෝක සුන්දරී (1974) පියාජේගේ සංවර්ධන මනෝවිද්‍යාව. කොළඹ. ඇම්. ඩී. ගුණසේන

ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයට සමගාමීව සිදුකරන ලද කියවීමේ රුචිය පිළිබඳ පාඨක සමීක්ෂණය. 29-32පි. ජාතික කියවීම් මාසය සමරු කලාපය 2013. කොළඹ. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

පරිපාලන වාර්තා 2000 -2004. කොළඹ. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

විජේසිංහ, රත්න ශ්‍රී. (2014) සැළලිහිණියෝ ළමා ගී. කොළඹ. ඇස්. ගොඩගේ

ළමා ග්‍රන්ථ සැකැස්මේ ක්‍රමවේදය. නියමු අත්පොත (2018). කොළඹ. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

ළමා සාහිත්‍ය කෘති ඇගයීම . ජාතික පර්යේෂණ ව්‍යාපෘතිය (2019). කොළඹ. අධ්‍යාපන අමාත්‍යංශයේ පාසල් පුස්තකාල සංවර්ධන ශාඛාව

ISBN දත්ත පදනම ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

Readership Survey of school children in Sri Lanka : 2014. Colombo. National Library & Documentation Services Board

Survey of Reading habits of school children in Northern and Eastern Provincese 2017. Colombo. National Library & Documentation Services Board

# දරුවන් සමඟ කියවීම : මහජන පුස්තකාලයක කාර්යභාරය

- වරුණි ගඟබඩආරච්චි*

මහජන පුස්තකාල, දැනුමේ ප්‍රාදේශීය දොරටු ලෙසත්, පොදු ජනතාවගේ විශ්වවිද්‍යාල ලෙසත් නිර්වචනය කෙරී ඇත. යුනෙස්කෝව මඟින් ප්‍රකාශයට පත් කෙරුණු මහජන පුස්තකාල පිළිබඳ ප්‍රඥප්තියට අනුව මහජන පුස්තකාල සමාජයේ විවිධ ස්ථරවලට, විවිධ ජන කොට්ඨාසවලට කිසිදු භේදයකින් තොරව සේවාව සැපයීමට බැඳී සිටී. එමෙන්ම මහජන පුස්තකාලයක ප්‍රධාන අරමුණු වන්නේ සියලු වයස් කාණ්ඩවල ජනයාගේ අධ්‍යාපනයට ආධාර කිරීම, ප්‍රජාවගේ තොරතුරු අවශ්‍යතා හඳුනාගෙන ඒවා ක්ෂණිකව ලබා දිය හැකි ලෙස සංවිධානය කිරීම, පුද්ගල සංවර්ධනය, නිර්මාණශීලිත්වය වැඩිදියුණු කිරීම, දරුවන්ගේ යෞවනයන්ගේ කියවීම් පුරුදු ඇති කිරීම, ප්‍රජාවගේ සංස්කෘතික සහ කලාත්මක හැකියාවන් වර්ධනය කිරීම ආදිය වෙයි. එමෙන්ම සාමාජීය වශයෙන් මහජන පුස්තකාල මඟින් සිදුවිය යුතු විශේෂ කාර්යයන් කිහිපයක් ද වේ.

ප්‍රජාව මුණ ගැසෙන හා ඔවුන්ගේ සන්නිවේදනය සඳහා පහසුකම් සපයන ප්‍රජා මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කළ යුතුය. එසේම සියලු ජන කොටස්වලට ඔවුන්ගේ අවශ්‍යතා අනුව එහි සේවාව සකස් විය යුතුය. ජනයාගේ ජීවිත යහපත් පරිවර්තනයකට ලක්වන ආකාරයේ වැඩසටහන් හා ජීවිත කාලය පුරා අධ්‍යාපනය ලබාදෙන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කළ යුතුය. විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ දී 2015 වර්ෂයේදි සම්මත කර ගන්නා ලද තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට අවශ්‍ය පසුබිම, දැනුම්, තොරතුරු මහජන පුස්තකාලය මඟින් සැකසිය යුතුය.

## කියවීම් ප්‍රවර්ධනය

මෙම සියලු ඉලක්ක ළඟා කර ගැනීම සඳහා දැනුවත්, තොරතුරු ගවේෂණය මඟින් එදිනෙදා ජීවිතයට අවශ්‍ය තොරතුරු ලබාගෙන තාර්කික තීරණ ගැනීමට හැකි සමාජයක් බිහි කිරිම  අවශ්‍යය. මේ සඳහා තම ප්‍රදේශයේ දරුවන්, යෞවනයන් අතර කියවීමේ පුරුදු ඇති කිරීම සිදු කළ යුතුය. කුඩා කාලයේදී පූර්ව ළමාවියේදී  ඇතිවන පුරුදු මුළු ජීවිතය පුරා පවතියි. එලෙසම කුඩා කල සිට කියවීමට හුරුවන දරුවාට එය නිරායාසයෙන්ම ජීවන පුරුද්දක් බවට පත්වේ.

* ප්‍රධාන පුස්තකාලයාධිපති, කොළඹ මහජන පුස්තකාලය

## කතන්දර කියවීම



දරුවා කියවීමට හුරුකිරීමට නොයෙකුත් ක්‍රියාමාර්ග මහජන පුස්තකාලයට ගත හැකිය. මේ අතර කතන්දර කියවීම (Story Telling Hours) ඉතා ජනප්‍රිය පහසුවෙන් ක්‍රියාවට නැංවීමට හැකි උපක්‍රමයකි. මෙහිදී හඬ නගා කතන්දරයක් කියවා පසුව එහි සිත් ගන්නා අවස්ථා චිත්‍රයකට නැංවීමට, රංගනයක් ලෙස ඉදිරිපත් කිරීමට දරුවන්ට අවස්ථාවක් ලබා දිය හැකිය.

කතන්දර කියවීම සතිපතා එක් දිනක යොදා ගැනීමත් , එය විවිධ පුද්ගලයන් ලවා විවිධත්වය ඇති වන අයුරින් සිදු කිරීමත් උචිතය.

කතන්දරය දරුවන් කැමති ආකාරයට ආකර්ශණීයව කියවීම ඉතා වැදගත් ය. ඒ සමග සිත් ගන්නා ආකාරයට කතාව ඉදිරිපත් කිරීම, විශේෂයෙන් මුහුණේ ඉරියව් මගින් කථාවේ අදහස් සම්ප්‍රේෂණය කිරීම වැදගත් ය. කතාව අතර මැද දී දරුවන්ට බාධා කිරීමට අවස්ථාව ලබා දීමෙන් සහ කතන්දරයේ චරිත අතර දරුවන්ට පිවිත්වීමට අවස්ථාව ලබා දීමෙන් ඔවුන්ගේ අවධානය දිනා ගැනීමට හැකිය.

කතන්දර ඇසීමට සැලැස්වීම දරුවන්ගේ සාර්ථක කියවීමකට හුරු කිරිමේ අඩිතාලමය. මෙමගින් භාෂා හැකියාවේ දියුණුවීම, වාග් මාලාවේ දියුණුව, ඇහුම්කම් දීමේ කුසලතාව නැංවීම, කතන්දරයේ චරිත විග්‍රහ කිරිම සහ තමන්ට ආදේශ කර ගැනීම, විවිධ මාතෘකා පිළිබඳ දැනුම ඇතිවීම, විවිධ ලිවීමේ විලාශයන් හදුනා ගැනීම, සමාජ හා සදාචාරාත්මක ගැටලු පිළිබඳ දැනුවත් බව, තමන්ගේ හැසිරීම පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම ආදී යහපත් දේ දරුවන් තුළ ඇති වේ.

අවසානයේ දරුවා හොඳ පොත් කියවන්නෙකු බවට පත්වනවා පමණක් නොව බුද්ධිමත්ව හා තර්කානුකූලව සිතිය හැකි අයකු බවට පත් කෙරෙයි. දරුවන්ගේ අනාගත ජීවිතයේ සාධනීය වෙනසක් ඇති කිරිමට එය පාදක වනු ඇත.

## නින්දට පෙර කියවීම

නින්දට පෙර එනම් දරුවන් නින්දට යන අතර කතන්දර කියවීම, කියවීම් රුචිය වර්ධනය වන තවත් උපක්‍රමයකි. නින්දට පෙර කියවීම මගින් දරුවන් සහ දෙමව්පියන් අතර බැඳීම් වැඩි වෙයි. දරුවන් එමගින් පහසුවෙන් කියවිමට නැඹුරු කළහැකි වේ. කතන්දරය කියවන විට එහි ඇතුළාන්තයට කිමිදෙමින් දරුවන්ගේ කුතුහලය වැඩෙන ලෙස කියවිම මගින් දරුවන් ඒ සඳහා ආකර්ශනය කරගත හැකි වේ. එලෙසම ඔවුන්ගේ ඥානය , චිත්ත රූප මවා ගැනීම, නිර්මාණශීලිත්වය වර්ධනය වේ. එය අනාගත ජයග්‍රහණවලට ඉතා හොඳ අඩිතාලමක් වනු ඇත.



## කතන්දර කියවීම සඳහා පොත් තෝරා ගැනීම,

දරුවන්ට කියවීමට සුදුසු පොත් තෝරා ගැනීම ඉතා වැදගත් ය. ඒවා විවිධත්වයෙන් යුතු විය යුතුය. දරුවන් සංවේදිත්වය, කාරුණ්‍යාව, දයාව සමීප කළ යුතුය. විවිධ සංස්කෘතීන් විවිධ ආගම්, චාරිත්‍ර, ජීවනරටා ඇතුළත් පොත් කියවීමට සැලැස්වීමෙන් ඔවුන්ට විවිධ විෂයයන් ගැන දැනුමක් ලබාදිය හැකිය. විවිධත්වය නිසා ඒකාකාරි රටාවෙන් මීදීමට හැකිය.



මෙම කතන්දර අතර තමන්ගේ චරිතය දකින දරුවා, එමගින් චරිතයක් නිරූපණයක් උකහා ගැනීමටත්, අනුකරණයටත් පෙලඹේ. තමන් ද වැදගත් චරිතයක් බව ඔහුට වැටහේ. එමෙන්ම තමා අවට විවිධ සමාජයන් ඇති බව ඔහු තේරුම් ගනී.

එබැවින් විවිධ විෂයයන්, විවිධ සංස්කෘතින් පිළිබඳ පොත් තෝරා ගැනීම දතයුතුය. අනාගත පාඨකයෙකු බිහිවීම පොත් නැති රික්තයක සිදු නොවේ. එබැවින් දරුවන්ට විවිධාකරයේ පොත් සුලභ කළ යුතුය. මේ සඳහා මහජන පුස්තකාලය ඇසුරු කිරිමට දරුවා සමඟ දෙමව්පියන් යොමුවීම වඩාත් ඵලදායී වේ. දරුවන්ගේ වයස් ප්‍රමාණය අනුව තෝරා ගත යුතු පොත් පිළිබඳව ද සැලකිලිමත් විය යුතුය.

## දෙමව්පියන් දැනුවත් කිරීම

බොහෝ අවස්ථාවල මහජන පුස්තකාලයට සම්බන්ධ කෙරෙන්නේ පාසල් යන දරුවන් ය. පූර්ව ළමා වියේ පසුවන සහ අවුරුදු 3ට වඩා අඩු වයස් මට්ටම්වල දරුවන් පුස්තකාලයට රැගෙන ඒමට දෙමව්පියෝ මැළිකමක් දක්වති. අඩු වයස්වල දරුවන් පුස්තකාලයට රැගෙන ඒමට උනන්දු කිරීම අතිශයින් වැදගත් ය. දරුවන් කෙතරම් කුඩා වුවත් ඔවුන්ට පොත්පත් කියවීම මඟින් හොඳ දැනුමක් හා වාග් මාලාවේ දියුණුවක් දිය හැකි බව පර්යේෂණ මගින් පෙන්වා දී ඇත.

එමෙන්ම දරුවන් තුළ කියවීමේ පුරුද්දක් ඇති කිරීම සඳහා නින්දට පෙර කියවීමට දෙමව්පියන් දැනුවත් කළ යුතු පමණක් නොව ඒ සඳහා සුදුසු පොත් පත් දෙමව්පියන්ට සපයා දීමට ද පුස්තකාලයකට කළ හැකිය. පොත් පත් සහිත වටපිටාවක් නිර්මාණය කිරීම, හැකි සෑම අවස්ථාවකදීම දරුවන් සමඟ කියවීමට සම්බන්ධ වීමේ වැදගත්කම කෙරෙහි දෙමාපියන් දැනුවත් කළ යුතුය. පුස්තකාලයට පැමිණි පසු වුවද දරුවන් සමඟ එකට වාඩි වී කියවීම මගින් දරුවන්ට තුළ උත්තේජනයක් ඇති කෙරේ.

මෙසේ ඉතා කුඩා අවධියේදී කියවීමට හුරුවෙන දරුවා අනාගතයේදි විවිධ සාහිත්‍ය ශානර ඔස්සේ කියැවීමට යොමු වනවා ඇත. එනම්, ඓතිහාසික කතා, අද්භූග කතා, ජනකතා, නවකතා, පරිසර ආශ්‍රිත කියවීම් උපමා කතා විද්‍යා ප්‍රබන්ධ ආදියයි.

මෙම කියවීම් මගින් දරුවා තුළ සමබර පෞරුෂයක් ගොඩ නැගෙයි. ඔහුගේ ජීවිතයට අරුතක් ලැබේ. ඔහුට නව පන්නරයක්, නව දැක්මක් ලැබේ. දරුවන්ගේ හා යෞවනයන්ගේ

කියවීමේ පුරුදු ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවර ගැනිම පුස්තකාලයක ප්‍රධාන කාර්යයක් විය යුතුය. ඒ අනුව මහජන පුස්තකාලය යනු  දරුවන්ගේ කියවීම් පුරුදු ඇති කිරීමටත්, කියවීම් රුචිය වැඩි දියුණු කිරීමටත් අවශ්‍ය පියවර ගන්නා ආයතනයක් වේ.

## ආශ්‍රිත මූලාශ්‍ර

The_Role_of_Parents_in_Adolescents'_Reading_Motivation_and_Activity(2009). Educational Psychology Review 21(4):pp325-363

Helen M. Robinson, Samuel. Weintraub. Research Related to Children's Interests and to Developmental Values of Reading:, https://core.ac.uk/download/pdf/4816055.pdf

IFLA/UNESCO Public Library Manifesto, https://www.ifla.org/node/91700

Islam,Chanda and Park, Mi-Hwa, International Journal of Language and Linguistics Vol. 3, No. 2; June 2016http://ijllnet.com/journals/Vol_3_No_2_June_2016/5.pdf

Serafini, Frank. (2011). The Reading Teacher Vol. 65 Issue 1 pp. 30–34 DOI:10.1598/RT.65.1.4 International Reading Association. http://frankserafini.com/publications/serafini-create-space.pdf

# දරුවන් අපචාරවලින් මුදා ගැනීමට කියවීම ඉවහල් කරගනිමු

- ලංකා රාජිණී අමරසේන*

ළමයින් යනුවෙන් හැඳින්වෙන්නේ කවුරුන්දැයි අපි පළමුව සොයා බලමු. ළමයා යනුවෙන් හැඳින්නේ වයස අවුරුදු 18ට අඩු සියලු පුද්ගලයන් ය. එනම් වයස අවුරුදු 18ට වඩා අඩු ගැහැනු පිරිමි සියල්ලෝම ළමයි වෙති. මේ බව සඳහන් වන්නේ 1989 වර්ෂයේ දී ඇතිකරගත් ජාත්‍යන්තර ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ පළමු වන වගන්තියෙහි(ව්‍යවස්ථාවෙහි).

මෙම සුන්දර ළමාවියේ දී ළමයින්ගේ ප්‍රධානතම කාර්ය වන්නේ අනාගතය ශක්තිමත්ව සුන්දර කර ගැනිමට අවශ්‍ය පදනම යොදා ගැනීමයි. එකී කාර්යය සඳහා හොඳ අධ්‍යාපනයක් ලැබිය යුතු වේ. අධ්‍යාපනය ලැබීමේ දී දැනුම සපයා ගැනිමේ ප්‍රධාන ක්‍රියාකාරකම වනුයේ කීයවීමයි. පොත්පත්, සඟරා, ලිපි වැනි මුද්‍රිත දෑ කියවිම සේම, විද්‍යුත් පොත්පත් කියවීමද වර්තමානයේ වඩාත් ප්‍රචලිත කියවීමේ කලාව බවට පත්ව ඇත.

''කියවීමෙන් මිනිසා සම්පුර්ණ වේ''ය යන කියමන අප ඉතා කුඩා කල සිටම අසා ඇති ප්‍රසිද්ධ කියමනකි. අද වන විට කියවීමෙන් බැහැරව රූපවාහිනි තිරය දෙස බලාසිටිම, පරිගණක ක්‍රීඩා (computer games) වලට ඇබ්බැහි වීම ඉතා භයානක ලෙස සමාජගත වී ඇත. කියවන ළමයා තුළ ඇතිවන යහපත් ගුණාංගයන් රාශියක් පවතී. එසේම පොත්පත් කීයවීමෙන් ළමයා ලබන ඵල ප්‍රයෝජන ද අති මහත්ය. එම ඵල ප්‍රයෝජන අතර දැනුම ලබාගැනීම, සංවේදීබවට හුරුවීම, හොඳ සන්නිවේදන හැකියාවන් වර්ධනය වීම, නිර්මාණශීලි චින්තනය දියුණු වීම යනා දිය වේ.

පොත් පත් කියවන පුද්ගලයකු සිය ජිවිත කාලය තුළ ජිවිත දහසක ජිවත් වන බවත්, පොත්පත් නොකියවන පුද්ගලයා සිය ජිවිත කාලය තුළ එක් ජීවිතයක පමණක් ජිවත් වන බවත් ඇමරිකානු නවකතාකරුවෙකු , කෙටිකතාකරුවෙකු, ත්‍රාසජනක හා විද්‍යා ප්‍රබන්ධ ලේඛකයකු වශයෙන් ප්‍රසිද්ධියට පත් ජෝර්ජ් ආර්.ආර්.මා(ර්)ටින් මහතා වරෙක පවසා ඇත. එනම්, කියවීම පුරුද්දක් කරගත් පුද්ගලයෙකු හට විවිධාකාරයේ ජිවිත විශාල ප්‍රමාණයක අත්දැකීම්, දැනුම ලබාගත හැකි වන අතර පොත්පත් නොකියවන්නාට එය අහිමිය.

කියවීමට හුරුවන දරුවෙකු හට තමන් ජිවත් වන සමාජයේ යථාර්ථය අවබෝධ කර ගැනීමට හොඳ නරක පිළිබඳව දැනුම සහ අවබෝධය ලබා ගැනීමට හැකියාව ලැබේ. එසේම අවට පරිසරයේ සිදුවන වෙනස්වීම් අවබෝධ කර ගැනිමට අවශ්‍ය දැනුම සහ ඥානය ද පොත්පත් කියවීමෙන් ලැබේ. ප්‍රදේශ කිහිපයක, වසර ගණනාවක් ජීවත් වෙමින් ලබාගත හැකි දැනුම, අවබෝධය පොත් කිහිපයක් කියවීමෙන් ලබාගත හැකිය. එසේම පොතපත කියවා සිය දැනුම වර්ධනය කර ගන්නා ළමයා වඩා සංවේදී ළමයෙකු බවට නිතැතින්ම පත් වේ.

පරිසරයට, ගහකොළට, සතා සිව්පාවට සංවේදී මිනිසුන් හිඟ වෙමින් යන යුගයක කියවීමට

* පොලිස් අධිකාරි, අධ්‍යක්ෂ, ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශය

හුරුවුණු පරපුරක් මගින් ඒ අඩුපාඩුව සපුරාගත හැකිවනු ඇත.

භාෂාවක් නියමාකාරයෙන් හැසිරවීමේ හැකියාව ඇත්තේ මිනිසාට පමණි. එමගින් සන්නිවේදන හැකියාවන් සමගම ලිවිම, කියවීම වැනි හැකියාවන් ප්‍රගුණ කළ හැක්කේ ද මිනිසාට පමණි. ඒ ඔස්සේ බලන කල අනෙක් සත්ත්වයන් අතරින් මිනිසා දැනුමින්, අත්දැක්ම් අතින්, කුසලතාවන්ගෙන් පෝෂණය කරවීමෙහි ලා ප්‍රබල දායකත්වයක් සපයනු ලබන්නේ 'පොත්පත් කියවීම' මඟිනි.

පොත්පත් කියවීම මගින් ළමයින්ගේ සන්නිවේදන හැකියාවන් ද ශීඝ්‍රයෙන් ඉහළ නැංවේ. කියවීමෙන් ලබා ගන්නා දැනුම, ආකල්ප කුසලතා ඔස්සේ ළමයා යමක් සමාජයට ඉදිරිපත් කරන ස්වභාවයෙහි ද යම් ප්‍රවර්ධනයක් පවතින බව ළමයෙකු සියුම්ව නිරීක්ෂණය කිරිමෙන් අවබෝධ කරගත හැකිය. පැහැදිලිව සහ දක්ෂ ලෙස අදහස් ප්‍රකාශ කිරීමට පෙලඹීමක් මින් ලබන අතර, නොබියව සිය අදහස් සහ මතය ප්‍රකාශ කිරිමට ඉදිරිපත් වීමේ හැකියාවක් ද 'නිතර පොත්පත් කියවන ළමයින්' තුළ නිරායාසයෙන්ම වර්ධනය වේ.

සත්‍ය සිදුවිම් හෝ මනඃකල්පිතයන් හෝ ඇසුරු කරගනිමින් කාලීනව අවධානයට ලක්කළ යුතු කරුණු සහ බොහෝ කථිකාවන්ට ලක්කළ යුතු සමාජ ප්‍රශ්න වස්තු විෂය කොටගෙන පොත පත ලියවේ. මෙවැනි ප්‍රබන්ධ රසවත් බව්න් අනූන සේ ම ඒවායින් ළමයාට ලබා ගත හැකි සමාජ දැනුම ද අති මහත්ය. පොත්පත් කියවීම මඟින් ලබන අස්වාදයට වඩා යමක් ඉන් ලැබෙන බව තවදුරටත් ප්‍රත්‍යක්ෂ වන කරුණ නම් කියවීමට හුරු වූ ළමයාගේ චින්තන ශක්තිය ද ඉතාම නිර්මාණශීලි ලෙසින් උත්පාදනය වීමයි. ළමයෙකු ලබන මෙම නිර්මාණශීලී චින්තනයෙන් ඔහුගේ දෛනික අධ්‍යාපන කටයුතුවලට පමණක් නොව සමාජීය ජීවිතයට ද මහගු ප්‍රතිඵල ලැබේ. කියවීම ඔස්සේ ළමයා වරින් වර උකහාගන්නා දැනුම ඔහු නොදැනුවත්ම ඔහුගේ මතකයේ තැන්පත් වේ. ළමයා එදිනෙදා ජිවිතයේ කරදරයකට පත්වන අවස්ථාවල දී, ගැටලුවකට මුහුණ දෙන අවස්ථාවකදී හෝ අවශ්‍ය වන ඕනෑම අවස්ථාවකදී එම තැන්පත් දැනුම නිර්මාණශිලී ලෙස ආදේශ කර ගැනිමට ළමයාට හැකියාවක් ලැබේ. උදාහරණයක් ලෙස ප්‍රබන්ධයක දී යම් ළමයෙක් අපයෝජනයකට, හිංසනයකට ලක්වීමකට අත්‍යාසන්න අවස්ථාවකදී ඔහු හෝ ඇය උපක්‍රමශීලිව ක්‍රියාකර ඉන් වැළැකීමේ අවස්ථාවක් තිබුණේ යැයි සිතමු. එය කියවූ ළමයාගේ සිතේ එය තැන්පත්ව පවතී. එම ළමයාට සත්‍ය ජීවිතයේ දී යම් අවස්ථාවක යම් පුද්ගලයෙකුගේ අපයෝජනයක් හෝ හිංසනයක් සිදුවීමට ආසන්න මොහොතක දී පෙර කියවිමෙන් ලද එසේ මනසේ තැන්පත් වු දැනුම හා ඥානය වහා ක්‍රියාත්මක වී ඉන් වැළකිමට අවස්ථාව උදාකර දෙනු ඇත.

වර්තමානයේ අපගේ ළමා පරපුරට පවතින ප්‍රධානතම ව්‍යසනය වන්නේ 'ළමා අපයෝජනවලට ගොදුරු වීමයි'. ශ්‍රී ලංකාවේ සිව් දෙසින් දෛනිකව වාර්තා වන අපරාධ දෙස පරීක්ෂාකාරි වීමේ දී 'ළමයින් අපයෝජනයන්ට ගොදුරු වීම' ඉහළ අගයක් ගන්නා අතර වාර්ෂිකව එම තත්ත්වයේ අඩුවීමක් ද දක්නට නොමැත. පසුගිය වසර කිහිපයක ළමා අපයෝජන පිළිබඳ සංඛ්‍යා දත්ත පරික්ෂාවකින් මේ බව මනාව අවබෝධ කරගත හැකිය.

ලංකාවේ සුලභව වාර්තා වන ළමා අපයෝජන වන්නේ ළමයින් දූෂණයට ලක්කිරීම, ළමයින් හට ලිංගික අතවර කිරිම, ළමයින් බරපතළ ලිංගික අපයෝජනයට ගොදුරු කර ගැනීම, නිත්‍යානුකූල භාරකරත්වයෙන් අපහරණය හා පහරදීම් හා තුවාල සිදුකිරිම් යනා දියයි. පසුගිය

වසර 05ක මෙම අපරාධ වාර්තාවීම පහත පරිදි වේ.

| | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| ස්ත්‍රී දූෂණය | 1651 | 1582 | 1599 | 1374 | 1384 |
| ලිංගික අතවර | 1250 | 1488 | 1361 | 1225 | 1332 |
| බරපතල ලිංගික අපයෝජනය | 728 | 749 | 614 | 525 | 670 |
| නීත්‍යානුකූල භාරකාරත්වයෙන් අපහරණය | 731 | 809 | 812 | 741 | 819 |
| පහරදීම | 483 | 464 | 538 | 537 | 565 |

මෙම සංඛ්‍යා දත්ත මගින් මෙරට ළමා පරපුර කෙතරම් දුරට අපයෝජනවලට සහ හිංසන වලට ගොදුරු වන්නේද යන්න පැහැදිලි වේ. එසේ නම් එළඹෙන වසරේ මේ තත්ත්වය අවම කර ගැනීමට නිසි පියවරයන් ගතයුතු වේ. එහිදී ප්‍රධාන වශයෙන් සිදුකළ යුතු වන්නේ වරදට ගොදුරු වන ළමයා දැනුමින් පොහොසත් කර ඉන් මිදීමට අවශ්‍ය ඉව සහ ශක්තිය ලබා දීමයි. ඒ සඳහා දැනුම සහ අවබෝධය ලබාගත හැකි ආකාර ද රාශියකි. එනම්; යමකු විසින් ලබාදෙන උපදෙස් අනුගමනය කිරිම, දැනුවත් කිරීමේ දේශනවලට සවන් දිම, පොතපත කියවා ලබාගත් දැනුම ප්‍රයෝජනයට ගැනීම යනාදිය වේ. මහා බැංකු වාර්තාවලට අනුව 2017 වසර තුළ ශ්‍රී ලංකාවේ සාක්ෂරතාව 92.6% වේ. එනම් මෙරට ජනයා අතර ඉතා ඉහළ දැනුමක් පොතපත පරිශීලනයක් පවතින බව මින් ගම්‍යමාන වේ.

එසේ නම් ළමා පරපුර ද, වීර කථා, ළමා කතා ආදියට පමණක් සීමා නොවී විවිධ තේමාවන් යටතේ ඉදිරිපත්ව ඇති පොත්පත්, පත්තර කියවීමට හුරුවිම ඉතා වැදගත්ය. මන්දයත් ඒ ඔස්සේ දැනුමට එකතුවන කරුණු මගින් දිනෙක තමන්ට මුහුණුදීමට සිදුවන අපයෝජනයකින් වැළකි සිටීමට දරුවාට හැකිවනු ඇත. ඇතැම් කතා පොත් ඇතුවා පමණක් නොව, සෘජුව ''ළමා අපයෝජනවලින් වළකිමු '' වැනි මාතෘකා ඔස්සේ ලියැවුණු පොත්පත් සේ ම ළමා හා වැඩිහිටි පුවත්පත්වල එවැනි මාතෘකා ඔස්සේ පළවන ලිපි ද තිබේ. එවැනි දෑ මගින් ලබා ගන්නා දැනුම සැම ළමයකුටම මොන යම් හෝ අවස්ථාවක දී ප්‍රයෝජනයට ගත හැකිවනු ඇත. ලංකාවේ දරුවන් අතර අතිමහත් බහුතරය පාසල් අධ්‍යාපනය ලබන්නෝ වෙති. 2018 මහ බැංකු වාර්තාවට අනුව රජයේ පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව මිලියන 4.2 වන අතර ජාත්‍යන්තර පාසල් හැර අනිකුත් පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව 199 දහසක් වේ. මෙම ළමයින් අතරින් යම් පිරිසක් දෛනිකව අපයෝජනයට ගොදුරු වීම සිදුවේ. ළමයින් පොත්, පත්තර කියවා ලබා ගන්නා දැනුම නිසිපරිදි ක්‍රියාවේ යොදවන්නේ නම් මෙලෙස අපයෝජනයට ලක්වන ප්‍රතිශතය අවම කර ගැනිමට හැකිවනු ඇත.

අපයෝජන තැතෙන් මිදිමට නිර්මාණශිලි චින්තනය අවශ්‍ය වේ. වර්තමානයේ ආදර සම්බන්ධතාවක් පටන් ගන්නා ළමයෙකුට යම් ලෙසකින් එහි නොගැළපීම අවබෝධ වු විට දී ඉන් මිදීමට මේ නිර්මාණශීලි චින්තනමය උපක්‍රමය පිහිට වේ. එකවරම තම අකමැත්ත ප්‍රකාශ කළ විට ඊනියා පෙම්වතා මෙම ගැහැණු ළමයාට හානියක් කළ හැකිය. මේ සඳහා අවශ්‍ය චින්තන කුසලතාව ලබා ගැනීමේ ප්‍රධාන සාධකය වන්නේ පොත්පත්, පත්තර කියවා ගබඩා කරගත් දැනුමය.

සමාජයේ විවිධ මත අදහස් දරන විවිධ තරාතිරම්වල පුද්ගලයෝ වෙසෙති. ඔවුන් සමඟ සමාජ ජීවිතය ගෙවිමේ දී සූක්ෂම විය යුතුය. තම ආකල්පවලට ගැළපෙන හොඳ සහ නරක දෙක අවබෝධ කර ගනිමින් ජීවිත ගෙත්තම් කරගත හැකි ළමයාට ලෝකය දිනීය හැකිය. මේ සඳහා සමාජ අවබෝධය තිබිය යුතුවා පමණක් නොව රටේ පවතින නීතිමය තත්ත්වය ගැන

ද අවබෝධයක් තිබිය යුතුය. මේවා පාසල් විෂය මාලාව තුළ එය නොතිබිය හැකිය. එය තම ස්වයං ප්‍රයත්තය මගින් ලබාගත යුක්තකි. ඒ සඳහා වැඩිහිටියන්ගේ, ගුරුවරුන්ගේ ගුරුහරුකම්, ඔවදන් සේම කියවීම මගින් ලබන ස්වයං අධ්‍යයනය ද වැදගත් ය. මේ අනුව බලන කළ පොත පත පරිශිලනය කිරිම මගින් ළමයින් හට අපයෝජන හිංසාවලින් ආරක්ෂා වීමට මෙන්ම සිය අනාගත ප්‍රතිරූපය යහපත්ව රෝපණය කර ගැනිමට හැකියාව ලැබේ. එසේ හෙයින් බාල අවධියේ සිටිම පොත් පත්, පත්තර, ලිපි, කියවීමට ළමයා හුරුකරවීම, ප්‍රධාන විනෝදාංශය බවට පත් කිරීම ළමයාට පමණක් නොව ළමයාගෙන් හෙට තැනෙන රටේ අනාගතයට ද වඩාත් විපුල ප්‍රයෝජන උදාකෙරෙනු ඇත.

# දරුවන්ට කියවීම හුරු කරමු

- සුමේධා නවරත්න*

"ඔන්න එකෝමත් එක කාලෙක රජ්ජුරුවෝ කෙනෙක් හිටියා. මේ රජ්ජුරුවන්ට හිටියා දූ කුමාරියො හත් දෙනෙක්. බාලම දූ මුතු කුමාරියක්. එයා ඇඬුවත්, සිනාසුණත්, කතා කළත් ඇස් දෙකෙන්, කටෙන් මුතු හැලුණා. මුළු රටේම මිනිස්සු ඇයට හුඟාක් ආදරය කළා."

මුතු කුමාරිය පිළිබඳ මේ කතාන්දරය ඇසූ වාර ගණන මෙතෙකැයි කිව නොහැකිය. එහෙත් අදටත් මේ කතන්දරය මා කුඩා කල ඇසූ රසවත්ම කතාව බව කිව යුතුය. එවැනි මුතු කුමාරියක් වෙන්නට ඇත්නම් කෙතරම් අගේ දැයි සිතුණ වාරද අඩුම තරමේ ඇය දකින්නට හෝ ඇත්නම් අපූරු යැයි සිතුණ වාරද බොහෝය. මුතුකුමාරියන්, නිදි කුමාරියන්, අඟුටුමිට්ටන් ගැන චිත්ත රූප මවමින් අපි නින්දට වැටුණෙමු. අම්මා කියා දුන් කතන්දර, තාත්තා ගෙනත් දුන් පොත් කියවන්නට ලබා දුන් උත්තේජනයක්ම විය. කොළඹ පසුකරන් එන හැම වාරයකම ගුණසේන පොත් සාප්පුවෙන් පොත් මිටියක් ගෙන එන්නට තාත්තා අමතක නොකළේය. ඔහු ගෙනත් දුන් පොත් අතරින් මගේ මතකයේ තදින්ම රැඳුණ පොත වූයේ රුසියානු පරිවර්තනයක් වූ "වී කරල" නම් වූ ළමා කතන්දර පොතය. එම පොතේ පිටුවලින් වහනය වූ සුවඳ මගේ හදවත නිවා සුවපත් කළ අතර, එහි වූ අපූරු චිත්‍රද, ඒ චිත්‍ර හැඩ ගැන්වූ මනස නිවන වර්ණද මගේ සිතට ගෙන දුන්නේ මිහිරියාවකි.

මේ පොත කියවූ පසු ගෙදර වැඩපළට අම්මාට තව ටිකක් උදව් කළා නම් හොඳ යැයි කුඩා මට සිතිණි. ඉන් නොනැවතී විවිධ ඇට වර්ග වත්ත පුරා සිටුවීමටද, ඉන් පල නෙළා ගැනීමටද මට මහත් ආශාවක් ඇති විය. තවද විවේකීව සිටින අවස්ථාවල, වී කරලේ චිත්‍ර, මගේ චිත්‍ර පොතේ පිටු අතරේ ඇඳෙන්නට විය. කණ්ඩායමක් තුළ වැඩ කොටස් බෙදා හදා ගත යුතු බවද, නිකමුන්ට බඩගින්නේ සිටින්නට සිදුවන බවද, එවැන්නන්ට අනෙකාගෙන් යැපෙන්නට අයිතියක් නැති බවද මුල්ම වරට ඉගැන්නුවේ "වී කරල" යැයි මට අද ද සිතේ. අම්මාගේ කතන්දර කීම, මා පොත් කියවන්නියක කිරීමෙන් පමණක් නොනැවතුණ බව නම් මට සහතිකය. එබැවින් දරුවන්ට පොත් කියවන්නට යැයි බලපෑම් කරන්නට පෙර, ඊට උත්තේජක සැපයීම මවුපියන්ගේ සහ වැඩිහිටියන්ගේ යුතුකමය; වගකීමය.

පොත් ප්‍රදර්ශන කෙතරම් පැවැත්වුවද අපේ දරුවන්, ගුරුවරුන් මෙන්ම වැඩිහිටියන්ද කියවන ප්‍රමාණය ගැන සෑහීමකට පත්වීමට අසීරුය. මීට අවුරුදු නවයකට පෙර දිනෙක මහාචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු මහතා කියවීම ගැන මා සමඟ කළ කතාවක් මෙවේලෙහි මගේ සිහියට නැගේ. ඒ වසරේදී විශ්වවිද්‍යාලයට අලුතෙන් ආ සිසුන්ගෙන් එතුමා ගැටලුවක් නැගුවේය. ඒ මෙලෙසය.

* ජනමාධ්‍යවේදිනී / මනෝ උපදේශිකා

"නවකතා පොත් පහක් කියවලා තියන අය අත උස්සන්න."

අත් දහයක් පහළොවක් උඩට ඉස්සිණි. එතුමා නැවත එම ප්‍රශ්නයම නැගීය. වෙනසක් සිදු නොවුණ තැන එතුමාගේ ගැටලුවේ සැර බාල විය.

"හොඳයි... පොත් තුනක් කියවපු අය අත උස්සන්න." යන්තමින් තව අත් කීපයක් ඉහළට එසවිණි. ඔවුන් කියවූ පොත් අතළොස්ස අතර වූයේ විෂය නිර්දේශයට අයිති පොත්ය.

සාක්ෂරතාව කොතරම් ඉහළ වුවත් රටක දියුණුවක් නැතිවීමට මෙයද ප්‍රධාන හේතුවක් බව නොකියා බැරිය. එනම්, පොත් කියවන්නට අකමැති ජාතියක්, නිර්මාණශීලිව හිතන්නට පොහොසත් ජාතියක් වෙන්නේ නැත. දරුවන් සමඟ සමීපව කටයුතු කරන කෙනකු විදියට මට දැනෙන්නේ මීට අවුරුදු දහයකට පෙර, මහාචාර්ය පල්ලියගුරු මහතා ඇසූ ප්‍රශ්නය වර්තමාන විශ්වවිද්‍යාල දරුවන්ගෙන් ඇසුවහොත් එදාට වඩා සතුටුදායක පිළිතුරක් නොලැබෙන බවය. මන්දයත්; එදාට වඩා අද දරුවන් විභාග කේන්ද්‍ර අධ්‍යාපනයේ ගොදුරු බවට පත්ව ඇති බැවිනි. එබැවින් කියවීමට දරුවන් යොමු කර ගන්නේ කෙසේද යන්න ගැන අවධානය යොමු කිරීම ඉතා වැදගත්ය.

සුප්‍රසිද්ධ දෙස් විදෙස් ලේඛකයන් සිය කියවීම ආරම්භ කර ඇත්තේ කෙසේද යන්න ගැන විවිධ අවස්ථාවල ලියා ඇත. ඒ හැම අවස්ථාවකම ඊට පිටුපසින් සිටින්නේ මිත්තණිය, මව, ගුරුවරයා වැනි කෙනෙකි. සුප්‍රසිද්ධ රුසියානු ලේඛකයන් වෙන මැක්සිම් ගෝර්කි මෙන්ම ලියෝ තෝල්ස්තෝයි වැනි අය පිටුපස සිටින්නේද එවැනි අයය. ගෝර්කිගේ ජීවිතය පිටුපස සිටින්නේම ඔහුගේ මිත්තණියයි. ඇය ගෝර්කිට කතා සාගරයක් වූ අතර, ජීවිතයට මිණි පහනක්ම වූයේය. වරක් ගෝර්කි සිය මිත්තණිය සහ මුත්තණුවන් සමඟ කැලෑවේ ඇවිදින්නට ගියේය. එහිදීද ඇය ඔහුට අපූරු කතන්දර කීවාය. එක් කතාවක් මෙසේය;

දෙවියන් වහන්සේ ජල ගැල්මෙන් ලෝකය විනාශ කර, නෝවාගේ පවුල පමණක් ආරක්ෂා කළහ. එහිදී දේව මෑණියන් සියලු ගස්වල බීජ වර්ග එකතු කර ගත් බවත් ලෝක විනාශයෙන් පසු ඒවා නැවත පැළ කළ බවත් කැලෑව මැද්දෙන් යන අතර ඇය ගෝර්කිට කීවාය. මිත්තණියගේ කතාව ගෝර්කිගේ සිත් ගත්තද එය පිළිගන්න හෙතෙම සූදානම් නොවීය. ඔහු මෙසේ ප්‍රශ්න නැගුවේය.

"ඇත්තටම එහෙමද? ජල ගැල්මෙන් ලෝකය විනාශ වෙලා බොහෝ කාලයකට පසුවයි දේව මෑණියෝ උපන්නේ."

මේ සංවාදය අවසානයේ ගෝර්කිගේ තර්ක කිරීම් හා පැහැදිලි කිරීම් අනුව මිත්තණිය සිය පරාජය පිළිගත්තාය. සිය කතාවලින් බුද්ධිමත් ලෙස සිතන දරුවකු බිහි කරන්නට ආච්චි දැනුවත්ව හා නොදැනුවත්ව සම්මාදන් වූයේ එලෙසය. ගෝර්කි පොත් කියවන සැටි දුටු මිත්තණිය ඔහු දිරිමත් කළේහ. ඔහුට ජීවිතය දුන්නාය. තවමත් ඔබ කියවා නොමැති නම් මක්සිම් ගෝර්කිගේ ජීවිත කතාව කියවා බලන මෙන් මේ ලිපිය කියවන පාඨකයන්ට ඇරයුම් කරමි. දරුවාට කියවීම හුරු කිරීම ඇරුණු විට තව බොහෝ දේ කතන්දර, කවි කීම ඇතුළත දරුවාට ලැබෙන බව ඔබට වටහා ගැනීමට හැකිවෙනු ඇත.

ලියෝ තොල්ස්තෝයිගේ ජීවිත කතාව කියවන විටද ඔහුගේ ජීවිතයට කියවීම හුරු වූ ආකාරය ගැන ඉඟි සොයාගත හැකිය. තෝල්ස්තෝයිගේ කියවීමේ හුරුවට ඔහුගේ ගුරුවරයා මෙන්ම පියාද බලපෑ බවට සාක්ෂ්‍ය එහි ඕනෑ තරම් ඇත. තෝල්ස්තෝයි "ළදරු විය" නැමැති ඔහුගේ ස්වයං චරිත කතාවේ පළමු පරිච්ඡේදය ආරම්භ කරන්නේ සිය ගුරුවරයාගෙන්ය. කාල් ඉවානිච් නැමැති සිය ගුරුවරයා පොත් කියවන ආකාරය ගැන ඔහු පවසන්නේ මෙලෙසිනි.

"උපැස් යුවළ නාසය මත රඳවාගත් කාල් ඉවානිච් තම හුරු පුරුදු ස්ථානයේ දොර හා

ජනේලය අතර ඉඳගෙන උන්නේය. ඔහුගේ එක් අතක පොතක් විය. දොරට වම් පසින් පොත් රාක්ක දෙකකි. එකක් අපේ ළමයින්ගේය. අනෙක කාල් ඉවානිච්ගේ පෞද්ගලික වස්තුවකි. අපේ රාක්කය පාසල් පොත් හා වෙනත් නොයෙකුත් පොත් වර්ගවලින් පිරී තිබිණි."

අපේ ගුරුවරුන්ගෙන් කීයෙන් කී දෙනකුට කාල් ඉවානිච්ගෙන් මෙන් පෞද්ගලික වස්තුවක් තිබේදැයි මම නොදනිමි. දරුවන්ට පොත් කියවන්නට හුරු කිරීමට මෙන්ම ජීවිතය දීමටද හැකිවෙන්නේ එවැනි ගුරුවරුන්ට පමණක් යැයි මම දනිමි. මට මෙවේලෙහි සිහිවෙන්නේ ජී. බී. සේනානායක මහතාය. ඔහුද පොත් කියවන්නට හුරු වූයේ සිය ගුරුවරයා නිසාය. ආනන්ද විද්‍යාලයේ පස්වැනි පන්තියේ ඉගෙනුම ලබන විට ඔහුගේ චිත්‍ර ගුරුවරයා වූයේ ගුප්තා නැමැති ඉන්දියානු ජාතික චිත්‍රකර්ම ගුරුතුමාය. පන්තියට එන සෑම මොහොතකම ඔහු අත පොතක් තිබුණ අතර, ජී. බී. සේනානායකයන් බටහිර සාහිත්‍යය දෙසට යොමු කර තිබුණේ ඔහුය. වරක් ඔහු කියවීම, ලිවීම ගැන කළ ප්‍රකාශයක් මෙහි සටහන් කිරීමට කැමැත්තෙමි.

"මැක්සිම් ගෝර්කි නැමැති සාමාන්‍ය උගත්කමක් නොලැබූ රුසියන් ලේඛකයා මෙන් මමද අධ්‍යයන පිපාසයෙන් පෙළුණෙමි. මම කිසිවකුට උගත්කමෙන් දෙවැනි වන්නේ නැහැ යන අධිෂ්ඨානය මා තුළ විය. මේ අධිෂ්ඨානයෙන් මම දිවා රෑ පොත් කියැවීමි. පොත් කියැවීම හා ලිවීම පිළිබඳ වැඩ දවසින් දවස කල් නොදමන ලෙස මම බාල පරම්පරාවෙන් ඉල්ලා සිටිමි".

ජී. බී. ගේ අතුරු කතාවට පසු නැවත තෝල්ස්තෝයි ගැන යමක් ලිවිය යුතුය. සැබැවින්ම මේ කතාව තෝල්ස්තෝයිගේ පියා ගැනය. "තාත්තාගේ වගතුග" පරිච්ඡේදයේ මෙවැනි සටහනක් වෙයි.

"...පොතක් කියවන විට කනගාටුදායක පරිච්ඡේදයකදී ඔහුගේ කටහඬ වෙවුලන්ඩ වෙයි. කඳුළු ගලා එයි. පොත බිම වැටෙයි."

ඊළඟ ඡේදයේ ඔහු මෙවැන්නක් ලියයි.

"...එහෙත් තිල් හාවකු අඳින්නට මට හැකියැයි විශ්වාසයක් නොතිබූ හෙයින් මම තාත්තා සොයන්නට පුස්තකාලයට දිව්වෙමි. තාත්තා පොතක් කියවමින් සිටියේ, හිස නොඔසවාම මගේ පැනයට පිළිතුරු දුන්නේය."

මේ වාක්‍ය කීපය අපේ කියවීම ගැන බොහෝ දේ මෙනෙහි කිරීමට අප පොලඹවන බව මගේ විශ්වාසයය.

ශ්‍රී ලංකාවේ පාඨකයන් අතර, ඉමහත් ජනප්‍රියත්වයට පත්වූ කොලරා කාලේ ආලේ සහ සිය වසරක හුදෙකලාව වැනි කෘතිවල ලේඛකයා වූ ගර්සියා මාකේස්ගේ ජීවිතයට මෙන්ම කියවීමට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේද ඔහුගේ සීයා සහ මිත්තණියය. මාර්කේස් පවසන පරිදි ඔවුහු අරුම පුදුම ජීවිහු වූහ. මිථ්‍යා විශ්වාස සමඟ මුසු වූ මනා පරිකල්පන ශක්තියක් ඇති ඔහුගේ මිත්තණිය ගබ්රියෙල්ගේ ඇඟ ලොමුදැහැ ගැන්වෙන කතා ඔහුට කීවාය. මාර්කේස්ගේ මේ ඉන්ද්‍රජාලික යථාර්ථවාදී නැඹුරුවට හේතුව ඔහුගේ මිත්තණියගේ මුල්කාලීන ආභාසය යැයි මතයක්ද පවතී. මිත්තණියගේ කතන්දරවලින් උත්තේජනය ලැබූ මාර්කේස් කියවන්නට මහත් රුචියක් දැක්වූ අතර, පාසලේදී ඔහු වැඩි කාලයක් වෙන් කළේ කියවීමට හා අසා සිටීමටය. සිය විශ්වවිද්‍යාල කාලයේදී ලේඛනය ආරම්භ කළ ඔහු නොබෙල් ත්‍යාගයෙන්ද පිදුම් ලැබුවේය.

දරුවන් කියවීමට හුරු කරන ප්‍රධාන මාර්ගයක් ලෙස කතන්දර කීමේ කලාව හඳුන්වා දෙන්නට මම කැමැත්තෙමි. එය එසේ හඳුන්වා දෙන්නේ බොහෝ ලේඛකයන් ඒ ගැන සාක්ෂ්‍ය දරා ඇති නිසාය. මෙරට ප්‍රවීණ ලේඛකයකු වූ දයාසේන ගුණසිංහ මහතා සිය "කැනල් පාරේ නිශාචරයෝ" නම් වූ කෘතියට "සිංහලයේ කතා කලාව" යන මැයෙන් පෙරවදනක් ලියමින් මෙවැනි සටහනක් තබා ඇත.

"දිවියෙහි පළමු වරට මා කතාවක් ඇසුවේ මගේ මවගෙන් හෝ මිත්තණියගෙනැයි මම සිතමි. එවක මවුවරුන් හා මිත්තණියන් තම දරු මුණුපුරන්ට බොහෝ විට කියා දුන්නේ බණ කතා, ඉතිහාස කතා හෝ ජන කතාය. ඒ ඒ මවගේ හෝ මිත්තණියගේ ප්‍රතිභා ශක්තියෙහි, සංවේදීභාවයෙහි සහ බස් වහරෙහි නිපුණත්වය ආදී වූ විවිධ සාධක අනුව එම කතාවල රසවත් බව අඩු වැඩි විය."

මවගෙන් හා මිත්තණියගෙන් කතා ඇසූ ගුණසිංහයන් සිය මිත්තණියගේ ප්‍රතිභා ශක්තිය ගැන ලියා තිබුණේ මෙලෙසය.

"මගේ මවටත් වඩා මගේ මිත්තණිය ඉතා ශූර ලෙස කතා කියන්නියක බැව් මට මතකය. ඈ යෙදූ උපමා උපමේය, යෙදුම් සහ කටවහරින් මටසිළිටි වූ සජීවී ගැමි වදන් දැනුදු මා පිරිවරමින් මගේ උදව්වට සිටී. ස්වර්ණ හංස ජාතකයේ සියලු පියාපත් සිඳදමනු ලැබූ හංසයා උන්දෑට පෙනුණේ ඉඹුල් කිරිබත් ගෙඩියක් ලෙසිනි. සිව් මංසලින් සිව් දෙසකට ගිය සිව්බෑ කුමාරවරුන්ගේ කතාවෙහි එන රාක්ෂයාගේ මුව කොරහක් වැනිය; දත් වහල්ල පුවාලු ඇවරියක් වැනිය."

ඉහත සාක්ෂ්‍ය දෙස බලන විට දරුවන් කියවීමට හුරු කරගන්නේ කෙසේද යන ගැටලුවට මෙන්ම තවත් බොහෝ දේ සම්බන්ධයෙන් පිළිතුරු සොයා ගැනීමට අපට හැකිවෙනු ඇත. එසේ නම් පොත පත කියවන්නේ නැති බවට චෝදනා කරමින් දරුවන්ට ගැරහීමට පෙර, දරුවන් කියවීමට හුරු කිරීම වෙනුවෙන් අපට මඟ හැරුණු දේ නැවත අල්ලා ගන්නේ කෙසේදැයි මෙනෙහි කළ යුතුය. වරක් කියවීමේ කඳවුරක් පවත්වන්නැයි මට ආරාධනා කළේ හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ මාදම්පේ පුස්තකාලයයි. දරුවන් පනස් දෙනකුට ආසන්න පිරිසක් මාදම්පේ පුස්තකාලයට රැස්ව සිටිහ. කඳවුර අවසානයේ ලැබුණු බොහෝ ප්‍රශංසාත්මක ලිපි අතරේ තිබූ එක ලිපියක් මට හොඳින් මතකය.

"මම මගේ අරමුණ වෙනස් කළා. මම කවදාහරි ලේඛකයෙක් වෙනවා." යැයි එක් දරුවෙක් ලියා තිබුණේය. දරුවන්ට කියවීම හුරුකිරීම අපහසු දෙයක් නොවේ. අවශ්‍ය වෙන්නේ එය කරන්නේ කෙසේද යන්න ගැන වැඩිහිටියාට ඇති අවබෝධයය. එමෙන්ම කියවීම අපට බොහෝ දේ ලබා දෙන බව මේ ලිපියේ ඇති කරුණුවලින් ඔප්පු කර ඇති බවද කිව යුතුය. කකුළුවා ඇදට ගොස් පැටියාට කෙළින් යන්න යැයි කීවාට වැඩක් නැත. දරුවාට කියවීම හුරු කළ යුත්තේ වැඩිහිටියන් වෙන අපය. ඒ සම්බන්ධයෙන් ජාතික පුස්තකාලය දරන උත්සාහයට මගේ ප්‍රණාමය හිමි වේ.

# CHILD IN A 'WORDLAND'

- Indeewara de Mel

From time to time Isaac Bashevis Singer posed this question: Who needs literary fiction? Why invent things when nature and life supply so many strange events? He goes on to be elaborate. Aside from our imagination never being able to keep up with the factual and psychological surprises of reality — not even the greatest master's pen can be as consistent and accurate as a factual history that is told in documents or that comes to light during a trial in court.

Singer's opinion finds an audience with the dilemma we face today. In an increasingly technological age, literature seems a too distant term. With myriads of entertainment available for children and adults alike, the question is if there could be any element called children's literature or if such an element could exist.

Such a question calls for a complicated answer. However, the fact remains that the world still needs literature just as much as children. Despite the sophisticated nature of modern technology, the scientists continue to explore how reading encourages the child's brain to work harder, hence a sharpen the intellectual growth.

Children's literature is available in many forms and diverse varieties. The availability in many and diverse ways contribute to the growth of the child in terms of cognition and other aspects. In this backdrop, the educators, parents, and community members are naturally entrusted with a key task. They must work on numerous methods to increase passion for reading among children.

The general agreement on reading is that it sharpens cognitive skills. The cognitive skills alone would not suffice. The children's literature makes young readers more empathetic. Donna Norton identifies the value of literature for young people in her book Through the Eyes of a Child. Children's literature holds water as it offers an opportunity for the students to respond to literature. It trains the child to appreciate their cultural heritage as well as those of others. Children's literature also helps students develop emotional intelligence and creativity. It nurtures the growth and development of the student's personality and social skills and it transmits important literature and themes from one generation to the next.

All this relates to the child's cognitive skills. Literature involves reading and reading

strengthens the cognitive-developmental domain as it encourages deeper thought about literature. Quality literature does not tell the reader everything he/she needs to know; it allows for some difference in opinion. One reader may take something completely different away from the piece of literature than the next reader, based on the two personal viewpoints and experiences. Students can learn to evaluate and analyze literature, as well as summarize and hypothesize about the topic.

Wordless picture books, for instance, can be considered the ideal stimuli for oral and written language. Students reading wordless books like A Ball for Daisy, The Yellow Umbrella or The Red Book will be able to analyze the illustrations and develop their dialogue for the story. This strengthens students' cognitive functions in being able to form opinions on their own and to express themselves through language in summarizing the plot of a wordless book.

Children's literature provides an avenue for students to learn about their cultural heritage and the cultures of other people. Children must learn these values because developing positive attitudes toward one's own culture and the cultures of others are necessary for both social and personal development.

However, when teaching students about the cultural heritage of others, one should be very careful in selecting which books to recommend to young readers. There are many stories, some folktales, which contain blatant stereotypes and inaccuracies about certain cultural groups. This includes books such as Brother Eagle, Sister Sky or The Rough-Face Girl. Both of these stories depict Native Americans in a misguided way and contain misinterpretations of what occurred in history. For example, the Iroquois tribe in The Rough-Face Girl historically lived in longhouses, but the illustrator depicts these Native Americans as living in teepees. This is a clichéd view, and it can be very damaging in perpetuating stereotypes if we as adults are not cautious in the books we have in our classroom and home libraries. However, there are some children's books that are more accurate in teaching the cultural differences of others.

A story called "Eric" from Tales from Outer Suburbia is a touching story about a family who takes in a foreign exchange student and must learn about their guest and accept the differences between their cultures. It has a positive message about encouraging acceptance of the cultural differences between people, which is something that we want to help nurture in our students. Another book that helps discuss culture is Going Home, which is the story of a Mexican immigrant family with the children who were born in the U.S. There is a difference in what "home" is for the parents and the children, and when they take a trip to Mexico, the children realize how important their parent's culture and homeland is for them. Many books are available that depict culture as an important piece of society that is to be treasured and valued, and those books can have great value for students.

Children's literature helps students develop emotional intelligence. Stories have the power to promote emotional and moral development. Children's literature contains numerous moments of crisis when characters make moral decisions and contemplate the reasons for their decisions, an important skill for children to see modelled. Guji Guji, for

example, is a story about a crocodile who is adopted into a family of ducks. Ultimately he must choose between betraying his adopted family and going back to his own "species," and he decides to remain true to his beliefs and not betray his family. The Scar is an effective book to read with students to teach them about responding to grief, as it is about a boy whose mother dies. This requires a complex level of emotional intelligence, as many young children do not understand death. The topic of death would be more appropriate for an older grade level, but it is an important topic to discuss with students. Another book that encourages emotional intelligence is Selma, which discusses what it takes for young sheep to be happy. It is a philosophical story within a picture book and challenges students to think about what happiness is. The Big Box is a story about children who have their freedom taken away by being put into a box and the deeper problems that exist with not being given one's freedom. Children's literature encourages students to think deeper about their feelings.

Children’s literature also encourages creativity. It is the very role that literature plays in nurturing and expanding the imagination. The House in the Night depicts the creativity that a young girl has in her dreams at night, as she flies about the dark neighbourhood on the wings of a bird. The Amazing Pop-up Music Book, Zin! Zin! Zin! A Violin, and Look Closer: Art Masterpieces Through The Ages are imaginative and original books that encourage students to learn about music and art, and they are engaging in their design and interactivity. Children's literature promotes the development of students' internal imaginations.

Children’s literature is of value because it fosters personality and social development. Children are very impressionable during the formative years, and children’s literature can help them develop into caring, intelligent, and friendly people. Developmental psychologist Jean Piaget says that when students move from the pre-operational to the operational stage of cognitive development, they become less egocentric. Whereas students in preschool and kindergarten may be entirely focused on themselves, as students grow older they begin to take into account the feelings and viewpoints of others. Being able to understand other people’s viewpoints and to not be selfish are important skills that adults must nurture in children.

Children's literature can foster social development by encouraging students to accept other people and their differences. Books like And Tango Makes Three, Molly's Family, Heather Has Two Mommies and Daddy's Roommate present situations that might encourage students to become more open-minded to different types of families and understand that love is the most important thing in a family. Children's literature can also encourage students to develop relationships with people, encouraging social contact. An atypical friendship is depicted in Loop the Loop, where a young child and an elderly person become good friends and share the common joy of playing with yo-yos. In A Couple of Boys Have the Best Week Ever, the boys learn to think of the needs of others when they build a diorama for the grandpa who is fascinated with penguins. Literature encourages students to be considerate and friendly people, and these traits may be consistent with

developing students into quality citizens.

Finally, children's literature is of value because it is a timeless tradition, one in which books are the major means of transmitting our literary heritage from one generation to the next. Classic stories like Dr Seuss' And to Think That I Heard it on Mulberry Street and The Cat in the Hat are important books to read to children because of their literary heritage. For a younger audience, children could build their cognitive and language skills through exposure to Mother Goose rhymes. One example of a good collection of these classic rhymes is Hey Diddle Diddle and Other Mother Goose Rhymes Children in older grades can learn to appreciate the classic plays and messages of William Shakespeare in picture books that aim to make the plays more accessible. Many versions of Shakespeare's works are available in abridged and picture book formats, including Romeo and Juliet and The Tempest. Children are only young for a short time, and so we must give them access to a basic literary heritage of timeless books. Quality children's literature has a great power to captivate audiences for many generations.

Children's literature is extremely valuable in both the school setting and at home. Teachers and parents should both be able to differentiate between quality and mediocre literature, to give students access to the best books to encourage these important values of literature and considering developmental domains. Children's literature is valuable in providing an opportunity to respond to literature, as well as cultural knowledge, emotional intelligence and creativity, social and personality development, and literary history to students across generations. Exposing children to quality literature can contribute to the creation of responsible, successful, and caring individuals.

# කියවන සමාජයක ඇරඹුම ළමයාගෙන් පටන් ගනිමු

- ආචාර්ය පූජ්‍ය ඔලගන්වත්තේ චන්ද්‍රසිරි හිමි*

## හැඳින්වීම

ළමයින්ගේ කියැවීමේ පුරුද්ද අධ්‍යාපනඥයන්ට, දෙමව්පියන්ට, ගුරුවරුන්ට, පුස්තකාලයාධිපතිවරුන්ට හා ප්‍රතිපත්ති සම්පාදයකයන්ට ද ඉතා වටිනා කාරණාවකි. නූතන තාක්ෂණය ද ශිෂ්‍යයන්ගේ කියැවීමේ පුරුද්ද අඩු කිරීම සඳහා බල පා තිබේ. සිංගප්පූරුවේ ළමයින්ගේ කියැවීමේ පුරුද්ද අඩු මට්ටමක පවතී. (Shaeen majeed ; 2007) ජාත්‍යන්තර වශයෙන් එක්සත් රාජධානියේ කරන ලද පර්යේෂණයන්ට අනුව වැඩි ප්‍රතිශතයක් ශිෂ්‍යයන් කියැවීම සිදු කරනුයේ විනෝදාංශයක් වශයෙනි. නමුත් දියුණුවෙමින් පවතින රටවල් 12ක සිදු කළ පර්යේෂණයකින් පෙන්වා දෙන්නේ ළමයින් කියවන්නේ විභාග සමත් වීම සඳහා පමණි. ( Book Aid international . 2003 ) ළමයින්ගේ විභාග කටයුතු සඳහා පමණක් කියැවීම එක්තරා ආකාරයක මානසික ආතතිය දනවන්නකි. නියමිත විෂය ග්‍රන්ථයන්ට අමතරව ප්‍රබන්ධ කතා හා ආශ්‍රිත දෑ කියැවීමට හුරු කිරීම ඉතා වටී. දිගු කාලීන කියැවීමේ පුරුද්දක් ඇති කර ගැනීම සඳහා කුඩා අවධියේ සිට ම අවශ්‍ය පදනම සකස් කර ගත යුතු යි. විවේක කාලය තුළ විනෝදාස්වාදය (Fun Reading) ලෙස කියැවීමට පුරුදු කිරීම ඉතා වටිනා වේ. ( Shaeen Majeed ; 2007) මේ ලිපියෙහි පරමාර්ථය වනුයේ බෞද්ධාගමික ක්‍රමය තුළ පුද්ගලයා හඳුනාගෙන බුදු දහමට සම්බන්ධ දෑ කියැවීමට අවශ්‍ය මග පෙන්වා දීමයි. විභාග සමත් වීම සඳහා නොව පුද්ගල දැනුම, ආකල්ප, කුසලතා වැඩි දියුණු වන ලෙස කියැවීම ඇති කිරීම වටී. ඒ සඳහා අධ්‍යාපන දාර්ශනික කාරණාවන් කෙරෙහි ද අවධානය යොමු කර ඇත.

## අධ්‍යාපනය හා ළමයා

ළමයා යනු කවරෙක්දැයි පැහැදිලිව තේරුම් ගත යුතු යි. ළමා සංවර්ධනයෙහි විවිධ අවධි පිළිබඳව මනෝවිද්‍යාඥයෝ විවිධ අර්ථකථන ඉදිරිපත් කරති. විශේෂයෙන් ම ළදරු, ළමා, නවයොවුන් හා වැඩිහිටි යනුවෙන් අවධි හතරකට පුළුල් ලෙස බෙදා වෙන් කොට ඇත. මෙම අවධීන් ද නැවතත් අතුරු අවධිවලට බෙදා වෙන් කළ අවස්ථා ඇත. ජීන් පියාජේ ළමයාගේ බුද්ධි වර්ධනය සැලකිල්ලට ගෙන අවධි හතරක් දක්වා ඇත. ඉන්ද්‍රිය චාලක (Sensori – motor), පූර්ව ක්‍රියාකාරි (Preconceptual ) සංයුත්ත චින්තන ( Concrete- operation ) හා විධිමත් චින්තනය

* ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය , භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

(Formal operation) යනුවෙනි. ( Matin Brooks – Cognitive Levels Matching- 1983.) ළමා සංවර්ධනය පිළිබදව අධ්‍යයනයේ දී ළමයාගේ ඒ ඒ අවධිවල දී කායික, මානසික චිත්තවේගීය හා සමාජීය යන අංශ හතර පිළිබඳව අවධානය යොමු කළ යුතු යි. මෙම අවධිවලදී දී ළමයාගේ මානසික දියුණුව ඇති කිරීම සඳහා කටයුතු කිරීම වැඩිහිටි පිරිසගේ වගකීමක් වේ. වර්ධන ක්‍රියාවලියේ ප්‍රකට අංශයක් වනුයේ කායික සංවර්ධනයයි. මව්කුස පිළිසිඳ ගෙන උපත ලබා ක්‍රමයෙන් වැඩිහිටියකු වන තෙක් ශාරීරික වර්ධනය සිදු වෙයි. කායික වශයෙන් ඇතිවෙන සංවර්ධනය පුද්ගලයාගේ මානසික සංවර්ධනයට ද බලපායි. බාහිර පරිසරය තුළ සිටින සතුන් හා අනෙකුත් භාණ්ඩ සමග ළමා මනස තුළ සංකල්ප ගොඩ නැගේ. මිනිසාගේ ජීවිතයේ ආදරය, කරුණාව, සතුට, ප්‍රීතිය, බිය මෙන් ම තරහව කෝපය ද කණගාටුව ආදිය ද චිත්තවේග ලෙස හැඳින්විය හැකි ය. මෙම චිත්තවේග හඳුනාගෙන ළමා මනස වෙනස් කරන ආකාරයට කියැවීමේ පුරුද්ද ගොඩ නැගිය යුතු යි. යම් චිත්තවේගයක් ඇති වූ විට එය පාලනය කර ගන්නා ක්‍රමවේදය ළමයා දැනගෙන සිටීම විශේෂයෙන් අවශ්‍ය ම කාරණාවකි. ( හෙට්ටිආරච්චි -2003)

බොහෝ දෙමව්පියන්ගේ ප්‍රධාන පරමාර්ථය වන්නේ තම ළමයාට හොඳ අධ්‍යාපනයක් ලබා දී ඉහළ රැකියාවක් ලබා ගැනීමට උදව් කිරීමයි. නමුත් අධ්‍යාපනයෙහි රැකියාව යන කාරණාවට වඩා පුළුල් අර්ථයක් ඇත. අධ්‍යාපනය යන්නට ඉංග්‍රීසියෙන් Education යන වදන භාවිත වේ. Educate යන ඉංග්‍රීසි වචනයෙන් අදහස් කරන්නේ ඇතුළාන්තය සංවර්ධනය කිරීමයි. (අතුකෝරාළ - 2004 ) සමහරෙකු අධ්‍යාපනයෙන් අපේක්ෂිත මුඛ්‍ය පරමාර්ථය ලෙස සලකන්නේ පොතපතේ දැනුම ලබා දීම යි. නමුත් දැනුම සාපේක්ෂය. තම තමන් රුචි කරන විෂය පථය මත මෙය වෙනස් වේ. ඇතැමෙක් නාට්‍ය, කලා ආදී විෂයයන්ට දක්ෂය. තවකෙක් විද්‍යා, තාක්ෂණාදි විෂයයන්ට දක්ෂ ය. කුමන අධ්‍යාපනයක් ලැබුවත් තමන්ගේ ජීවන ගැටලු විසඳා ගැනීමට යමෙකු අපොහොසත් වුවහොත් ලබාගත් අධ්‍යාපනයෙන් කවර නම් ප්‍රයෝජනයක් ද? බොහෝවිට ඔහුගේ හෝ ඇයගේ ජීවිතය ඛේදාන්තයකින් අවසන් වේ. ( Michael Fielding ; 2000) එබැවින් අධ්‍යාපනයේ සමස්තාර්ථය විය යුත්තේ පූර්ණ පෞරුෂයකින් යුත් පුද්ගලයෙකු බිහිකිරීමයි. ඒ සඳහා යහපත් කියැවීමක් අත්‍යවශ්‍ය යි. මේ හේතුවෙන් අධ්‍යාපනය යනු දහසක් සමාජ ප්‍රශ්න, අභියෝග හමුවේ නොසැලී, නොගැටී සිට ඒවාට මුහුණ දීමට ඇති පෞරුෂයයි. ක්‍රිෂ්ණ මූර්තිගේ අදහසට මෙහිලා අවධානය යොමු කළ යුතු යි. ඔහු පෙන්වා දෙන්නේ අධ්‍යාපනය යනු පොත්පත්වලින් ඉගෙනුම හෝ යම්කිසි කරුණු කටපාඩම් කිරීම හෝ පමණක් නොවන බවයි. පොත්පත්වලින් කියවෙන දේ සත්‍ය ද අසත්‍ය දැයි බැලීමත්, ඊට සවන් දීමත් අධ්‍යාපනය වේ. අධ්‍යාපනය හුදෙක් විභාගයකින් සමත් වීම පමණක් නොවේ. උපාධියක් හෝ රැකියාවක් ලැබීම පමණක් නොවේ. ආවාහ විවාහ වී තැන්පත් වීම පමණක් නොවේ. කුරුල්ලන්ට සවන් දෙන්නට, අහස දෙස බලන්නට, ගසක අසිරි දකින්නට, කන්දක හැඩය නරඹන්නට, ඒවා හා එක්ව හැඟීම් ඇතිකර ගන්නට, ඇත්තටම ඒවා සමග එක එල්ලේම සම්බන්ධතා ඇති කරගන්නට හැකිවීම ද අධ්‍යාපනයයි. (හෙට්ටිආරච්චි 2004) ප්‍රංශ ජාතික ජේ.ජේ. රූසෝ ප්‍රකාශ කරන්නේ අධ්‍යාපනය ලැබීමට නම් ස්වභාව ධර්මය, ද්‍රව්‍යයන් සහ මිනිසුන් යන ප්‍රධාන කාරක තුන සම්පූර්ණ විය යුතු බවයි. එතුමා තවදුරටත් අධ්‍යාපනයෙහි ප්‍රමුඛ පරමාර්ථය මෙලෙස විශද කරයි. නිවැරදිම අධ්‍යාපනය යනු ස්වභාව ධර්මයට එකඟව ජීවත්වීමට පුහුණු කරවීමයි. ස්වාභාවික මිනිසෙකු ස්වභාව ධර්මයට එකඟව ජීවත් වීම අධ්‍යාපනයේ මූලික පරමාර්ථය විය යුතුය. ඒ අනුව අධ්‍යාපනයෙන් අපේක්ෂිත අරමුණ වන්නේ පුද්ගලයාගේ හිස, හදවත, අත යන අංශවල යහපත් සංවර්ධනයයි. ඒ සඳහා විවිධ විෂය කියැවීම ඥානය පුළුල් කිරීමට හේතු වන්නකි.

# දහමට අනුව පුද්ගලයා හඳුනා ගැනීම

බුදුන් වහන්සේගේ අධ්‍යාපන ක්‍රමය වනාහි ශිෂ්‍ය කේන්ද්‍රිය අධ්‍යාපනයකි. ශිෂ්‍ය අවශ්‍යතා, රුචිය, දක්ෂතා සැලකිල්ලට ගනිමින් කෙරෙන අධ්‍යාපන ක්‍රමයක් වේ. වැඩිහිටියන් තමන්ගේ අත්දැකීම් බලහත්කාරයෙන් ශිෂ්‍යන්ගේ ජීවිතවලට ඇතුළත් නොකර ළමයාගේ අත්දැකීම් මගින් එය ඉගැන්වීමට සැලැස්වීම ශිෂ්‍ය කේන්ද්‍රිය අධ්‍යාපනයේ එක් මුලධර්මයක් වේ. බුදුන් වහන්සේ මෙම ක්‍රමය යොදාගෙන ඇත. දහම් ගුණ පාඨය දැක්වෙන එහි පස්සික යන්නෙන් පෙන්වා දෙන්නේ ශිෂ්‍යයාට ප්‍රමුඛස්ථානය දීමේ ක්‍රමයයි. ( මජ්ජිම නිකාය ፡ 1 622 පිටුව) කාලාම සූත්‍රයෙන් ද පෙන්නුම් කරන්නේ තමන්ගේ ගුරුවරයා කියූ පමණින්වත් පිළි නොගන්නා ලෙස යි. ( කාලාම සූත්‍රය ) මෙම ක්‍රමය තුළ පැහැදිලි වන්නේ ශිෂ්‍යයාගේ අධ්‍යයන අධ්‍යාපන ක්‍රියාවලිය තුළ ශිෂ්‍යයාට හිමි විය යුතු චින්තනය හා වීමංසනය සම්බන්ධ නිදහසයි. ශිෂ්‍යයාට බලකිරීමෙන් තොරව අවශ්‍යතාවට හා රුචියට ගැළපෙන ආකාරයෙන් කුසලතාවන් වර්ධනය කර ගැනීමට හැකි අයුරින් අධ්‍යාපනය ලබා දිය යුතු යි. ශිෂ්‍යයාට අවශ්‍ය නම් ගුරුවරයා ගැන වුවද පරීක්ෂා කිරීමට අවකාශ තිබෙන බව පෙන්වා දීමෙන් ගුරුවරයාගේ ආධිපත්‍යය, ඒකාධිපති ස්වරූපය බුදුන් විසින් ප්‍රතික්ෂේප කෙරී ඇති බවයි. ( මජ්ජිම නිකාය වීමංසන සූත්‍රය) මෙම න්‍යායික ක්‍රමවේදය උන්වහන්සේ ප්‍රායෝගිකව ද අනුගමනය කළහ. මෙ ක්‍රමයේ ඇති විශේෂත්වය වන්නේ ශිෂ්‍යයා වෙත ගුරුවරයා ගොස් ඔහුගේ විභව ශක්තිය කුළුගන්වා ගැනීමට උපදෙස් දීම හා මග පෙන්වා දීමයි. බුදුන් වහන්සේ අංගුලිමාලගේ විභව ශක්තිය හඳුනාගෙන ඔහුගේ මානසික මට්ටමට ගැළපෙන ආකාරයේ ප්‍රශ්නයක් යොමු කළහ. ( මජ්ජිම නිකායේ අංගුලිමාල සූත්‍රය) මීට අමරතව ඛේමා, නන්ද ආදින්ගේ චරිතයන්ගෙන් ද ඒ බව පෙනේ. අධ්‍යාපනයේ දී පුද්ගල විවිධත්වය සැලකිය යුතු යැයි මූලධර්මයක් ලෙස සැලකේ. බෞද්ධ අධ්‍යාපනයේ අවසාන ඵලය වන්නේ නිවන් මගට යොමු කිරීමයි. සියලු කෙලෙස්වලින් නිදහස් වූ තැනකට පත් කිරීමයි. මේ සඳහා ළමයින්ගේ විවිධත්වය හා මානසික මට්ටම හඳුනාගෙන කියැවීමට අවශ්‍ය දෑ සකස් කර දිය යුතු යි. ගුරුවරයා ශිෂ්‍යයාගේ බුද්ධි මට්ටම දෙස බැලිය යුතු යි. එරික් ෆ්‍රොම් පෙන්වා දෙන පරිදි මිනිසා තිරිසනාගෙන් වෙන් කරන ප්‍රධාන සාධක දෙකකි

- සහජ ළැදිකම්වලට වහල් නොවී ඒවා පාලනය කර ගැනීම
- දියුණු මොළයක් තිබීම

දියුණු මොළයේ බුද්ධියේ වර්ධනයේ අඩුවැඩිකම් ප්‍රමාණය අනුව අධ්‍යාපනය ලබන පිරිසේ විවිධත්වයක් ඇති වේ. දක්ෂ සිසුවා යමක් ඉක්මනින් තේරුම් ගනී. එහෙත් අදක්ෂ සිසුවාට කෙතරම් ඉගැන්වුව ද ඔහු ඉගෙනීම නොකරයි. කලින් කලට බුද්ධියේ වර්ධනයන් සිදුවන බව ගුරුවරයා මෙන් ම දෙමව්පියන් ද වටහා ගත යුතු යි. බ්ලූම්ගේ අධ්‍යාපන වර්ගීකරණයේ විඥ්ඥාණ ක්ෂේත්‍රයේ විවිධත්වය ලෙස පෙන්වා දෙන්නේ මෙය වේ. බුද්ධඝෝෂ හිමියන්ගේ විසුද්ධ මාර්ග යෙහි බුද්ධියේ අවස්ථා 03 ක් පෙන්වා දෙයි . 01 ජාතිපඤ්ඤා 02 පාරිහාරිය පඤ්ඤා 03 භාවනාමය පඤ්ඤා යනුවෙනි . ( විසුද්ධි මාර්ගය ) මේ ශක්තීන් වෙනස්වන ප්‍රමාණයට ළමයින් ඉගෙන ගන්නා ප්‍රමාණය ද වෙනස් වේ. බුදුන් වහන්සේ සෑම කෙනෙකුම රහතන් වහන්සේ නමක් කරන්නට උත්සහා කළේ නැත. නුවණ මුහුකුරා ගිය අයට පමණක් එය පෙන්වා දෙන ලදී. මාගේ ධර්මය ප්‍රඥාවන්තයින්ට මිස දුෂ්ප්‍රඥයන්ට නොවන්නේ යැයි උන්වහන්සේ දේශනා කළ සේක. ( අංගුත්තර නිකායේ අනුරුද්ධ සූත්‍රය -134 පිටුව) බුදුන් වහන්සේ ශිෂ්‍යයන්ගේ සාධන මට්මට

පරීක්ෂා කර බලා ඒ අනුව මගපෙන්වීම අනුගමනය කළහ. රාහුලෝවාද සූත්‍රයෙන් දැක ගත හැකි වන්නේ රාහුල හිමියන්ගේ ඥාන විමුක්තිය හා සම්බන්ධ විෂයෙහි මුහුකුරා ගොස් තිබූ බව යි. ලෝකයේ පුද්ගලයන් විසින් යමක් වටහා ගන්නා ආකාරය බුද්ධිමට්ටම් හතරකින් යුක්ත බව මහා වග්ග පාලියේ මහාඛන්ධකයේ බ්‍රහ්මාරාධනා කථාවේ දැක්වේ

- අප්පරජක්කේ , මහාරජක්කේ- කෙළස් අඩු, කෙලෙස් වැඩි
- තික්ඛින්ද්‍රියෙ -මුදින්ද්‍රියෙ - තියුණු ඉන්ද්‍රිය ඇති,මෘදු ඉන්ද්‍රිය ඇති
- සවාකාරෙ , ද්විකාරෙ - හොඳට සකස් වූ අය, තරමක් කෙළසුණු අය
- සුවිඤ්ඤාපයෙ, දුවිඤ්ඤාපයෙ- පහසුවෙන් අවබෝධ කළ හැකි අය, අවබෝධ කළ නොහැකි අය ( මහා වග්ග පාලියේ මහාඛන්ධකය 6 පිටුව)

එමෙන් ම බුදුන් වහන්සේ ශිෂ්‍යයාගේ අවබෝධයේ වේගය අනුව තවත් කොටස් 4කට වෙන් කළහ.

**උඝඝටිතඤ්ඤූ**

( පාඩමක් ඉගැන් වූ වහාම අවබෝධ කොට ගත හැකි පුද්ගලයා) ,02 විපචිතඤ්ඤූ ( පාඩමක සාරාංශය ඉදිරිපත් කර එය විස්තර කරගෙන යෑමේ දී අවබෝධය ලබාගන්නා කෙනා) 03 නෙය්‍යය ( පාඩමක් ඉගැන්වීමෙන් පසු ඒ පිළිබඳව තවදුරටත් ප්‍රශ්න කිරීමෙන් කරුණු වශයෙන් මෙනෙහි කිරීමෙන් දැන උගත් මිතුරන් ඇසුරෙන් ඇසුරු කිරීමෙන් කරුණු අවබෝධ කර ගන්නා ශිෂ්‍යයා) 04 පදපරම ( වැටහීම් ශක්තිය නැති ශිෂ්‍යයා) ( අංගුත්තර නිකායේ නෙය්‍යපුග්ගල 11 260 පිටුව) මෙයින් පැහැදිලි කර පෙන්වා දෙන්නේ පුද්ගල මනසෙහි ඇති විවිධතාව වේ. අංගුත්තර නිකායේ තික නිපාතයේ ශිෂ්‍යයන් තෙකොටසකට බෙදා දක්වෙයි.

- අවකුජ්ජපඤ්ඤ ( පංතියෙන් නැගිට ගිය පසු මෙනෙහි කිරීමක් නොකරයි. ඉගැන්වීම කළගෙඩියක් යටිමකුරු කොට ජලය වත්කිරීම හා සමානයි )
- උච්චංගපඤ්ඤ ( පාඩමක් උගන්වන්දී උනන්දුවෙන් සිටියත් පාඩම අවසන් වීමෙන් පසුව හැඟීමකින් තොරව සිටීමයි)
- පුථුපඤ්ඤ ( සියලු අවස්ථාවල දී සිහියෙන් හා අවධානයෙන් සවන් දී පසුවත් ඒ පිළිබඳව විමසීමෙන් සිටින පුද්ගලයා වේ) ( අංගුත්තර නිකාය 1 240)

ළමයකු පාඩම් පොතක් කියැවීමේ දී මෙම ස්වභාවයන් ඉතා ම හොඳින් ප්‍රකට විය හැකි යි. ඇතැම් දරුවන් ප්‍රකාශ කරනුයේ කෙතරම් පාඩම් කළත් මතක නැති බව යි. එවිට ඔහුට මෝඩයා යැයි ප්‍රකාශ නොකර උපක්‍රම මගින් කියැවීමට අවශ්‍ය පසුබිම සකස් කර දිය යුතු යි. මෙම පසුබිම තුළ බුදු දහමට අනුව ඉගෙනීමේ ඇති වටිනාකම හා කියැවීමෙන් පුද්ගල මනස තුළ ඇතිවෙන වර්ධනය තේරුම් ගත යුතු යි.

## බුදු දහම ඉගෙනීම හා කියැවීම

වෙනත් විෂයයන් ඉගැන්වීමේ හා කියැවීමේ ක්‍රමවේදයට වඩා බුද්ධ ධර්මය අදාළ පොත පත කියැවීමෙහි වෙනසක් දැක ගත හැකි යි. ආගම ඉගෙන ගැනීමේ පරමාර්ථය වන්නේ විභාගයකින් උසස් ලෙස සමත් වීමේ අරමුණින් නොව යහපත් ජීවිතයක් ගත කිරීම සඳහා

ප්‍රායෝගික මාර්ග උපදේශකත්වයක් ලබා ගැනීම සඳහා ය. කායික, වාචසික හා මානසික සංවරය ඇති කිරීම මෙහි මූලික අරමුණ වේ. ආගමික චින්තනයේ ඇති ප්‍රායෝගික නැඹුරුවත්, මනෝ විද්‍යාත්මක පදනමත් , ප්‍රායෝගික වශයෙන් ඇති වටිනාකමත් තේරුම් ගත යුතු යි. ගුරුශිෂ්‍ය හා දෙමව්පියන්ගේ ආචාර ධර්ම පද්ධතිය ද වැදගත් වේ.

ආගමික සිතුවිලි මිනිස් ජීවිතය හා සම්බන්ධ වන්නේ ඇසට නොපෙනෙන ලෝකයක් හෙවත් මානසික තත්ත්වයක් පිළිබඳව කරන විග්‍රහය තුළ ය. මිනිසාට නොවරදින මානසික තෘප්තිය, ආරක්ෂාව, සමාජීය සහජීවනය ළගා කරදෙන්නේ ආගමික සිතුවිලි මත බව පෙනේ. මිනිස් සිත විවිධ අරමුණු ඉදිරියේ හැසිරෙන ආකාරය මැනවින් ඉගෙන ගැනීම අවශ්‍ය වන්නේ මිනිස් චර්යාව (Behaviuor) සැබෑ අයුරු දැක ගැනීම සඳහාය. මිනිසකු නැතහොත් ශිෂ්‍යයකු හඳුනා ගන්නවා යැයි කියන්නේ මිනිස් සිත ක්‍රියා කරන ආකාරය මැනවින් අවබෝධ කරගැනීම වේ. ධර්මයෙහි පෙන්වා දෙන්නේ මිනිස් සිත උත්පත්තියෙන් ම ප්‍රභාස්වර වෙයි. ආගන්තුකව පැමිණෙන කෙලෙස් නිසා විනාශ වන බව යි. ( අංගුත්තර නිකාය 1 නිපාතය ) මිනිස් සිතේ ස්වභාවය පෙන්නුම් කළ සිග්මන් ෆ්‍රොයිඩ් පෙන්වා දෙන හැටියට මිනිස් සිත පණ ගැන්වෙන්නේ කාමුක බව හා ලුබ්දි ශක්තිය නිසාය. මෙය ප්‍රධාන කාරකය බවත් ඒ අනුව මිනිස් චර්යාව ක්‍රියාත්මක වන බවත් දැක්වේ. නූතන අධ්‍යාපන චින්තනයේ පියා වශයෙන් සැලකෙන ජේන් පියාජේ ( 1932) මිනිසාගේ කායික හා මානසික වර්ධනය අවස්ථා පහක් යටතේ සිදුවන බව පෙන්වා දෙයි.

- ඉන්ද්‍රිය චලන අවදිය අවු 0-2
- ප්‍රතිභා චින්තන අවදිය 2-5
- පූර්ව සංකල්පන අවදිය 5-7
- සංයුත්ත චින්තන අවදිය 7-11
- වියුක්ත චින්තන අවදිය

බුදු දහමට අනුව මිනිස් චර්යාව යනුවෙන් අදහස් කෙරෙන්නේ මිනිස් සිත කේන්ද්‍ර කොට ප්‍රකට කෙරෙන ක්‍රියා සමුදායකි. චේතනාහං භික්ඛවේ කම්මං වදාමි යනුවෙන් ඒ බව දැක ගත හැකි යි. බුදුන් වහන්සේ පෙන්වා දෙන්නේ මිනිස් සිත තණ්හාව නැමති උත්තේජනයෙන් ප්‍රේරණය වන බව යි. කාම තණ්හා ( ජීවත් වීමේ ආසාව ) භව තණ්හා හා විභව තණ්හා මගින් මෙහෙයවන බව පෙනේ. තණ්හාව නැමති ශක්ති ගබඩාව උත්තේජනය කරන ප්‍රධාන ස්වයංක්‍රිය ප්‍රේරණ තුනක් බෞද්ධ මනෝවිද්‍යාවේ දැක්වේ 01 ලෝභය (Greed) 02 ගැටීම් ආදි වූ විෂමාචාර දේ සඳහා යොමු කරන ද්වේෂය කෝපය ( Anger) 03 මුළාව (මෝහය) යනුවෙන් දැක් වේ. මේ සිතුවිලි මගින් පුද්ගලයා මෙහෙයැවේ.

මිනිස් චර්යාව අපේක්ෂිත ආකාරයෙන් වෙනස් කළ හැකිය යන්න බෞද්ධ මනෝවිද්‍යාවේ පිළිගත් සිද්ධාන්තයකි. ප්‍රායෝගිකත්වය වන්නේ සිතට බාහිර ලෝකයෙහි ඇති තරම් හැසිරෙන්නට ඉඩ නොතබා තමාගේ සිත ඇතුළේම පිරික්සන්නට ඉඩ හැරීමයි. සිත දියුණු කිරීම යනු සිත තුළ යහපත් ආකල්ප ඇති කිරීමයි. මේ අරමුණ ඉටු කර ගත හැක්කේ ඊට උචිත ප්‍රේරණ ඔස්සේ මිනිස් සිත උත්තේජනය කිරීමෙනි. ළමයින්ට කියැවීමට හුරුකරවන බුද්ධ ධර්මය පිළිබඳව සැලකිලිමත් වන ගුරුවරයා හෝ වැඩිහිටියා සැලකිල්ලට ගත යුතු කරුණු අතර මිනිස් සිත ක්‍රියා කරන ආකාරය පිළිබඳව අවබෝධයක් තිබීම, මිනිස් සිත ස්වයංක්‍රීයව පෙලඹෙන ප්‍රේරණ කවරේදැයි දැනීම, මිනිසාගේ චර්යාව නිරන්තරයෙන් ම සිත හා සම්බන්ධ බැඳි පවතින්නක් බව ප්‍රත්‍යක්ෂයෙන් ම දැනීම, උපක්‍රමයෙන් මිනිස් සිත යහපත් චර්යාව කෙරේ යොමු කළ හැකි බව,

ළමා සිත පාඩම කෙරේ යොමු කරවා ගැනීමට උචිත ශිල්ප ක්‍රම දැනීම, මිනිස් මට්ටම් අනුව මිනිස් සිතේ ඇතිවෙන වර්ධනයන් අනුව මතුවන තර්කන ශක්තීන් පිළිබඳව මනා අවබෝධයක් තිබීම, ළමා සිත නිබඳව පෙළෙන බාහිර ප්‍රබෝධකවල ස්වභාවය ඒවායින් යහපත් ආකල්ප වර්ධනයට සිදුවන බාධාවන් මැනවින් දැනීම වැදගත් වේ.

## බුදු දහම ඉගැන්වීමේ පරමාර්ථ

මිනිසා තුළ යහපත් ආකල්ප ඇති කරවීම සඳහාත් ඒ අනුව ස්වකීය චර්යාව සකස් කර ගැනීම සඳහාත් සෙසු පාසල් විෂයයනට වඩා ආගම විෂයට හැකියාව ඇති බව පෙනේ. එය ළමා මනස තුළ යහපත් ආකල්ප ගොඩ නගයි. අනිකුත් විෂයයන් ලෞකික වේ. බුදු දහමේ මූලික ඉගැන්වීම් අධ්‍යයන කොට ලෝකය හා ජීවිතය හැඳින ගනිමින් පූර්ණ පෞර්ෂයකින් හෙබි සදාචාරවත් සිසු පරපුරක් බිහි කිරීම මූලික පරමාර්ථයක් වේ. ආගම ඉගෙන ගැනීම. විභාග සමත් වීම සඳහා නොව ආ යහපත් ජීවන දර්ශනයක් සඳහා මග පෙන්වීම, යහපත් ආකල්ප වර්ධනයට මග පෙන්වීම, ගැති බැවින් මිදී නිර්මාණාත්මක ලෙස සිතන්නට මග පෙන්වීම, බහුවිධ සමාජයක සහජීවනයෙන් වාසය කිරීමට මගපෙන්වීම, සිත තුළ සාමය ජනිත කොට සමාජයෙහි සමස්ත ජනකොටස් අතර සාමය වර්ධනය කිරීම හා සුවිශේෂ අරමුණු තමාට මෙන් ම සෙසු අයට ද එකසේ සැලකීමට හා ගෞරව කිරීමට පුහුණු කිරීම, දෙමව්පියන් සමාජයේ උසස් ම ප්‍රජානකයන් යන්න කියාදීම, ගුරුවරුන්ට භක්තියෙන් යුතුව ගෞරව කිරීමට පුහුණු කිරීම, තමා අදහන ආගම කිසිවිටෙකත් පරිභවයට හා හාස්‍යයට ලක් නොකිරීමට පුරුදු පුහුණු කිරීම, දුර්වල අයට රෝගීන්, මහල්ලන් ගැබිනි මවුවරුන් කුඩා දරුවන් ආගමික නායකයන් ආබාධිත පුද්ගලයන් ආදීන්ට ගෞරවරයෙන් යුක්ත සලකන්නට පුරුදු කිරීම, නිබඳව පන්සිල් ආරක්ෂා කරන ආකාරයට තම දෛනික වටපිටාව සංවිධානය කර ගැනීමට මග පෙන්වීම, පෞද්ගලික දේපළ මෙන් ම ප්‍රසිද්ධ දේපළ ආරක්ෂා කිරීමට පුරුදු වීමට මග පෙන්වීම, වගකීමෙන් යුතුව තමාට පැවරෙන රැකියාව සේවාව මෙන් ම විවිධ කටයුතු ඉටුකිරීමට පුහුණුවීම, සමාජ විරෝධී ක්‍රියාවල නිරත නොවීමට මග පෙන්වීම, ස්වකීය සිතීම කථාව හා හැසිරීම පිළිබඳ උචිත අනුචිත බව බෞද්ධ ප්‍රතිපත්ති අනුව නිගමනය කර ගැනීමට පුහුණු කරවීම,සොරකම දුරාචාරය හා සූදුව සමාජයේ පරම සතුරන් ලෙස සැලකීමට පුරුදුවීම, සාමකාමී ලෙස තමා කෙරේත් අනුන් කෙරෙත් ස්වකීය චර්යා රටාව පවත්වාගෙන යැමට නිබඳව අවදියෙන් සිටීමට මග පෙන්වීම, බිහිසුණු ආයුධ භාවිතයෙන් වැළකීමට මග පෙන්වීම, තමා අදහන ආගම නියම ආරක්ෂා ලෙස සැලකීමට පුරුදු වීම, ආදර්ශවත් ජීවිතයක් ගත කිරීමට මගපෙන්වීම වැනි පුළුල් වූ පරමාර්ථ රාශියක් පෙන්වා දිය හැකි යි.

## බුදු දහම කියැවීමට හුරුකිරීම

කියැවීමට මග පෙන් විය හැකි පහසු ක්‍රමය මූලික වශයෙන් හඳුනා ගත යුතු යි. එහි දී බුද්ධ චරිතය, බුද්ධ ධර්මය හා බුද්ධ ශාසන ඉතිහාසය හා එය පදනම් කොට මතු වූ බෞද්ධ සංස්කෘතිය මෙහි දී විශේෂයෙන් හඳුනා ගත යුතු යි.

ප්‍රථමයෙන් බුද්ධ චරිතයේ ඇති විශිෂ්ටතාව අගයමින් විවිධ මනෝභාවයන් ළමයාගේ සිත් තුළ වර්ධනය කිරීමට පුහුණු කිරීමේ දී සිදුහත් කුමාර චරිතය, සිදුහත් තාපස චරිතය හා බුද්ධ චරිතයට අදාළ සිදුවීම් කියැවීමට ලබා දිය හැකි ය. මේ වු කලී ළමයාට පමණක් නොව

වැඩිහිටියන්ට ද එක සේ මග පෙන්වන්නකි. කුඩා කල සිටම උසස් චරිත ලක්ෂණ දියුණු කළ විට මිනිසෙකු විසින් ලැබිය හැකි උපරිම දියුණුව පිළිබඳව කියා දීම, සිදුහත් කුමාර චරිතයේ වැදගත් සිදුවීම්, කපිලවස්තුවේ සිට වේදහ නගරයට යන අතරමග සල්වනයක දී සිදුහත් උපත සිදු වූ ආකාරය, කාළදේව /අසිත තවුසාගේ අනාවැකිය, සිදුහත් කුමරුට සුදෝවුන් රජු වැඳීම, ඉතා සියුමැලි ආකාරයෙන් සිදුහත් කුමරා හදා වඩා ගත් ආකාරය, කුඩා කාලයේ සිටම සිදුහත් කුමරු තුළ තිබුණු සත්ව කරුණාව, ශිල්ප ශාස්ත්‍ර හැදෑරීමට දක්ෂබව, ප්‍රසිද්ධියේ ශිල්ප දැක්වීම, යශෝදරා සමග විවහා වීම, මාලිගා තුනක පුරා අවුරුදු 29ක් කාමභෝගී ජීවිතක් ගත කිරීම, ගිහිගෙයි ජීවත් වීම කෙරෙහි කළකිරීම, රාහුල කුමරුගේ උපත, නිබ්බුතපද ඇසීම හා ගිහි ගෙයින් නික්මීට එය ද ප්‍රබල පෙලඹවීමක් වීම, මැදියම් රැයක කන්තක අසුපිටින් ඡන්න නම් මිතුරු සමග ගිහිගෙයින් නික්මයාම, සිත් අලවන නේරංජනා නදී තිරයට පැමිණ ජීවන රටාව වෙනස් කිරීමට අදිටන් කිරීම වැනි සුවිශේෂ කාරණා වටහා ගැනීමට මෙය මග පෙන්වන්නකි. බුද්ධ චරිතය වැනි ශ්‍රේෂ්ඨ චරිත ඉගැන්වීමේ මූලික පරමාර්ථය වන්නේ ළමයින් තුළ උසස් ආකල්ප හා කුසලතා දියුණු කිරීම සඳහා අනුබලය දීමයි. මේ සඳහා විවිධ ජාතක කතාවන් හා සාමණේර චරිත යොදා ගත හැකි යි. රාහුල, සුනීත, සෝපාක , චුල්ලපන්ථක වැනි චරිතයන්ගේ සුවිශේෂතා විවිධ සිදුවීම් ආශ්‍රයෙන් පෙන්වා දිය හැකි යි. ඒ සඳහා සරල බසින් ලියැවී ඇති කතා පොත් බොහෝ ප්‍රමාණයක් සුලභව ඇත.

ධර්ම කරුණු වර්ගීකරණය කියැවීමේ දී දුක්ඛ සත්‍යය ( දුක පිළිබඳව) ඇත්ත, දුක්ඛ සමුදය සත්‍යය ( දුක හට ගැනීම පිළිබඳ සත්‍යය), දුක්ඛ නිරෝධ සත්‍යය ( දුක නැති කිරීම පිළිබඳ සත්‍යය) දුක්ඛ නිරෝධ මාර්ග සත්‍යය ( දුක නැති කිරීමේ මග), පටිච්ච සමුප්පාද ධර්මය (ලෝකයේ දුක ඇතිවීම සිදු වන ආකාරය විවරණය කරන හේතුඵල වාදය පිළිබඳ විවරණය, ආර්ය අෂ්ටාංගික මාර්ගය ,ත්‍රිලක්ෂණය ( අනිච්ච දුක්ඛ අනාත්ම), කර්ම විභාගය, පුනර්භවය, සත්තිස් බෝධි පාක්ෂික ධර්ම, පන්සිල්, දස කුසල් හා අකුසල්, දස පුණ්‍ය ක්‍රියා, දානය හා ශීලය, භාවනාව, දස පාරමිතාව, බෞද්ධ ආචාර්ය ධර්ම, චරිත කථා, යහපත් ජීවිතයක ලක්ෂණ, ඉගෙනීම හා කියැවීම ගැඹුරු ජීවන දර්ශනයකට මග වේ.

ශාසන ඉතිහාසය හා බෞද්ධ සංස්කෘතිය පිළිබඳව කියැවීමේ දී සංගායනා, සංඝ සංවිධානයේ ආරම්භය, ශාසන ඉතිහාසයේ ආරම්භය හා ව්‍යාප්තිය, බුදුන් වහන්සේගේ ලංකාගමනය, සම්බුද්ධ පරිනිර්වාණය, විදේශීය ධර්ම දූත ව්‍යාපාරය, අශෝක අධිරාජ්‍යයා, මහින්දාගමනය හා ශ්‍රී ලංකාවේ බුදු සසුන පිහිටුවීම, ලංකාවේ වැදගත් ආගමික ස්ථාන, පන්සල හා ගිහි සමාජය, ආගමික උත්සව හා ඒවායේ සංස්කෘතික අගය වැනි සංකල්පයන් ආවරණය වන පරිද්දෙන් ළමයාගේ රුචිය අනුව තෝරා දිය යුතු යි. විවිධ රූප කථාමය දෑ ඉදිරිපත් කිරීම මගින් ළමයාගේ කියැවීමේ රුචිය වැඩි දියුණු කිරීමට වැඩි අවධානයක් ලබා ගත හැකි යි.

## නිගමනය

ළමයින් කියැවීම සඳහා යොමු කිරීමේ දී මූලික වශයෙන් මානව ජීවිතයේ පැවැත්මට ඉවහල් වන කරුණාව, දයාව ,මෛත්‍රිය ,අන්‍යෝන්‍ය විශ්වාසය, අන්‍යයන්ට ගෞරව කිරීම වැනි සංකල්ප මතුවන ආකාරයට කියැවීමට අවස්ථාව ලබා දිය යුතු යි. මූලික අඩිතාලම ශක්තිමත් ලෙස යොදා ගැනීමෙන් පසු අවධිය වන විට යහපත් මිනිසෙකු බිහි කර ගත හැකි වේ. ජීවිතය අවබෝධ කර ගත් යහපත් පුද්ගයකු බිහි කිරීම මෙහි උත්කෘෂ්ට පරමාර්ථය වේ. කියැවෙන යමක් ඇත්නම්

විචාරශීලව හා සංවාදශීලව කියැවීමෙන් වඩා නිර්මාණශීලි මිනිසෙකු බිහි කර ගත හැකි යි.එමෙන් ම කියැවීමට දෙමව්පියන්, වැඩිහිටියන් හා ගුරුවරුන් යොමුවීමෙන් දරුවන්ට ඔවුන් ආදර්ශයක් ලෙස යොදා ගත හැකි යි.

## ආශ්‍රිත මූලාශ්‍ර


ගල්මංගොඩ, සුමනපාල. (2012). ආදි බෞද්ධ දර්ශනය (මූලධර්ම විග්‍රහයක්), දිවුලපිටිය. සරස්වති ප්‍රකාශන

පඤ්ඤාලෝක හිමි, මීගොඩ. (2005). බුදුදහම අධ්‍යාපනය සහ සමාජ සබඳතා. කොළඹ. සදීපා ප්‍රකාශන

පේමරතන හිමි, සූරක්කුලමේ. (2010). බෞද්ධ මනෝවිද්‍යාව. කොළඹ. දයාවංශ ජයකොඩි,

වජ්‍රප්‍රභා ශාස්ත්‍රීය සංගහ්‍රය. (2004). සංස්. නෙළුම්දෙණියේ විමලසාර හිමි සහ තවත් අය. හොරණ. විද්‍යාරත්න විශ්ව විද්‍යාපීඨය.

වීරසිංහ, හෙන්රි. (2002). වරදිවෙල විජයසුමන හිමි (පරි.). බුදුදහමින් පිළිබිඹුවන සාමය සඳහා අධ්‍යාපනය, සර්වෝදය විශ්වලේඛා

සීලරතන හිමි, අඹන්පොළ. (2008). බෞද්ධ චින්තනයෙන් පිළිබිඹු වන අධ්‍යාපන දර්ශනය. දෙහිවල. ශ්‍රී දේවි ප්‍රින්ටර්ස්

හෙට්ටිආරච්චි, ධර්මසේන. ( 2003) , බුදු දහම ඉගැන්වීම. නුගේගොඩ. තිසර ප්‍රකාශන.

මජ්ජිම නිකාය 1. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. (2006). දෙහිවල. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

විසුද්ධි මාර්ගය. සංස්. මාතර ශ්‍රී ධර්මවංශ මහා ස්ථවිර. කොළඹ. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

අංගුත්තර නිකාය 1. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. (2006).

මහා වග්ග පාලියේ මහාඛන්ධකය. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. (2006).

Martin, Brooks. November 8 ,2006 from http:/www.bookaid.org/cms.cgi./site/news/ https://pdfs.semanticscholar.org/

Michael, Fielding ; 2000. https://www.tandfonline.com/doi/abs/journalCode=tedp20

Shaeen, Majeed. Journel of Educational Media and Library Science 45:2 ( winter2017) : 187-198 ) Understanding the reading habits of Children in Singapore - https://pdfs.semanticscholar.org/14a2/b0eadfb21524fb72861b85910f90745a3be5.pdf

Book Aid Ineternational . 2003, is reading a daying pastime.? Readers accrossin globle say no. ( press Release ) Retrieved

# ළමා ලෝකය ප්‍රතිනිර්මාණය කෙරෙන විශ්ව ළමා සාහිත්‍යය

- සුදේශ් කවීශ්වර*

## ප්‍රවේශය

මේ වූ කලී, විශ්වීය සාහිත්‍ය ප්‍රපංචයෙහි වඩාත් අවධානයට ගැනෙන ශානරයක් වන 'ළමා සාහිත්‍යය' පිළිබඳව සිදුකරන ලද සංක්ෂිප්ත අධ්‍යයනයකි. මෙහි දී ළමා සාහිත්‍යයක දැකිය හැකි විශේෂතා, එහි ඓතිහාසික පැවැත්ම, ළමයා සහ සමාජය අතර පවතින සබඳතාව, ළමා මනස සංස්පර්ශ කිරීම සඳහා ලේඛකයා දක්වන සමත්කම ආදි අංශයන් කෙරේ වැඩි නැඹුරුවකින් යුත් විශ්ලේෂණයක නිරතවන බව කිව යුතුය. මේ සඳහා තෝරා ගන්නා ලද කෘති අපගේ අභිමතය අනුව නිදසුන් කොට ගත් බවත් ඊට අනන්‍ය වෙනත් නිර්මාණ තිබෙන බවත් සැලකිය යුතුය. පරිණත මිනිසෙකු අරභයා නිර්මාණයක් කරනවාට වඩා ළමයින් වෙනුවෙන් නිර්මාණකරණයෙහි යෙදීම සියදහස් ගුණයක දුෂ්කර කාර්යක් බව බොහෝ නිර්මාණකරුවෝත්, ඒවාහි ගුණානුගුණ පවසන්නෝත් කියති. එසේ වනුයේ ළමා මනස හා එහි පවතින සමාජ මනෝවිද්‍යාත්මක පසුබිම සාකල්‍යයෙන් නොදැන විප්‍රකාර ලියනවා විනා, අපූර්ව වූත් උත්කෘෂ්ට වූත් නිර්මාණයක් කළ නොහැකි නිසාය.

උපතේ සිට නව යොවුන්විය දක්වා කාලය ළමා කාලය වශයෙන් ගැනෙන අතර ළමා මානසිකත්වයට ගැළපෙන කතන්දර හා කවි ඔස්සේ ළමා ලෝකය ස්පර්ශ කිරීම යන්න සරලව අපට හඳුනා ගත හැකි ළමා සාහිත්‍යයික ප්‍රවේශයයි. නමුත් ඉන් ඔබ්බට ගිය ළමා කවි, ජන ගී, මනඃකල්පිත කතා, සුරංගනා කතා, ජනකතා, ළමා නවකතා, නාට්‍ය හා චරිතකතා යන විෂය ක්ෂේත්‍ර මෙහිලා පෙන්වා දීම වැදගත් වේ. මෙහි දී අපගේ මුඛ්‍ය අවධානය යොමු වන්නේ මනඃකල්පිත කතා, සුරංගනා කතා හා ළමා නවකතා කෙරෙහිය. ළමා පාඨකයා නිර්මාණවලින් ලබන අනුභූතිය තම ජීවිතයට සමීප කරවීම සඳහා නිර්මාණකරුවා ළමා ජීවිතයට සමීප වී වඩාත් සාධාරණ ලෙස කතන්දරය වියා හමාර කළ යුතු ය. එවිට, එකී නිර්මාණයේ සිත් ඇඳ බැඳ ගන්නා අපූර්ව ගුණය පවතින්නේ.

## ළමා අනන්‍යතාව හා ප්‍රමිති විදහාලන විශ්ව සාහිත්‍ය ප්‍රවර්ග

විශ්ව ළමා සාහිත්‍යය නිරවුල් වූත්, ස්වාධීන වූත් සාහිත්‍යයක් වශයෙන් ස්ථාවරයට පත් වන්නේ දහඅට වන සියවසේ දෙවන භාගයේ දී ය. විශේෂයෙන් ම කාර්මික විප්ලවයෙන් අනතුරු

* සහකාර කථිකාචාර්ය, සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

ව එංගලන්තය ඇතුළු බටහිර රටවල් රැසක සිදු වුණ සමාජ දේශපාලන ප්‍රතිසංස්කරණ මේ සඳහා හේතු සාධක වී තිබේ. එංගලන්තයේ වික්ටෝරියානු සමාජ ගත් කල, එහි සමාජ සදාචාරය තුළ ළමයි මෙහෙකාර සේවයේ යෙදවීම, කාර්මික ආයතනවල කම්කරුවන් ලෙස සේවයේ යෙදවීම, ළමයි වහලුන් වශයෙන් තබා ගැනීම වැනි කාර්යයන් දැඩි අයතා ක්‍රියා වශයෙන් සලකන ලදී. වික්ටෝරියානු රැජිනගෙන් සහ එම රජයෙන් ද ඊට අවකාශයක් තිබුණේ නැත. නමුත් ඉතිහාස හා ඇතැම් සාහිත්‍ය කරුණු සලකා බලන කල කම්කරු පාන්තික මිනිසුන්ගේ ළමයින් අපරිමිත වශයෙන් තම ශ්‍රමය කර්මාන්තශාලාවල විවිධ කටයුතුවලට යොද වූ බව කිව හැකි ය.

කාර්මික ප්‍රවර්ධනය හේතුවෙන් පරිණත තත්ත්වයට පත් නිෂ්පාදන බලවේග හා සංකීර්ණ නිෂ්පාදන විධි හේතුවෙන් නගර ආශ්‍රිත ව සිදු වූ භෞතික පරිවර්තනය ඉතා විශාල විය. එය කලාකාමී මිනිසාගේ සංවේදී සිත් සතන් පීඩාවට පත් කළ හෙයින් රෝමාන්තික සාහිත්‍ය කලා සම්ප්‍රදායයේ ප්‍රාරම්භය සනිටුහන් වූයේ ය. නාගරික ධනේශ්වර ක්‍රමයක ඇරඹුමත් සමඟ ඔවුනොවුන්ගේ සිත් සතන් පිනවීම පිණිස සාහිත්‍ය කලා නිර්මාණ යොදා ගැනීම බැවහැර තත්වයට පත්වූයෙන්; ළමා සාහිත්‍යයෙහි මුල් බීජ රෝපණය වන්නේ මෙවන් සන්දර්භයක් පාදක කොට ගෙනය.

විශ්ව ළමා සාහිත්‍යය පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී, දහනම වන සියවසේ ඇමරිකානු ප්‍රබන්ධ කතා කලාවේ විශාල වශයෙන් ප්‍රසිද්ධ වූ කෘතියක් වශයෙන් ලුයිසා මේ ඇල්කොට් (Louisa May Alcott) නම් කතුවරිය විසින් රචනා කරන්නට යෙදුණ Little Women කෘතිය හඳුන්වා දිය හැකි ය. මෙය රචනා වී ඇත්තේ ඇමරිකානු සිවිල් යුද්ධය පැවති කාල වකවානුවේ දී; එම යුද්ධය වෙනුවෙන් සේවය කළ දේවගැතිවරයෙකු වශයෙන් කටයුතු කළ පියෙකුගේ හා ගැහැනු ළමයින් සිව් දෙනෙකුගේ කතා ආඛ්‍යානයක් පාදක කොටගෙන ය. ජෝ, මෙග්, බෙත් සහ ඇමී වන එම දූවරුන් සිව් දෙනා සමඟ තම මව දුක සේ කාලය ගත කරන්නී ය. මෙම පවුල ඉතා අමාරු දසාවකට වැටුණෙන්, තම තමන්ගේ ස්වෝත්සාහයෙන් විනා සෙසු උපකාරයකින් නැගී සිටීමට හෝ අවකාශයක් නොවී ය. ගැහැනු ළමයින්ගේ ජීවිත වැඩි දුරටත් බයිබලය හා තම මව අතර තිබෙන සම්බන්ධය කෙරේ පැවතීමත් තම තම අභිලාෂයන් සාර්ථක කර ගැනීම උදෙසා කැප වීමත් යන කාරණා මෙහි දී වැදගත් වේ. මෙහි කථානායිකාව වන ජෝ ලේඛිකාවක වීමේ අභිලාෂයෙන් කටයුතු කරන්නී; වැඩිමලා වන මෙග් අනෙකෙකුගේ ධනය කෙරෙහි කෑදර කමින් හා මාත්සර්යයෙන් කටයුතු කරන්නී; සංගීතයට ප්‍රිය බෙත් ලජ්ජාශීලී වන්නී; බාලයා වන ඇමී වංශාධිපති අභිමානයෙන් උපන් අහංකාරිත්වයෙන් යුක්ත වන්නී ය. ඇල්කොට්ගේ චරිත වූ කලී මනා විශ්වාසවන්ත සේම ඔවුනොවුන්ගේ අඩුපාඩුකම් හෝ අපූර්ණතා පිළිබඳ ව රුචිකත්වය ඇති කරනසුලු ය. ඔවුන්ගේ ප්‍රීතිමත් ජීවිත දුක්ඛ දෝමනස්සයන්ගෙන් පිරෙන්නට පටන් ගත් ආකාරයත්, එකිනෙකාගේ අඩුපාඩු මකා ගැනීම සඳහා වැඩිහිටියන්ගෙන් උපකාර ලැබෙන ආකාරයත් ළමා පාඨක මනස සන්තර්පණය කිරීමට සමත් වෙයි. ළමයින් තුළ ඇති වූ ලජ්ජාශීලී භාවය; තම වැඩිහිටියන්ගේ (සීයාගේ) උපකාරය ඇති ව ජය ගන්නා අයුරු බෙත්ගේ චරිතය මඟින් ඉදිරිපත් කෙරෙයි. ළමා සාහිත්‍ය කෘතියක පැවතිය යුතු ප්‍රබන්ධාත්මක ස්වරූපය හා කතාව ගොතා ඇති ආඛ්‍යානමය විශේෂත්වය ළමයා කෙරේ අනුභූතිය ගමන් කිරීමට සමත් වී ඇති බව කිව හැකි ය. බසළුඑකැ උදපැබ වනාහී කාලානුක්‍රමික පරිණතිය විදහා දක්වන නවකතාවක් හෙවත් කාලයාගේ ඇවෑමෙන් වැඩිවියට පත්වන චරිත ආශ්‍රය කොට ගෙන රචනා කරන ලද්දක් බවත් පෙන්වාදිය හැකි ය.

ළමා මනස නිරන්තරයෙන් අපූර්ව ආශ්වාදයන් කෙරේ ඇදී යන්නේ; ඔහු අවබෝධ කර ගන්නා තථ්‍ය ලෝකයට වඩා යමක් එහි ඇතැ'යි යන හැඟීමෙනි. පරිණත අත්දැකීම් හෝ විසල් විෂය ලෝකයක් නොවූයෙන් සමවයස් කාලය හා තමා අවට වටාපිටාව පරිග්‍රහණය කිරීම සඳහා

ඔහු හෝ ඇය සූදානම් වන්නේ ය. එය අර්ධ වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ ළමා මනස තුළ තැම්පත් වී චමත්කාර ජනක පරිකල්පනයන් කරා ළමයාව ගෙන යයි. තව දුරටත් ළමයාට තථ්‍ය ලෝකය යනු තමාට බාහිර ව පවතින්නක් නොව තමා ගනුදෙනු කරන අපෝහක භෞතික ලෝකය ම බව අවබෝධ කර ගනී. මෙකී ලෞකික ලෝකය හා සමවාය සබඳතාවක් පෙන්වන කෘතියක් වශයෙන් ෆ්‍රැන්සිස් හොඩ්ග්සන් බර්නෙට් (ත්‍රබජි ‍ාදාවිදබ ඊමරබැළුළු) විසින් රචිත The Secret Garden කෘතිය පෙන්වා දිය හැකි ය. මේරි ලෙනොක්ස් නමැති හිතුවක්කාර කුඩා දැරිය එංගලන්තයේ යෝක්ෂයර් ප්‍රදේශයේ වංශාධිපතියෙකු වූ ආකීබෝල්ඩ් ක්‍රේවන් මහතාගේ නිවසේ වාසය කිරීමට යාමත් සමග බාහිර ලෝකයට ආවෘත ව තිබූ අභිරහස් උද්‍යානයක් සොයා ගන්නී ය. ඇවිදීමට අපහසු තත්ත්වයක සිටි කොලින් සහ සතුන් සමග කුලුපග ඩිකන් යන හිත මිතුරන්, පාදක කොට ගෙන මෙම ප්‍රබන්ධය ගෙත්තම් වී ඇත. එංගලන්ත පාලන බලය ඉන්දියාවේ පවතින කාල සීමාවක ඉන්දියාවේ වාසය කළ; මේරි, මේරිගේ මව සහ පියා; වංශවත් මෙන් ම ධනවත් පිරිසක් ද වූහ. කොලරා වසංගතය හේතුවෙන් දෙමාපියන් අකාලයේ මියයාම හේතුවෙන් සේවකයන් අතෙහි දඩබ්බර ව සැදුණ මේරි එංගලන්තයේ ඇගේ අලුත් නැවතුම් පොළට පැමිණි පසු එය නුරුස්නා ස්වභාවයෙන් මුලින් ම කටයුතු කළ ද අනුක්‍රමික ව එම තත්ත්වය වෙනස් වෙමින් පාඨක මනස ඇද ගන්නා කථානායිකාවක් බවට පත් වන්නීය. ළමා කතාවක ආවශ්‍යයෙන් ම තිබිය යුතු කථානායක හෝ නායිකා චරිතයෙහි, ආදර්ශවත් භාවය හා කැපී පෙනීමේ විශේෂත්වය ද මෙම කතාවේ අන්තර්ගත වී ඇත. ළමා ලෝකය වූ කලී පන්ති භේදයන්ගෙන් තොර වූවක් බවත් සමාජ පන්තික්‍රමය විසින් ඔවුන් එකී ස්තරයන් වෙත ඇද ගන්නා බවත් මෙය මොනවට පසක් කරයි. ඩිකන් ගේ චරිතය, මේරි හා කොලින් දෙදෙනා අතුරෙහි පහළ සමාජ ස්තරය නියෝජනය කරන දිළිඳු; මානව හිතවාදිත්වයෙන් අනූන; කරුණාවන්ත පුද්ගලයෙකු වශයෙන් හඳුනා ගත හැකි ය. මේරි විසින් සොයා ගන්නා ලද අපූර්ව උද්‍යානය ළමා මනසේ ෆැන්ටසිමය තත්ත්වයක් බව කිව හැකි ය. ළමයින්ගේ ලෝකය ගහකොළ, මල්එල, සතා සිව්පාවා, ඇළ දොළ ආදි ස්වභාවික වස්තූන්ගෙන් සැදුම්ලත් එකක් බව පෙනෙන්නට තිබෙන සත්‍යයි. එකී ලෝකයේ දොරටු විවර කරන්න සංඥාවක් වශයෙනි බර්නෙට් මෙකී උද්‍යානය ගෙන හැර පාන්නේ. ඇවිදීමේ අපහසුතාවෙන් පෙළෙන කොලින් රෝදපුටුවක තබාගෙන උද්‍යානය බැලීමට රැගෙන යාම ස්වභාවික ලෝකයේ කලාත්මක සංවේදීතාවන්ට නැඹුරු වන ළමා මනස ප්‍රතිබිම්භනය කරයි. අනෙක් අතට ඇවිදීමට හැකියාවක් නොමැති කොලින්ට එම ශක්තිය ලබාදීම සඳහා මේරි සහ ඩිකන් දරන උත්සාහය ළමා සමාගමය හා ළමා විඥානය ගෙනහැර පෑමකැ'යි කිව හැකි ය. Must Read Books-501 නමැති කෘතිය සම්පාදනය කළ එමා බැරී සඳහන් කරන්නේ; මෙම කෘතිය වනාහී,

'මධ්‍යම පාන්තික ළමයින් කුඩා වැඩිහිටියන් වශයෙන් හැසිරෙන; ඉන්ද්‍රජාලිකත්වය හා සොබාදහමේ සුන්දරත්වය මිනිස් ආත්මයට ඇති කරන ලද අනුඵලදායිතාවයත්; මානව මිත්‍රත්වයේ අවශ්‍යතාවය අවබෝධ කර ගැනීමට ළමයින්ට ඉඩ සලසාදීමක්.' බවයි.

එංගලන්ත වික්ටෝරියානු සාහිත්‍යයේ ප්‍රධානියකු වන චාර්ල්ස් ඩිකන්ස් (Charles Dickens) විසින් රචනා කරන ලද ඇතැම් ග්‍රන්ථයන් ද මෙහිලා ළමා මනස විනිවිද දුටු කතා වස්තූන්ගෙන් සමන්විත ය. ළමයාගේ ආධ්‍යාත්මික ලෝකයත් පිටතින් පවතින ව්‍යුහාත්මක ලෝකයත් අතර ඒකාබද්ධතාවක් ඇති කරන ලේඛකයෙකු වූ ඩික්න්ස්, පවුල නමැති ඒකක දෙස වෙනස් ආකාරයකට බලන්නෙක් විය. ඔහුගේ කතාවල හමුවන බෙහොමයක් කථානායක චරිතයන් දෙමාපියන් අහිමි වූ අසරණ ළමයින්ගෙන් යුක්ත වේ. ඔවුහු වික්ටෝරියානු සමාජයේ ධනේශ්වරය තුළ පීඩාවට පත් වන අහිංසකයෝ ය. ඔහු විසින් රචිත ඔලිවර් ට්විස්ට් නවකතාවෙන් එය මනාව පැහැදිලි වන අතර පවුල බිඳ වැටීම නිසා ළමා පෞරුෂය ගොඩනැගීම සම්බන්ධයෙන් ඔවුන්

මුහුණපාන ගැටලු පිළිබඳ ව ද සැලකිය යුතු අදහසක් දනවන්නකි. සිග්මන් ෆ්‍රොයිඩ් වැනි මනෝ විද්‍යාඥයෝ පෞරුෂයේ ස්වභාවය හා එහි සංවර්ධන රටාව පිළිබඳ ව නොයෙක් මතවාද ඉදිරිපත් කළහ. ස්ත්‍රී පුරුෂ භේදයකින් තොර ව පොදුවේ ළමයා විෂයෙහි බලපවත්වන සංකල්පයන්ට අමතර ව උභය භේදය වෙන් වෙන් වශයෙන් ද ඔවුනොවුන් වෙත බලපායි. විශේෂයෙන් ම මානව සමාජය ශාරීරික වශයෙන් ද මානසික වශයෙන් ද සංස්කෘතික වශයෙන් ද වෙන් ව ඇති හෙයින් ළමයා මෙම බෙදීම් තුළ සිර කරුවෙකු වන්නේ දෙමාපිය පිළිසරණක් නොවුණ විට දී ය.

ඔලිවර් ට්විස්ට් නවකතාවේ ඔලිවර්ගේ චරිතය ගොඩ නැගෙන්නේ මවකගේ හෝ පියෙකුගේ රැකවරණයක් නොමැති අහිංසක දරුවෙකු වශයෙනි. ඔහු කුඩා කල සිමට ජීවත් වන්නේ වැඩ නිවාසයක ය. සමවයස් හිත මිතුරන් සමග වැඩ නිවාසය තුළ සිරකරුවෙකු වශයෙන් ගෙවන ජීවිතය අතහැර දමා එයින් පැන යාමට ඔහු කටයුතු කරයි. ළමයාගේ ශාරීරික වර්ධනයට අවශ්‍ය මූලික ආහාර වේලවත් සැහෙන ප්‍රමාණයට නොදෙන වැඩබාර නිලධාරීහු විසින් ළමයින් රැක බලා ගැනීමට හිලව් වශයෙන් ඔවුන්ගේ ශ්‍රමය ලබා ගෙන විවිධ කර්මාන්ත කරති. මෙසේ වැඩ නිවාසවල නිලධාරීන් ළමා ජීවිතය නොතකා හැරීම හා ඔවුන්ගේ පෞරුෂ වර්ධනය නොතකා හැරීම නිසා අයාලේ යන ළමා ජීවිත පිළිබඳ සංඥාවන් දැකිය හැකි ය. මෙහි කථානායකයා පවුලෙන් පිටත ජීවිතයක් ගත කරන අතර අවසානයේ දී පවුල් පරිසරයක් සදාගෙන ඊට අනුගත වෙන්නකු වේ. බ්‍රවුන්ලෝ නමැති උගත් මහත්මයෙක් ඔහුගේ භාරකාරීත්වය ලබා ගන්නා අතර සොරුන් කණ්ඩායමකට හසු වී සැහෙන කලක් චිත්ත පීඩාවන්ට ලක්වෙමින් කටයුතු කිරීමට ඔලිවර්ට සිදු විය. බ්‍රවුන්ලෝ මහතා සහ සොරමුල අතර ළමයා ගෙවන ජීවිතය සියුම් ව අධ්‍යයනය කරන කෙනෙකුට හැඟී යන්නේ, ළදරු වියේ නිරායාසයෙන් ඇලුම් කිරීමට සිටින පියා හෝ මව නොමැති වීම; පෞරුෂ සංවර්ධනය සඳහා වැඩිහිටි පාර්ශ්වය මැදිහත් වීම; යන උපන්‍යාස මේ ව්‍යවසනයට හේතු වූ බවයි. එක් අතකින් එංගලන්ත සමාජයේ උගත් ධනේශ්වර මිනිසාත් පහළ ම පන්තියේ උපන් මිනිසාත් මගින් ප්‍රතිපක්ෂ යුගලක් නිරූපණය කිරීමට ඩිකන්ස් උත්සාහ ගෙන තිබේ. මේ සාහිත්‍ය කෘතියක් මගින් මෙහි ළමා මානසික ක්‍රියාකාරීත්වය හා එහි සංකීර්ණතාවය පිළිබඳ ව විමසීමක් සිදු කෙරෙන බව කිව හැකි ය. අවසානයේ ළමා පාඨකයාගේ මනසේ චිත්‍රණය වන්නේ සියලු ම කරදර අභිබවා ඔලිවර් ජීවිතය ජයගත් බවයි. ධනයක් දේපළක් තබා වාසය කරන්නට නිවෙසක් නොතිබූ මෙම කුඩා පිරිමි දරුවා අවසානයේ දී විසල් ධනයකට හිමිකම් කියන්නට වූයේ ය. එකල එංගලන්ත සමාජයේ කුමන මිනිසාටත් වුවමනා වූයේ ධනේශ්වර පන්තිය ස්පර්ශ කිරීමට බව මෙහි අවසානය දකින කල වැටහෙයි.

ළමයාගේ මානසික සංවර්ධනය උදෙසා සාහිත්‍ය කලා රස විඳීමේ දී විශේෂයෙන් අවධානය යොමු වන්නකි, සුරංගනා කතා. ඒවා මගින් පරිකල්පනාත්මක ලෝකයක් වෙත ගෙන යනු ලබන හෙයින් ළමයාගේ බුද්ධිය පිළිබඳ සංකල්පයන් කෙරේ වැඩි බලපෑමක් ඇති කෙරෙයි. පුද්ගල ස්වීයත්වය ගොඩ නැගීමට මිනිසා ලබා ගන්නා අත්දැකීම් සංකීර්ණතාව හේතු වන බව කිව හැකි ය. එය ළමා වයසේ සිට ම වර්ධනය විය යුත්තකි. ළමයාට තමාගේ විෂය ලෝකය අවබෝධ කර ගැනීමට නම් පරිකල්පනීය වූ අවෛෂයික ලෝකයේ අපූර්වත්වය ළඟා කර දිය යුතු ය. ජර්මන් සුරංගනා කතාකරුවෙකු වන ජෝන් රස්කින් විසින් දක්වන අදහස මෙහිලා වැදගත් ය. ඔහු ප්‍රකාශ කරන්නේඃ දරුවාට සුරංගනා කතා කියවීමට අවකාශය සලසා දිය යුතු වන්නේ යඃ එම කතා සත්‍යමය වූ කතා යැයි සිතා, ඔවුන්ට ප්‍රීති වීමට ඉඩ හැරිය යුතු යඃ එමගින් මතු කරන සංකල්ප ගැන ප්‍රබෝධ වන්නට ඉඩ හසර ලබා දිය යුතු වන්නේ, දිගු කාලයක් එහි ජීවත්වීමට පැහැදිලි අවකාශයක් ලබා දීමෙනැ'යි යනුවෙනි.

සුරංගනා කතා යනු කියවීමට රුචිකර වූත් අපූර්වත්වයෙන් යුක්ත වූත් කල්පිත කතාය.

ඒවායේ දක්නට ලැබෙන ලෝකය හෝ ලබන අත්දැකීම් සැබැවට දැක ගත හැකි දේ නොවේ. සුරංගනා කතා යනු තථ්‍ය ලෝකයේ විවිධ සමාජ සංස්කෘතික හා දේශපාලනික පීඩාවන්ට ගොදුරු වූවන් සුබවාදී වින්දනයකට ගෙනයන කතා කලාවක් බව කිව හැකි ය. බටහිර සාහිත්‍යයේ මෙය හඳුන්වන්නේ ''ෆෙයරි ටේල්ස්'' (Fairy Tales) යනුවෙනි. බොහෝ සුරංගනා කතා ජනකතා පාදක කොටගෙන නිර්මාණය කළ ඒවා බව ප්‍රකට කරුණකි. නමුත් මේ ජනකතා ද පාදක කොට ගනිමින් සුරංගනා කතා නිර්මාණය කළ නිර්මාතෘවරුන් කිහිප දෙනෙකු ද හඳුනා ගැනීමට පුළුවන. සුරංගනා කතාවල දක්නට ලැබෙන චරිත නිරූපණයන් පැතලි තත්ත්වයෙන් යුක්ත වුව ද ළමා මනසට කාවදින ස්වරූපයේ අපූර්ව ඒවා වේ. මේවා මායාකාරියන්, මායාකාරයන්, විශේෂ බලයක් හෝ හැකියාවක් ඇති සතුන් හා මිනිසුන්, රජවරුන්, අරුම පුදුම නගර, කුමර-කුමරියන් ආදි පාත්‍ර වර්ගයාගෙන් සමන්විත වන්නේ ය. මෙවන් කතා රචනා කළ විශිෂ්ට ලේඛකයන් අතර හැන්ස් ක්‍රිස්ටියන් ඇන්ඩර්සන්, ජේකොබ් සහ විල්හෙල්ම් ග්‍රිම් සොහොයුරෝ, පීටර් සී. එස්බ්ජෝර්සන් සහ ජෝර්ජන් ඊ. මෝ හා චාර්ල්ස් පෙරුට් වැන්නෝ වැදගති. මේ අතර හැන්ස් ක්‍රිස්ටියන් ඇන්ඩර්සන් ලේඛකයා ලෝකප්‍රකට කතාකරුවෙකු වශයෙන් හැඳින්වේ. ඇන්ඩර්සන් විසින් රචනා කරන ලද සුරංගනා කතා සහ සෙසු කතා මගින් ළමා ලෝකයත් ඔවුන්ගේ පරම්පරාවත් ආලෝකවත් කෙරිණි. මෙහි දී නිදසුන් වශයෙන් ඇන්ඩර්සන්ගේ කතා කිහිපයක් පමණක් හඳුන්වා දීමට සිදු වන බව කිව යුතු ය. The Ugly Duckling, Princess and the pea, The snow Queen, Thumbelina, The red shoes, The wild Swans and The Marsh king's Daughter, The Little Match Girl වැනි කතා ඔහු විසින් රචනා කරන ලද දෙසීයක් පමණ සුරංගනා කතා අතර සුප්‍රකට ය. 'විරූපී තාරා පැටවා' (The Ugly Duckling) කතාව, ළමයා කියවා රසවිඳින්නේ; ලස්සන යනු සමෙහි වර්ණය පිළිබඳ දක්වන අදහසක් නොව; එය වටහා නොගෙන අන් අය සමඟ ගනුදෙනු කිරීම සාවද්‍ය ක්‍රියාවක් බව අඟවන ආප්තයන් සිතට ගනිමින. සැබෑ කුමාරිකාව යනු කවුරුන් දැ'යි යන්න හඳුනා ගැනීම පිළිබඳ ව ගෙතුණ අපූරු කතාවක් වශයෙන් 'කුමාරිකාව සහ බෝංචි ඇටය' (Princess and the pea) යන කතාව හැඳින්විය හැකි ය. ඇඳෙහි බෝංචි ඇටයක් තබා මෙට්ට සියයක් ද ඇඳ ඇතිරිලි සියයක් ද දමා කුමාරිකාවට නිඳා ගැනීමට සලස්වා තිබිය දී ඇය රාත්‍රියේ අවදි වන්නී; මෙට්ටයකටවත් නොදැනෙන බෝංචි ඇටයෙහි බලපෑම සියුම් ආකාරයෙන් ඇයගේ ශරීරයට දැනුණ නිසාවෙනි. 'කුඩා ගිනිකූරු දැරිය' (The Little Match Girl) නමැති කතාව වනාහි යථාර්ථ ලෝකයෙහි අත්විඳිය නොහැකි දෑ ෆැන්ටසිමය ලෝකයක් මගින් අත්විඳින කුඩා දැරියක පිළිබඳ කතන්දරයකි. මෙය ශෝකී භාවය ඇති කරන්නා වූ කතන්දරයක් වශයෙන් හැඳින්වීමට පුළුවන. අතිශයින් ම සීතල වූත් හිම කැටිති පතනය වන්නා වූත් අඳුරු රාත්‍රියක ගිනිකූරු පත්තුකරමින් උණුසුම ඇතිකර ගැනීමට උත්සාහ ගත් අසරණ දැරියක් අවසන මරණයට පත් වන්නී ය. ගිනිකූරු විකුණමින් තම ජීවිකාව ගෙනයාමට පියාට උපකාර කරන්නී; ඇයට එක ම ගිනිකූරකුදු විකුණා ගත නොහැකි වූ තැන කුස ගින්නෙන් පීඩිත ව අසරණියක සේ මරු වැළඳ ගන්නී ය. මෙම කතාන්දරවලින් සිදු වන්නේ ළමයින්ගේ මනස අවදි කිරීමක් සේ ම නොදැනුවත්ව ම සදාචාර දහම් ප්‍රචලිත කිරීම ය. සැමුවෙල් ජොන්සන් නමැති සුප්‍රකට විචාරකයා සඳහන් කරන්නේ 'කුඩා දරුවන් ප්‍රිය කරන්නේ ළදරුවන් ගැන කතා ඇසීමට වඩා යෝධයන්, අහස් මාලිගා ගැන කතා ඇසීමට' බව ය.

බටහිර සුරංගනා කතාවන්ට නොදෙවැනි කතා විශේෂය වන්නේ රුසියානු සුරංගනා කතා ය. සරල ආකෘතියක සිට සංකීර්ණ ආකෘති දක්වා විහිදෙන ආඛ්‍යාන රටාවලින් යුත් කතා විශාල ප්‍රමාණයක් එම කතා අතර දක්නට හැකි ය. රුසියානු කතන්දරවල පෙනෙන්නට තිබෙන මුඛ්‍ය කාරණය වන්නේ, මානුෂීය ගුණ දහම් රෝපණය කිරීමේ අරමුණින් හා අවශ්‍යතාවෙන් මඬනා ලද්දන් විසින් රචනා කරනු ලැබ තිබීම ය. රුසියානු නවකතාවල දක්නට ලැබෙන මානවවාදී

ලක්ෂණය නොඅඩු ව සුරංගනා කතාවල ද දක්නා ලැබේ. විවිධ විචාරක මතයන්ට අනුව, ඉන්ද්‍රජාලික කතා මගින් සමාජයෙන් උගත් කතාවන් වඩාත් ගැඹුරින් අවබෝධ කර ගැනීම, මිනිස් භාවයන් සැඟවුණ ස්ථානවලින් අවදි කරවීම ආදිය අපූර්ව පරිකල්පන ශක්තියකින් සිදු කෙරෙයි. රුසියන් සුරංගනා කතා එකතුවක් වන 'ලස්සන වසිලීස්සා' කෘතියෙහි දක්නට ලැබෙන කතා කිහිපය මෙම තත්වය අතින් එදා මෙදාතුර ළමා මනස රංජනය කළ බව කිව හැකි ය. ලස්සන කුමාරිකාවන්, කුමාරයන්, සොහොයුරු සොහොයුරියන්, යක්ෂණියන්, හංසයින්, මාළුවන්, කොබෙයියන් හා අශ්වයින් යන විවිධ පාත්‍ර ගණයන්ගෙන් සමන්විත කතා ප්‍රවෘත්ති රැසක්ම දැකිය හැකි ය. මෙහි දක්නට ලැබෙන ප්‍රධාන වූත් නපුරු වූත් චරිතයක් වශයෙන් බබයිගා යකින්න හැඳින්වීමට පුළුවන. ඇයගේ ග්‍රහණයට නතු වන විවිධ කථානායක-නායිකාවන් ඇගෙන් ගැල වී පලා යාම; ළමා මනසේ නොමඳ කුතුහලය දනවන්නකි. ඇය වෙසෙන නිවාසය හා අවට පරිසරය ත්‍රාසය ජනනය කරන්නේ ය. ඇගේ 'ගෙවැට හදලා තියෙන්නේ මිනී කටුවලින්. වැටෙහි කණු උඩ මිනී ඔළු. වැටෙහි ගේට්ටුව මිනී කටු ඇටවලින් හදලා. වැටේ අගුල මිනී අත් ඇටවලින් හදලා. ගෙවැටේ යතුරු ඉබ්බා වෙනුවට මිනී දත්' ය. මේවා ළමයාගේ මනසෙහි රූප සටහන් ලෙස ඇඳීමෙන් සංස්කෘතික විඥානය නිරායාසයෙන් මනසේ තැම්පත් වේ. අද්භූත කතාවලින් හා ප්‍රකාශයන්ගෙ න් නිර්ණය කෙරෙන්නේ ඒ ඒ රටවල සංස්කෘතියයි. ඒ සඳහා ඔවුහු තම ජනශ්‍රැතිය උපයෝගී කර ගෙන සංකල්පීය බලපෑමක් සිදු කරති. සුජාත සංස්කෘතික මිනිසෙකු බිහි කිරීම සඳහා ළමා මනස හැඩ ගැස්වීමේ දී මෙම කතන්දරවලින් සිදු වන මෙහෙය අතිමහත් ය.

ලස්සන වසිලීස්සා කෘතියෙහි දක්නට ලැබෙන සෑම කතාව ම පාහේ විශේෂ වටිනාකම්වලින් යුක්ත වන අතර එයිනුත් 'අලෝනුෂ්කා අක්කා සහ ඉවානුෂ්කා මල්ලී' යන කතාව ළමා පරිකල්පනය තීව්‍ර කරන අපූරු කවි පන්තියකින් ද සමන්විත ය. දෙමාපියන්ගේ මරණයෙන් අනතුරුව රැකියාවක් සොයා යන සහෝදරියට සහ සහෝදරයාට මුහුණ දීමට සිදු වන අමුතු අත්දැකීම් රැසක් මෙහි අන්තර්ගත වේ. අක්කාගේ අවවාද නොඅසන ඉවානුෂ්කා මල්ලී ඉන්ද්‍රජාලයකින් එළුවෙකු වන්නේ ය. අලෝනුෂ්කාව විවාහ කර ගැනීමට වෙළෙඳෙකු ඉදිරිපත් වූ අතර ඔහු ඇය වච්වාහ කොට ගත්තෙන්; එළුවා ද ඔවුනගේ තනියට නිවසට වී සිටියි. එක විටම නිවසට නපුරු යකින්නක් පැමිණ අලෝනුෂ්කාගේ ගෙලෙහි ගලක් බැඳ ඇය ගඟට තල්ලු කළා ය. තම අක්කාගේ පැමිණීම බලාපොරොත්තුවෙන් සිටින එළුවා හෙවත් මල්ලී කියන කවියට අක්කා ගඟ පතුළේ සිට ලබා දෙන්නා වූ පිළිතුර සහෝදරත්වයේ මනා බැඳීම කුලු ගන්වයි. එක් අංශයකින් බලන කල සහෝදර ප්‍රේමයේ ගැඹුරුම අවස්ථාවක් ළමා පාඨකයන් වෙත ගෙන ඒමට මෙම කතා කරුවන් මහත් සේ උත්සාහ ගත් බව කිවයුතු මනා ය.

''අලෝනුෂ්කා මගෙ අක්කේ
පීනාගෙන මෙගොඩ එන්න
ගිනි ගොඩවල් ඇවිළෙනවා
යකඩ හට්ටි රත් කරලා
උල් පිහියා මුවත් කරල
මා මරන්න සැරසෙනවා'' යනුවෙන් එළුවා කරන ප්‍රකාශයට අක්කා දිය යට වී සිට මෙසේ කියයි.

''ඉවානුෂ්කා මගෙ මල්ලී
මා ඉන්නේ ගඟ පතුලේ
ගලක් බැඳල මගෙ බෙල්ලේ

යකින්න මා තල්ලු කළා''

අවසානය මිනිසුන් පැමිණ අක්කා බේරා ගැනීමඃ එළුවා නැවත මිනිස් වේශයට පැමිණීමඃ යකින්න අල්ලා දඬුවම් පැමිණවීමඃ වැනි අවස්ථා කිහිපයකින් යුක්තය. අවසාන මොහොතේ දී වරද කළ වුන්ට දඬුවම් පැමිණවීම සදාචාර සම්පන්න සමාජයක් ඇති කරලීම සංකේතවත් කරන්නකි. එබැවින් මෙම කතන්දර ළමයින්ගේ මනසේ තැම්පත් වී පුද්ගල පෞරුෂය මෙන් ම ස්වීයත්වය ද වර්ධනය කරවන්නේ ය.

සුරංගනා කතාවලට අයත් නොවුණ ද ෆැන්ටසි කතා හෙවත් මනඃකල්පිත කතා ගණයට ගැනෙන කතා රැසක් ද ළමා සාහිත්‍යයේ හඳුනා ගැනීමට පුළුවන. මේවා විකාරරූපී ස්වභාවයෙන් යුක්ත වන අතර යම් ආකාරයකට සුංගනා කතාවල ලක්ෂණ ද දැකිය හැකි ය. යථාර්ථ ලෝකයෙන් දුරස්ව ගෙතෙන කතා වුවත් යටිපෙළ අර්ථය යථාර්ථය ස්පර්ශ කරයි. එබඳු විකාරරූපී ෆැන්ටසි කතාවක් වශයෙන් ලුවිස් කැරොල් (Lewis Carroll) විසින් රචනා කරන්නට යෙදුණ Alice's Adventures in Wonderland නමැති කෘතිය හැඳින්විය හැකි ය. ඇලිස් නම් කුඩා දැරිය එක් අවස්ථාවක හාගුලකින් අපූරු ලෝකයක් වෙත ගමන් කරන අතර ඇය එහි දී අරුම පුදුම අත්දැකීම් සමුදායකට මුහුණ දෙන්නී ය. කැරොල් මෙහි දී ළමා මනස ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ ව දක්වන අදහසත් විකාරරූපී ස්වභාවයත් එකම කතාවක ගෙනහැර පෑමට සමත් ව තිබේ. ඇලිස් විසින් දකින ලද විස්මලන්තය කුඩා ළමයින් අතර බෙහෙවින් ජනප්‍රිය වීමට එය බලපාන්නට ඇත.

ළමා ජීවිතය හා ඔවුන්ගේ අත්දැකීම් ප්‍රතිපෝෂණය කරන ප්‍රධාන බලවේගයක් වශයෙන් පාසැල හෝ ගුරුගෙදර හැඳින්විය හැකි ය. අතීතයේ ගුරු ගෙදරත් පසු කලෙක පාසලත් බවට පත් වූ අධ්‍යාපනික ආයතන අධ්‍යාපනය ලබා දීම; ජීවිතයට අවශ්‍ය නොයෙකුත් අත්දැකීම්වලින් ළමයා පෝෂණය කිරීම; ආදි ස්වීය ලෝකය ගොඩනැගීමේ කාර්යයට දායක වෙයි. ළදරුවා මුලින් ම පාසලට යන්නේ, කෙතරම් අපහසුතාවකින් වුව ද කාලය ගතවන විට ඔහුට ඊට අනුගත වන්නට සිදු වෙයි. එක් අතකට දරුවා මවගෙන් ගලවා දුරස්ථ කිරීමක්; මව කෙරේ පැවති ආශාව අවරෝධණය කිරීමක්; එම අවස්ථාවේ දී සිදු වනැ'යි මනෝවිශ්ලේෂකයෝ ප්‍රකාශ කරති. කෙසේ වෙතත් එම කාලය තුළ සමවයස් ළමයින් අතර පවතින සබඳතාව, ඔවුනොවුන් සමඟ ගනුදෙනු කිරීමේ හැකියාව ආදි ලක්ෂණ වර්ධනය වන්නේ ය. අධ්‍යාපනය හා ළමාවිය පාදක කොට ගනිමින් ලිය වී ඇති ළමා නවකතා අතර රුසියානු නවකතාවලට හිමි වන්නේ අද්විතීය ස්ථානයකි. එම කතන්දර මගින් ළමා විය පිළිබිඹු කරනවා පමණක් නොව ළමා මනස තුළ අන්තර්ග්‍රහණය කර ගත යුතු මානවවාදී ගුණාංගයන් ද ප්‍රසාරණය කරයි. සමස්තයක් වශයෙන් රුසියානු නවකතාවල දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණය වූයේ මෙකී මානවවාදී බවයි. එය ළමා කතාවල ද බහා තැබීමට එරට රචකයන් ගත් උත්සාහය අගය කළ යුතු ය. ලෝකයේ වෙනත් කිසිදු රටක නොමැති තරම් මානව ගුණ ධර්ම රෝපණයට හා ඒවා උද්දීපණයට මුල් තැන දුන්නෝ රුසියානුවෝ ය. සුන්දර ළමා කාලයක අපූරු අත්දැකීම් විදහා දක්වන කෘතියක් වශයෙන් අලෙක්සෙයි තෝල්ස්තෝයි විසින් රචිත 'නිකීතාගේ ළමා කාලය' නමැති කෘතිය මෙහිලා හැඳින්විය හැකි ය. නිකීතා නමැති පුංචි පිරිමි ළමයා තම දෛනික කටයුතු සිදු කරන ආකාරය, මිතුරන් සමඟ පවත්වන සබඳතා සහ කාලය හා අවකාශය ඔහු අත්විඳින අයුරු මෙහි ප්‍රතිනිර්මාණය කර තිබේ. විශේෂයෙන් ම මෙම කතාව රචනා වී ඇත්තේ තැම්පත් නිෂ්ක්‍රීය චරිතයක් වටා නොවඃ සක්‍රීය, දඟකාර හා කෙළිලොල් දරුවෙකු වටා ය. කතා විකාශනය හා ආකෘතිය ගත් කල ළමා මනස කේන්ද්‍රීය කරන්නේ; ළමයාගේ වෛෂයික කලාපය ඔස්සේ චමත්කාරජනක කතාවක් කීමේ අභිප්‍රේතාර්ථය නිසාය. නිකීතාගේ ළමා කාලය කෘතියේ සඳහන් අර්කාදි ඉවානවිච් නිකීතාගේ ගුරුවරයා විය. ඔහු නිකීතාගේ නිවසෙහි නතර වී ඔහුට ඉගැන්වීම් කටයුතු කළේ ය. රතු යටි රැවුලක්න් යුත් ඔහු පුදුම දක්ෂ, හුරු බුහුටි මෙන් ම කවටකම් කරන අයෙකු වශයෙන් නිකීතා හඳුනා ගෙන තිබිණි.

රුසියන් ළමා කතාවල දක්නට ලැබෙන මානවවාදී දැක් ම ඇලෙක්සේයි තෝල්ස්තෝයි මෙම කෘතිය මඟින් විශද කරන අයුරු උසස් ය; ප්‍රගතිශීලි ය. නිකීතා ගුරුතුමාගෙන් ගණන් පාඩම ඉගෙන ගන්නා මොහොතේ ඔහුගේ පරිකල්පනමය ලෝකය විවර වන්නේ ය. ඔහුට ගණනින් කම් නැත; විකිණූ ප්‍රමාණය හෝ අත ඉතිරිය කම් නැත; ගණන් පාඩමේ සිටින වෙළෙන්දාගේ ස්වරූපය විනා අන් යමක් ඔහුගේ මනසට නොයේ.

'' වෙළෙන්දා නිල් පාට රෙදි යාර කීපයක් විකිණුවා. එක යාරයක මිල රූබල් තුනයි කොපෙක් 64යි. ඒ වගේ ම කළු පාට රෙදි යාර...' නිකීතා ගණන් පාඩම කියවන්නට විය. හැමදා මෙන්ම අදත් ඔහුට ගණිත පාඩම්වල ඉන්න වෙළෙන්දා මැවී පෙනෙයි. ඔහුගේ කබාය දිගු ය. එහි දූවිලි ගෑවිලා ය. ඔහුගේ මුහුණ කහපාටය, මූසලය, පැතලිය, වේළිලාය. ඔහුගේ කඩය ගුහාවක් මෙන් ඇඳිරිය. දූලි සහිත රාක්කයේ රෙදිකෑලි දෙකක් තිබිණි. වෙළෙන්දා තම කෙට්ටු අත්වලින් රෙදි කෑල්ල ගෙන මලානික නෙත්වලින් නිකීතා දෙස බැලී ය.

'නිකීතා ඔබ සිතන්නේ මොනවා ගැන ද? වෙළෙන්දා විකුණූ මුළු ප්‍රමාණය රෙදි යාර දහ අටයි. නිල් පාට රෙදි කොපමණ විකුණුව ද, කළුපාට රෙදි කොපමණ විකිණුව ද?' ගුරුතුමා ප්‍රශ්න කළේ ය.''

මෙයින් විශද වන්නේ නිකීතා තුළ පැවති මානවවාදී ලක්ෂණයයි. ගුහාවක් මෙන් ඇඳිරි වූ කඩයට වී රෙදි විකුණන වෙළෙන්දා පීඩිත පන්තිය නියෝජනය කරන කෙනෙකු'යි හැඟී යයි. ඔහුගේ මුහුණ අවලස්සන ය; පඬුවන් පැහැයෙන් යුක්ත ය; දකින විට ප්‍රිය නූපදී; ධනේශ්වර සමාජය සමඟ ආර්ථික අවපාතයෙන් ඔහු ගැටෙන්නේ ය. නිකීතාගේ චරිතය හරහා එකී තත්වයන් මතුකර දැක්වීමට ගෙන ඇති උත්සාහය වැදගත් ය.

නිකොලායි නෝසොව් විසින් රචනා කරන්නට යෙදුණ 'වීත්යාගේ ඉස්කෝලේ' නමැති කෘතිය ද ළමා ප්‍රබන්ධයන් අතර විශේෂ වටිනාකමකින් යුක්ත ය. මෙහි කථා නායකයා සෝවියට් යුගයේ පාසලක ඉගෙනුම ලබන දරුවෙකි. සෙසු දරුවන් සමඟ ඔහු ඇති කර ගන්නා සබඳතාව හා අධ්‍යාපන ආයතන තුළ ක්‍රියාත්මක වෙන ක්‍රියා පටිපාටීන් ආදිය මෙහි දී අත්විඳිය හැකි ය. ළමුන් සහජයෙන් ම ඇති කුතුහලය, දඟකාර මුරණ්ඩු බව සේම විචක්ෂණශීලී බව කතා රසයට හේතු වී ඇත. එක් අතකින් මෙම කෘතිය මඟින් සෝවියට් රුසියාවේ අධ්‍යාපනය පිළිබඳ යම් ඉංගිතයක් ද ළමා මනසට කාවද්දා ඇත.

ආර්. කේ. නාරායන්ගේ ඇතැම් ග්‍රන්ථයන් මෙම ශානරයටම අයත්ය. ඒවාහි එන ළමා චරිත ඔස්සේ ඉන්දියානු සමාජය නිරීක්ෂණය කිරීමට නාරායන් උත්සාහ ගෙන තිබේ. ඔහුගේ සෙසු කෘතිවලටත් පාදක වූ මල්ගුඩි පෙදෙස කතා පරිසරය වශයෙන් ගෙන නිර්මාණය කළ කෘතියකි 'ස්වාමි සහ යහළුවෝ'. මෙහි කථානායකයා ස්වාමිය; ඔහු වයස අවුරුදු දහයක පමණ දරුවෙකු වන අතර ළමා වයසින් ගත යුතු උපරිම ආස්වාදය විඳ ගැනීමට කටයුතු කරන්නෙකි. නිවසත් පාසැලත් ඔහුට වැටකඩොළු බැඳි ස්ථාන විය. කථාවින්‍යාසයත් ආකෘතික විශේෂත්වයත් අතින් ගත් කල ළමා මනස සංස්පර්ෂණය කිරීමට නාරායන් සමත් වී ඇති බව කිව හැකි ය. විශේෂයෙන් ම පාසල සම්බන්ධයෙන් ළමයින්ගේ සිත් තුළ තිබෙන අමනාපය මැනවින් ප්‍රකාශ කිරීමක් වශයෙන් ස්වාමි සහ යහළුවෝ කෘතියේ ආරම්භක පරිච්ඡේදය සාක්ෂ්‍ය දරයි.

''එදින සඳුදාවකි. ස්වාමිනාදන්ට උදෙන්ම අවදි වන්නට සිතුණේ නැත. ඔහුට දෑස හරින්ටද සිතක් නාවේය. දින දර්ශනයේ ඇති මූසලම දවස දඳුදා ය. සෙනසුරාදාත් සඳුදාත් පැවති මිහිරි නිදහස් සුවයෙන් පසුව, සඳුදා දවසට මුහුණ දී වැඩ කරන්නටත් විනය රකින්නටත් සිදුවීම, ඇත්තටම කාලකණ්ණිකමකි. පාසල ගැන සිහි වූ සැණින්ම ස්වාමිනාදන්ගේ ඇඟ කිලිපොළා ගියේය. කහපාට මුඩුම ගොඩනැගිල්ල. ගින්දර පිටවන ඇස් ඇති වේදනායගම් නමැති පන්තිභාර ගුරුවරයා, සිහින් දිග වේවැලක් නිතරෝම අතැතිව සිටින ලොකු ඉස්කෝල මහත්තයා...''

මෙයින් ගම්‍ය වන්නේ, ස්වාමිනාදන් පාසල පිළිබඳ ව දක්වන ආකල්පයයි. සෙනසුරාදා හා ඉරිදා කෙළි කවටකමින් ගත වන ජීවිතය සඳුදා දිනයේ දී වෙනස් වේ. පාසලට යෑම සඳහා සිත සාදා ගත යුතු ය; පාසලෙන් දුන් ගෙදර වැඩ කළ යුතු ය. ඔහු විසින් ගෙදරවැඩ කරනු ලබන්නේ සඳුදා උදෑසන වීම ඔහු පාසල් යාමට දක්වන අප්‍රියතාව පෙන්නුම් කරන්නකි. සූපරීක්ෂාකාරී ලෙස තෝරා ගන්නා ලද අවස්ථා සිද්ධීන් ළමා මනසකින් දකින ආකාරයට පාඨකයා වෙත ඉදිරිපත් කිරීමට නාරායන් කටයුතු කොට තිබේ. ග්‍රැහැම් ග්‍රීන් නමැති යුරෝපීය විචාරකයාගේ අදහසට අනුව ස්වාමි සහ යහළුවෝ කෘතිය විශිෂ්ට නිර්මාණයක් වන්නා සේම භාරතීය ජීවිතයේ හදගැස්ම හඳුනා ගත් ලේඛකයා නාරායන්වීම ද විශේෂත්වයකි.

**සමාලෝචනය**

තතු මෙසේ හෙයින්, ළමා සාහිත්‍ය වූ කලී ළමයින් විසින් අත්විඳින ලද භෞතික අභෞතික ලෝකය අපූර්වත්වයෙන් ප්‍රතිනිර්මාණය කිරීම ය. ඒ සඳහා යථාර්ථවාදී කතා, සුරංගනා කතා, විකාරරූපී කතා හා ඉන්ද්‍රජාලික කතා ආදි විවිධ ශානරයන් යොදා ගන්නා බව අවධාරණය කළ හැකි ය. ළමා මනසෙහි සුන්දරත්වය හා පෞරුෂ සංවර්ධනය සඳහා මනස බලපාන ආකාරය අවබෝධ කර ගැනීමට මෙකී නිර්මාණවලින් ලැබෙන පිටුබලය අති මහත් ය. සමාජ සදාචාරය වෙනුවෙන් ආචාර ධර්ම සංකල්පයන් ගොඩනැගීමට මෙම කෘති ලියූ ලේඛක ලේඛිකාවෝ මහත් උනන්දුවක් දැකූ වූ බව උක්ත කෘති අධ්‍යයනය කරන කල පැහැදිලි වේ. ස්ත්‍රියක හෝ පුරුෂයෙකු වශයෙන් වර්ධනය වන ළමයාගේ ස්වීයත්වය, ඌණ වර්ධනයකට පත්නොවී වඩා සංවර්ධිත මට්ටමකට පත්වීම සඳහා මෙකී සාහිත්‍ය ශානරයන්ගෙන් ලැබෙන්නේ පිටිවහලකි.

## ආශ්‍රිත මූලාශ්‍ර


ඩිකන්ස්, චාල්ස්. (2016). ඔලිවර් ට්විස්ට්. (පරි.) ඇම්. ඇම්. පියවර්ධන. මීරිගම. ආශිර්වාද ප්‍රින්ටර්ස්,

පෙරේරා, ටෙනිසන්. (2017). රට රටවල ජනප්‍රිය සුරංගනා කතා (පරි.). නුගේගොඩ. සරසවි ප්‍රකාශකයෝ,

රුද්‍රිගු, දැදිගම වී. (2012). ලස්සන වසිලීස්සා (අනු.). කොළඹ. සී/ස ප්‍රගති ප්‍රකාශන නිවස

තෝල්ස්තෝයි, ඇලෙක්සේයි. (2016). නිකීතාගේ ළමා කාලය (පරි.) දැදිගම වී. රුද්‍රිගු, කොළඹ ජේ. ඇන්ඩ් ඩී පබ්ලිෂිං හවුස්

නෝසොව් , නිකොලායි. (2015). වීත්යාගේ ඉස්කෝලේ (පරි.) මහින්ද සෙනරත් ගමගේ, සුභාවි ප්‍රකාශන,

නාරායන්, ආර්. කේ. (2010). ස්වාමි සහ යහළුවෝ (පරි) ඩබ්ලියු. ඒ. අබේසිංහ. කොළඹ. ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවට්) ලිමිටඩ්

Beare, Emma. (2007). Must Read Books-501, An Hachette UK Company

# வாசிப்புக் கலையாக வேண்டும்!

- செ. அன்புராசா அடிகள் - முல்லைத்தீவு

## நூல்கள் புத்துயிர் கொடுப்பவை

மாவீரன் பகத்சிங் தூக்குத் தண்டனைக் கைதியாக சிறை வைக்கப்பட்டிருந்தான். தண்டனை நிறைவேற்றும் நாள் வந்தது. அன்றும் ஆர்வத்தோடு ஒரு நூலைப் படித்துக் கொண்டிருந்தான். அது, லெனினின் வாழ்க்கை வரலாற்றைச் சித்தரிக்கும் ஒரு நூல். தண்டனையை நிறைவேற்ற சிறைக்காவலர்கள் வந்து பகத்சிங்கை அழைத்தார்கள். அப்போது பகத்சிங், ''தயவுசெய்து ஐந்து நிமிடங்கள் பொறுத்துக் கொள்ளுங்கள்! இங்கே, ஒரு புரட்சியாளன் இன்னுமொரு புரட்சியாளனோடு உரையாடிக் கொண்டிருக்கிறான்..!'' என்றானாம்.

இதனால் தானோ என்னவோ, 'துப்பாக்கிகளை விட பயங்கரமான ஆயுதங்கள் நூல்கள்' என்றார் மாட்டின் லூதர் கிங். 'அணுக்குண்டு ஒருமுறை தான் வெடிக்கும் நல்ல நூல்கள் பக்கத்திற்குப் பக்கம் வெடிக்கும்' என்றார் கால் மாக்ஸ். 'நல்ல நூல்கள் சிந்தனை நிரம்பிய பீரங்கிகள்' என்றார் மாண்டேயின். ஆக, நல்ல நூல்களின் வாசிப்பு வாசகர்களை மிக உயர்ந்த இலக்குகளை அடையத் தூண்டுவதை பலருடைய வாழ்க்கை அனுபவங்களில் இருந்து பார்க்கலாம்.

இவ்வுலகத்தில் வாழ்ந்த பல பெரியவர்களை அறிஞர்களை தொண்டர்களை அறிந்து கொள்வதற்கு மிகவும் உதவியாக இருப்பது அவர்கள் எழுதிய நூல்கள் அல்லது அவர்களைப் பற்றி எழுதப்பட்ட நூல்கள் ஆகும். அவ்வகையில் நூல்கள் காலங்கள் கடந்தும் வாழ்பவை. நூலை எழுதியவரோ அல்லது யாரைக் குறித்து எழுதப்பட்டதோ அவர்கள் உயிருடன் இல்லாது போனாலும் படிப்பவர்க்கு அவர்களை உயிரோடு படம் பிடித்துக் காட்டும் ஒப்பற்ற ஓவியமாக நூல்கள் விளங்குகின்றன.

## நூல்கள் உயிரூட்டுபவை

'மனிதனின் கண்டுப்பிடிப்புக்களில் மிகச் சிறந்தது நூல்கள்' எனக் குறிப்பிடும் அல்பெட் அயன்ஸ்ரையின், நியுட்டனின் 'பிறின்சி பியா' வாசித்ததன் வழியாக தான் மீண்டும் பிறந்த அனுபவத்தைப் பெற்றுக்கொண்டதாகக் கூறுவார். இவ்வனுபவமானது, வாசித்தல் ஒரு மனிதனுடைய வாழ்வில் எத்தகைய ஆழ்ந்த அனுபவத்தையும் அதனூடாக அறிவியலையும் புதிய கண்டுப்பிடிப்புக்களையும் தூண்டி விட்டிருக்கின்றது என்பதைப் புலப்படுத்துகின்றது.

இந்த வகையில் தான் அமெரிக்க எழுத்தாளரான கில்பர் வைறயாத் என்பவரின் அனுபவமும் அமைந்து விடுகிறது. அவர் கூறுகையில், 'நூல்கள் வெறும் காகிதங்களின் குவியல் அல்ல. அவை அலுமாரிகளில் இருந்து நம்மை வழிநடத்திச் செல்லும் உயிரோடு இருக்கும் மனிதர்கள்' என்கிறார். நூல்கள் நல்வழிகாட்டிகளாக மட்டுமல்ல அவை சுட்டி நிற்கும் இலக்கை நோக்கி தொடர்ந்து இயங்கவும் துணைபுரிகின்றன.

மாட்டின் லூதர் கிங் அவர்களின் சுயசரிதையை வாசித்ததன் வாயிலாக நெல்சன் மண்டேலா அகிம்சைப் போராளியானதாக அவரே கூறுகிறார். வாசிப்பு, மனிதர்களை பெரும் தலைவர்களாக மட்டுமல்ல அவர்களை வளரும் தலைமுறையினருக்கு வகை மாதிரிகைகளாகவும் மாற்றி விடுவதை இங்கு காணலாம். வாசிப்புக்கு அத்தகைய வாண்மை இருக்கின்றது. வாசிப்பதால் சிந்திக்கும் சக்தி பிறக்கின்றது. அதனூடாக, வாசிப்பவனை சிகரம் தொடவைக்கின்றது.

வில் குராண்டின் தத்துவ ஞானத்தை வாசித்து அறிய வந்ததன் மூலம், உளவியல் மேதை சிக்மன் புரொயிட்டின் உலகை ஆழ்மனம் ஆட்கொண்டதாக அவரே பின்நாளில் சொல்கின்றார். இவ்வாறே, ககனின் சமூகவியல் சிந்தாந்தக் குறிப்புக்கள் அடங்கிய நூல் கால் மாக்ஸ்சின் சிந்தனையைத் தூண்டியதாக அவரே பிற்காலத்தில் எடுத்துக் கூறுகின்றார்.

ஆக, நூல்கள் மனிதர்களை வழிநடத்திச் செல்லக்கூடிய ஆற்றல் வாய்ந்தவை, திறன் பெற்றவை. நூல்கள் ஊக்கத்தையும் உச்சாகத்தையும் தந்து மனிதர்களை ஆக்க சக்தியாக மாற்றும் அபூர்வ வேட்கை கொண்டவை என்பது பலருடைய வாழ்க்கை அனுபவங்களில் இருந்து உணர்ந்து கொள்ளக்கூடிய உண்மையாக இருக்கின்றது.

அதனால் தான், 'சில நூல்களை சுவைக்க வேண்டும். சிலவற்றை அப்படியே விழுங்கி விட வேண்டும். சில நூல்களை மட்டும் கொஞ்சம் கொஞ்சமாக அசைபோட்டு சமிபாடு அடையச்செய்ய வேண்டும்' என்றார் ஆங்கில அறிஞர் பேகன். அந்தளவிற்கு மனிதனுடைய அறிவோடும் ஆற்றலோடும் அவனின் வளர்ச்சியோடும் முன்னேற்றத்தோடும் இரண்டறக் கலந்ததாகி விடுகின்றது வாசிப்பு!

## வாசித்தல் இன்றியமையாதது!

ஆக, வாசித்தல் மனிதனுக்கு இன்றியமையாதது என்றாகின்றது. சக்தி நிறைந்த உணவு எப்படி உடல் சுகத்தினைத் தந்து மனிதர்களாக வாழ வைக்கின்றதோ அதுபோல நல்ல வாசிப்பு நல்லறிவோடும் ஆற்றலோடும் நல்லனுபவங்களோடும் மனிதர்களை வாழ வைக்கிறது எனலாம்.

ஐக்கிய நாடுகள் சபை வாசித்தலை மனிதனின் அடைப்படைத் தேவைகளுள் ஒன்றாக வரிசைப்படுத்தாது விடினும் மனிதனுக்கு வாசிப்பது அடிப்படையாகின்றது, இன்றியமையாதது என்பது தெளிவாகின்றது. ஏனெனில் வாசித்தல் மனிதனை மனிதனாக வாழவைக்கின்றது என்று கூறி விடலாம். அதிலும் சில வாசகர்களை வாசிப்பு மாமனிதர்கள் ஆக்கிவிடுகின்றது என்று கூட நிறுவலாம். மேற்சொன்ன உலகப் பிரசித்திபெற்ற பெரியோர்களும், தத்துவ ஞானிகளும், மேதைகளும், கண்டுப்பிடிப்பாளர்களும் இன்னும் எத்தனையோ அறிஞர்களும் வாசித்ததால் மிகப்பெரும் ஆளுமைகளை வளர்த்துக் கொண்டதோடு அவர்கள் உலகை வாழ்வித்தார்கள் என்பது வரலாறு கற்றுத் தருகின்ற மிகப்பெரும் பாடமாகும்.

ஆகவே தான், 'வாசிப்பதால் மனிதன் பூரணமடைகிறான்' என்று நம் முன்னோர்கள் அழகாகச் சொல்லி வைத்தார்கள். இச்சிந்தனையை ஆங்கிலத்தில், 'Reading makes man perfect' எனச் சொல்கிறார்கள். இப் பொன்மொழி, தமிழிலிருந்து ஆங்கிலத்திற்கு வந்ததா அன்றேல் ஆங்கிலத்திலிருந்து தமிழுக்கு வந்ததா என்பது ஆய்வுக்குரியது. ஆனால், அவை கற்றுத்தரும் பாடம் ஒன்று தான் வாசிப்பதால் மனிதன் திருப்திக்கொள்கின்றான், நிறைவடைகின்றான், முழுமைபெறுகின்றான் என்பதாகும்.

### சரியான இடை நிறுத்தங்கள் இல்லையேல் மனவருத்தம் தான்!

அபிரும் அவன் மனைவியும் அயல் வீட்டு தம்பதியினரும் சேர்ந்து, கொண்டாட்டம் ஒன்றிற்குப் போவதற்கு ஏற்கனவே திட்டமிட்டிருந்தார்கள். குறித்த அந்நாள் காலை அயல் வீட்டுப் பெண் அரச அலுவலகம் ஒன்றில் வேலைப் பார்ப்பதால் அங்கிருந்து அபிருக்கு நான்கு வார்த்தைகளில் சிறிய மின்னஞ்சல் ஒன்றை அனுப்புகிறாள்.

அதில், ''யார்யாரெல்லாம் கொண்டாட்டத்திற்குப் போகயிருக்கிறோம்?'' எனக்கேட்டு எழுதுகின்றாள். அபிர், 'நான் உன் புரிசன் நீ என் மனைவி' எனப் பதில் அனுப்புகின்றான். இப்பதிலை வாசித்த அப்பெண் அதிர்ச்சியில் உறைந்து போகின்றாள்.

இதனை அவதானித்த அலுவலகத்தில் இருந்த அவளுடைய நண்பி விடயத்தை வினவுகின்றாள். பின்பு அவளே மின்னஞ்சலைப் படித்துவிட்டு அதிர்ச்சியில் ஆடிப்போன நண்பிக்கு விளங்கும்படி சொற்களுக்கிடையே இடைநிறுத்தங்களைச் செய்து மின்னஞ்சலை மீண்டும் சரியாக வாசித்துக் காட்டுகின்றாள்: ''நீ நினைப்பது போல, 'நான் உன் புருசன், நீ என் மனைவி' என எழுதப்படவில்லை! 'நான், உன் புரிசன், நீ, என் மனைவி' என்றே நீ புரிந்துகொள்ள வேண்டும்!'' என விபரித்து நின்றாள்.

### விளக்கமாக வாசிக்காவிடில் வில்லங்கந்தான்!

வாசிப்பதை – படிப்பதை விளக்கமாக சரியாக வாசித்துப் புரிந்துகொள்ள வேண்டும். விளக்கமாக வாசிக்கவில்லை என்றால் வில்லங்கத்தில் தான் முடியும் என்பதற்கு மேற்சொன்ன நிகழ்வு ஓர் உதாரணமே. 2012 இல் 'திருப்பத்திற்கான தேடல்கள்' என்ற என் நூலை வெளியிட்டிருந்தேன். அதனைப் பெற்றுக்கொண்டவர்களில் ஒருவர் சில நாட்களின் பின் சந்தித்த போது, ''உங்கட திருப்பதிக்கான தேடல்கள் சுப்பரா இருக்குது பாதர்!'' என்றார். அடுத்த கணமே அவரிடம், 'திருப்பதியைத் தேடவேண்டிய தேவையில்லை! அது இருந்த இடத்தில் இருக்கும்! அப்படித் தேடவேண்டிய தேவையேற்பட்டால் உங்களுக்குச் சொல்லியனுப்புகிறேன்!'' என்று சொன்ன முறையைப் பார்த்து தன்னிலை உணர்ந்தவராக, ''மன்னிக்க வேணும்! வாய் தடுமாறி 'திருப்பத்திற்கான' என்பதை 'திருப்பதிக்கான' எனச் சொல்லிவிட்டேன்!'' என்றார்.

'நல்ல காலம், வாய் தான் தடுமாறியிருக்கின்றது, மூளை தடுமாறிச் சொல்லவில்லை!' என மனதுக்குள் என் கோபத்தை ஆற்றுப்படுத்திக் கொண்டேன். ஒரு நூலினுடைய தலைப்பையே இவ்வாறு வாசிக்கின்றார்களே என்றால் நூலினுள் இருக்கும் விடயங்களை எப்படியெல்லாம் கூறுவார்களோ! என்ன செய்வது? இவர்களைப் போன்றவர்களை நகைச்சுவை நடிகர் கவுண்டமணி கூறியது போல 'கொக்கா மக்கா'

என்ற வகைப்படுத்தலுக்குள் சேர்த்துக்கொள்ள வேண்டியது தான்!

தலைப்பாக இருந்தாலென்ன நூலின் உள்ளடக்கமாக இருந்தாலென்ன சரியாக விளங்கி வாசிப்பது, பொருள் உணர்ந்து வாசிப்பது, சொற்களுக்கிடையே சரியான இடைநிறுத்தங்களை மேற்கொண்டு வாசிப்பது வாசிப்பதன் பொருளைச் சரியாகவும் முழுமையாகவும் புரிந்துகொள்ள எப்போதும் உதவியாக இருக்கும்.

## வாசிப்பது குறைந்து வருகிறதா?

ஒப்பீட்டளவில் வாசித்தல் குறைவடைந்து வருகிறது என்ற கவலையை இன்று பலரும் வெளிப்படுத்தி வருவதை அவதானிக்கலாம். அதற்குக் காரணங்கள் பல இருப்பினும் அவற்றுள் ஒன்று நவீன தொடர்பு சாதனங்களின் வருகையும் அவற்றின் பெருக்கமும் ஆகும்.

குறிப்பாக, கையடக்கத் தொலைபேசி, மடிக்கணனி, முகநூல், இணையம், தொலைக்காட்சி போன்றவற்றின் அதீத பயன்பாடும் பாவனையும், இவற்றோடுள்ள அதீக ஈடுபாடும் அதிக நேரத்தை விழுங்கி விடுவதால் தரமான நூல்களை, இலக்கிய இரசனையுள்ள ஆக்கங்களை வாசித்தல் - படித்தல் போன்ற நற்பழக்க வழக்கங்கள் நலிவடைந்து வருவது ஒருவகையில் துரதிஸ்டவசமானதே!

எனினும், நவீன தொடர்பு சாதனங்கள் ஊடாகவும் வாசிக்கிறார்கள் என்பதையும் மறுப்பதற்கில்லை! அவற்றின் மூலமாகவும் வாசிப்பை செய்யக்கூடிய வாய்ப்புக்கள் அதிகம் இருக்கின்றது. ஆயினும், நவீன தொடர்பு சாதனங்களின் ஊடாக வாசிப்புப் பெறுகிற இடம் ஒரு நூலை எடுத்து வாசிப்பது போன்ற உணர்வினைத் தருவதில்லை என்பதையும் ஏற்றுக்கொள்ள வேண்டியிருக்கிறது.

எனவே தான், நவீன தொடர்பு சாதனக் கருவிகளின் பாவனையின் மட்டில் - பயன்பாட்டில் மட்டில் கவனம் எடுப்பது அனைவருக்கும் நன்மை பயக்கக்கூடியது. இவ்விடயத்தில், சிறப்பாகப் பெற்றோர் தங்கள் பிள்ளைகள் மீது கவனம் செலுத்துவது இந்நாள்களில் கட்டாயமானதும் இன்றியமையாததுமான தேவையாக உருவாகி வருகிறது. தேவையற்ற, அதீத பயன்பாட்டினைச் சிறுவயதிலிருந்து முற்றாகக் குறைப்பது பிள்ளைகள் நேரத்தை ஆக்கபூர்வமான செயற்பாடுகளில் செலுத்த உதவியாக இருக்கும்.

## மேற்குலகத்தவரிடம் வாசிப்பது இயல்பாக இருந்துவருகிறது!

மேற்குலகத்தவரிடம் இருந்து கற்றுக்கொள்வதற்கு நிறைய விடயங்கள் உள்ளன. அவற்றுள் ஒன்று வாசிப்புப் பழக்கமாகும். பொதுவாக அவர்கள் அனைவரிலும் சிறுவயது தொடக்கம் வாசிப்புப் பழக்கம் இயல்பாக இருந்து வருவதை அவதானிக்கலாம். மேற்குலகத்தவரைப் பார்க்கின்ற போது அல்லது புலம்பெயர்ந்திருக்கின்ற நம்மவர்களின் இரண்டாவது தலைமுறையினர் நம் தேசம் வந்து செல்கின்ற போது இவ்விடயத்தை அவதானிக்கலாம். சும்மா இருக்கின்ற போதும், ஓய்வாக இருக்கின்ற போதும் அல்லது நேரம் ஒதுக்கியும் வாசிப்பதில் ஈடுபடுகின்றார்கள். அங்கு பாடசாலைகளிலேயே சிறுவயது முதல் வாசிப்புப் பழக்கத்தை ஏற்படுத்தி விடுகிறார்கள். வாசிப்பு என்ற இத்தொட்டில் பழக்கம் ஆயுள் பூராகவும் அவர்களுடன் தொடர்கின்றது.

வயதுக்கு ஏற்ப, வாசிக்கும் ஆர்வத்தைத் தூண்டக்கூடிய நூல்களை அவர்கள் அறிமுகம் செய்து ஊக்குவிப்பதால் வாசிப்புப் பழக்கத்தை - வாசிப்புக் கலையினை அவர்கள் வளர்த்தெடுத்து அதனூடாக அவர்கள் வளர்ந்து வருகிறார்கள். மேற்குலகில் நான்கு ஆண்டுகள் வாழக்கிடைத்த காரணத்தினால் இவ்விடயத்தை அவர்களில் கண்டு இவ்வாசிப்புக் கலையின் பயன்பாட்டினை அனுபவிக்கக் கூடியதாக இருந்தது.

## வாசிப்புக் கலாசாரம் வளர வேண்டும்

நம் நாட்டில் வாசிப்புப் பழக்கத்தை சிறுவயதிலிருந்தே மாணவர்களின் வாழ்க்கை முறையில் உருவாக்க கல்வித் திட்டத்தில் சில நடைமுறைகள் இருந்தாலும் எத்தனை கல்வி அதிகாரிகள் - அதிபர்கள் - ஆசிரியர்கள் - பெற்றோர்கள் இதன் மட்டில் அக்கறை காட்டுகின்றார்கள் என்பது மலைபோல் எழுந்து நிற்கும் கேள்வி!

பொதுவாக, பாடத்திட்டத்தை முடிப்பதும், எப்படியும் தங்கள் பாடசாலையை - கோட்டத்தை - வலயத்தை - மாகாணத்தை முன்னணிக்குக் கொண்டு வந்து (கொண்டு வருவதில் தவறில்லை. எதனைக் கொண்டு வர முயல்கின்றார்கள்!?) தாங்கள் எதிர்பார்க்கின்ற உயர் புள்ளிகளை அடைந்து விட வேண்டும் எனத் துடிக்கின்றார்கள். இவ்வாறனவர்கள் வாசிப்பு, சுய தேடல், படைப்பாக்கம் போன்ற நற்பழக்கங்களை மாணவர்கள் மத்தியில் எப்படி உருவாக்கப் போகிறார்கள்?

நூல்களின் பயன்பாடும், நூலகங்களின் பயன்பாடும் பிள்ளைகளுக்கு கல்வி முறையிலேயே கொடுக்கப்பட வேண்டும். இதனை எத்தனை ஆசிரியர்கள் தங்கள் கல்வி கற்பிக்கும் முறைமைக்குள் வைத்திருக்கிறார்கள்? தங்கள் துறைக்கு அப்பால் அதாவது அவர்களின் பாடத்திட்டத்திற்கு வெளியே மாணவர்களின் இரசனைக்கு ஏற்ப அவர்கள் வாசிக்கக்கூடிய வகையில் அவர்கள் வளரத்தூண்டுகின்றார்களா? அல்லது அவர்களுக்கு வேறுவேறு துறைகளில் வாசிக்க ஊக்குவிப்புக் கொடுக்கப்படுகின்றதா?

முதலில் கல்விப் பணியில் ஈடுபடுகின்றவர்களில் எத்தனை பேர் நல்ல வாசகர்களாக இருக்கின்றார்கள்? எத்தனை பேர் தங்கள் துறைக்கு அப்பால் சென்று நல்ல நூல்களை வாசிக்கின்றார்கள்? சிலர் தங்கள் பாட நூலையே ஆயத்தம் செய்யாமல் கற்பிக்கப் போவதும் - அரைத்த மாவையே பல ஆண்டுகளாக அரைத்துக் கொண்டு அதாவது எவ்வகையான புதுப்பித்தலும் செய்யாமல் ஆண்டுக் கணக்காக அதே பாடக் குறிப்புக்களைக் கொடுப்பதும் தொடர்ந்த வண்ணமாக இருக்கின்ற போது எப்படிப் புதியவற்றை தேடுவார்கள்?

## வாசிப்பைத் தூண்ட வழிவகைகள் வேண்டும்

ஆக, பிள்ளைகள் சிந்தனை செய்து சரியான வழியில் செயற்படக்கூடிய – வாழக்கூடிய வகையில் இவர்களில் வாசிப்புப் பழக்கத்தைத் தூண்டுவதற்கு வழிவகைகள் மேற்கொள்ளப்பட வேண்டும்.

ஆர்வத்தோடு அவர்களை வாசிக்கத் தூண்டக்கூடிய விடயதானங்களைக் கொண்ட நூல்கள் அதிகமாக வெளிவருவதோடு அவற்றை அவர்கள் பெற்றுக்கொள்ளவும் வாய்ப்புக்கள் ஏற்படுத்தப்படவேண்டும்.

ஒவ்வொரு மாணவனும் கற்கின்ற போதே தன்னுடைய வீட்டில் சிறியளவிலான நூலகத்தை உருவாக்கி நல்ல நூல்களைத் தேடி வாங்கி வைத்திருந்து படிக்கின்ற பழக்கத்தினை சிறுவயதிலேயே ஏற்படுத்த வேண்டும்.

அடிப்படையில் இவர்களிடையே வாசிப்புக் கலையினை உருவாக்கக்கூடிய திட்டங்களும், திட்டங்களை செயற்படுத்தக்கூடிய நடைமுறைகளும் மிகமிக இன்றியமையாதவையாக உள்ளன.

அதேவேளை, வாசிப்பை ஊக்கப்படுத்தத் திட்டங்கள் இருந்தால் மட்டும் போதாது. பிள்ளைகளை இப்பழக்கத்தினுள் ஈடுபடுத்த தொடர் செயற்பாடுகள் மேற்கொள்ளப்பட வேண்டும். உதாரணமாக, 'வாசிப்பு மாதம்' என்று ஒக்டோபர் மாதத்தை ஒதுக்கி, இம்மாதத்தில் மட்டும் அவ்வப்போது ஆங்காங்கே வாசிப்பைப் பற்றிச் சொல்லிவிட்டு, ஏனைய 11 மாதங்களும் 'வாசித்ததை யோசிப்போம்!'என இருந்து விட முடியாது.

நூல்களை பெரிய அளவில் தொடக்கத்தில் வாசிக்காவிட்டாலும் முதலில் அவற்றை வாங்கி நேசிக்கும் பழக்கத்தை பெற்றோர்கள் பிள்ளைகளுக்கு ஏற்படுத்துவார்களேயானால் வாசிப்புப் பழக்கத்தைத் தோற்றுவிக்க அதுவே முதல் படியாகிவிடும்.

## வாசிப்பைக் கலையாக்க செய்யப்படக்கூடிய சில வழிமுறைகள்

கலை விழாக்கள், தமிழ் விழாக்கள், பரிசளிப்பு விழாக்கள் ஏன் பிறந்தநாள் விழாக்கள் போன்ற தனிப்பட்ட வைபவங்களின் போதும் நூல்களை பரிசளிக்கும் பழக்கத்தினைக் நடைமுறைக்குக் கொண்டுவர வேண்டும். 'வீட்டை அலங்கரிக்க நூல்களை விட அழகான பொருள்கள் இன்னும் கண்டுப்பிடிக்கப்படவில்லை!' என்ற ஹென்றி வார்ட் பீச்சர் என்ற அறிஞரின் கருத்து நிலையை பிள்ளைகளுக்கும் ஆசிரியர்களுக்கும் சிறப்பாகப் பெற்றோருக்கும் ஊட்டவேண்டும்.

அமெரிக்க நாட்டின் தலைவர்களுள் தலை சிறந்தவரான ஆபிரகாம் லிங்கன் சிறுவயதில் மிகவும் வறுமைப்பட்ட நிலையில் நூல்களை வாங்கிப் படிக்க பணமில்லாத காரணத்தால் பல கிலோ மிற்றர்கள் நடந்து சென்று நூல்களை இரவல் வாங்கிப் படித்ததாக அறியக்கூடியதாக இருக்கின்றது. நூல்கள் அத்தகைய ஆற்றல் பெற்றவை என்பதை வளரும் பிள்ளைகளுக்கு உணர்த்தவேண்டும்.

படம் நடிக்க முற்பணம் வாங்கும் போது அதில் குறிப்பிட்ட ஒரு தொகைக்கு நூல்களை வாங்கிவிடுவதாக உலகப் பிரசித்தி பெற்ற நகைச்சுவை நடிகன் சார்லி சப்பிளின் கூறுவார். இப்பேர்ப்பட்ட மனப்பாங்கு வளரும் தலைமுறையிடத்தில் வளர்க்கப்படுகின்ற போது வாசிப்புக் கலையாகிவிடும் என நம்பலாம். வாசிப்புக் கலையானால், தனிமனித சமூக வாழ்வில் பல நேர்மறை மாற்றங்களை அனுபவிக்கலாம்.

# වැනි වටින ජගමුතු - දරුවන් වන්න දිනමතු දරුවනේ වැනි නෙතු - නිතර පත පොත ඇසුරු කළයුතු....

- ඒ. පී. චතුනි ලංකාන්ජලි*

සියවසක් යන්න විශ්ව ගමන තුළ ඉතා කෙටි කාලයක් සේ සැලකිය හැකිය. එහෙත් එය මිනිසා වාසය කරන ලෝකයට ඉතා දිගුකාල පරාසයෙකි. අප පසු කලේ 20 වන සියවසයි. වසර 100ක් වූ එම කාලයේ සිදු වූ දෑ නම් සුළු පටු නොවේ. මුහුදු පත්ලේ සිට අභ්‍යවකාශය දක්වා වූ සියලු භව්‍ය වස්තූන් මෙන්ම අභව්‍ය වූ දර්ශනවාද චින්තන, මානව සංස්කෘතීන්, සභ්‍යත්වය ආදී සියලු දේ පිළිබඳ පර්යේෂක පවත්වා නම දර්ශනවාදයන් හා නව චින්තනයන් බිහිකළ ශතවර්ෂයෙකි.

සංවර්ධන ව්‍යායාමයේ දී දැනුම හා ආකල්ප පදනම විය යුතු බව අපට මුලින්ම ඉගැන්වූයේ අනුබුදු මිහිඳුමාහිමියන්ය. උන් වහන්සේ දෙසූ දහම මනුෂ්‍යයාගේ ඓහාලෞකික, පාරලෞකික වශයෙන් වූ ඕනෑම ගැටලුවකට විසඳුම් දක්වෙන සාර්වකාලික හා සාර්වත්‍රික දර්ශනයකි. යෝග්‍ය ස්ථානයකදී රජු හමු වූ මාහිමියෝ බුද්ධි කලවිතනය තුළින් රජු නිර්මාණාත්මක චින්තනය වෙත යොමු කළහ. එමතුද නොව රජ මැති සෙනවි ආදී ප්‍රභූ ජනයා හරහා නව දැනුම ගම්වැසියා දක්වා ගලා යාමට මංපෙත් හෙළි කළහ. ඒ නිර්මාණාත්මක චින්තනයේ පෙළහරක් වශයෙන් නූතන ලෝකයේ අපි සංවර්ධන පියගැට පෙළ කරනය කරමින් සිටිමු.

නිල්වන්ව ඇදහැලෙනා ජල දහරාවක් තුළ සුහුල් වූ අති රමණීය පුෂ්ප මකරන්දයක් පිවී දිලෙන්නා සේම ජල ගගුලක් වන් මේ සමාජය තුළට කියවීම නම් පුෂ්ප මකරන්දය එක් කිරීමට දරන පුංචි වෑයමකි මේ.

තත්පරයක් පාසා කඩිනමින් ඉදිරියට යන ලෝකයක සැරිසරන දරුවනට දැනුම නම් අවැසිමය. ඒ දැනුම අපට සපයන පොත්පත් අපගේ මිතුරන් ය. එහෙත් අද තත්ත්වය වෙනස් වී ළමයා හා පොතපත අතර විශාල පරතරයක් නිර්මාණය වී තිබේ.

පොත පත ඇසුරු කිරීමෙන් පුංචි අපේ දැනුම දියුණු වනවා සේම විචාරශිලී රසිකයෙකු නිර්මාණය වෙයි. කියැවීමට අප මැළි නොවිය යුතුය. මුතුවන් දරුවන් වන අප දැනුම් සයුරින් නහවා එකට අමුණා ලක්මවගේ ගෙලෙහි පැළඳනු ලැබුවහොත් අප රටේ අන්ධකාරයේ තිමිර පටල ඉරා දමා ආලෝකය දල්වීමට හැකිවනු ඒකාන්තය.

තරගකාරී අධ්‍යාපනය හේතුවෙන්ද ගෝලීයකරණය හේතුවෙන් ද පුංචි අපට කියවීමට ඇති ඉඩ ප්‍රස්ථාව අහිමි වී යමින් තිබුණද අප විකල්ප මාර්ග සොයා ගත යුතුය.

අතීතයේ අත්තම්මාගෙන් හෝ සීයාගෙන් 'එකෝමත් එක රටක සිටි රාජකුමාරිකාව' ගැන

* හ/ තංගල්ල බාලිකා විද්‍යාලය, 12 ශ්‍රේණිය, කලා අංශය

කතන්දර අසන්නට පුරුදුව සිටි යුගය වැඩිහිටියන්ගේ මතකයට පමණක් සීමා වී ඇති නූතන අවධියේ, පුංචි අපට කතන්දරයක් කියා දෙන්නට තරම් විවේකයක් වත්මන් වැඩිහිටි පරපුරට නැතිව ගොස් ඇති සෙයකි. එසේත් නොමැතිනම් ඔවුන් රසවත් ලෙස කතන්දරයක් කියා දීමට තරම් නිර්මාණශීලී නැතුවාද විය හැකිය.

කෙසේ හෝ වේවා වත්මන් ළමා අපි පරිගණකයටත්, ටෙලිනාටක හෝ කාටූන් වැඩසටහන්වලටත් කොටුවී සිටින බව වැඩිහිටි පරපුරේ චෝදනාවයි.

මේ අද ළමා පරපුරෙහි සැබෑ තත්ත්වයයි. එය කොතරම් ශෝචනීය වුවද ඉන් බැහැර වීමට පවතින තරගකාරී අධ්‍යාපන රාමුව තුළ නොහැකි වී ඇත. මේ නිසා පාසල් දරුවන්ට කතන්දර පොතක් කියවා රසවිඳින්නට හෝ පුවත් පතක්, සඟරාවක් කියවන්නට හෝ කවියක් විරිඳුවක්, රබන් පදයක් තාලයට ගයන්නට හෝ කාලයක් නොමැත. ඇතැම්විට සති අන්තයේ ලැබෙන විවේකය වුවද යොදා ගැනෙන්නේ ''මෙගා ටෙලිනාට්‍ය' හෝ 'කාටූන්' වැඩසටහන් නැරඹීමටය. මෙහි අවසානය වන්නේ වින්දනාත්මක හැඟීම් වියළී යාමයි. පාසල් පුස්තකාලය වුවද ප්‍රයෝජනයට ගැනෙන්නේ ඉතා අල්ප වශයෙනි. ''අඹ යාළුවෝ'', 'මඩොල්දූව', 'විලම්බීත' වැනි පැරණි යුගයේ ජනප්‍රිය වූ ළමා කෘතීන් මෙන්ම, 'ළමා කොල්ලය', වනගත ළමෝ', කන්දට වැඩිය උස ළමයි' වැනි මේ යුගයේ ලියැවී ඇති රසවත් ළමා පොත් කියවා රස විඳීමට පෙලඹී ඇත්තේ කීයෙන් කී දෙනා ද?

නූතනයේ අලුත් අදහස්, සුගම බස, නැවුම් රචනා ශෛලිය යනාදී ලක්ෂණ දරුවන් තුළින් දක්නට ලැබෙන්නේ ඉතා අල්ප වශයෙනි. ඒ කියවීමට ඇති අලස කම නිසාය. කියවීම මිනිසා සම්පූර්ණ කරයි නම් යථෝක්ත කරුණුද කියවීම තුළින් වර්ධනය වනු ඒකාන්තය.

අන්තර්ජාලය සඳහා සැකසුණු **Family Education** නම් වැඩසටහනෙහි දැක්වෙන අන්දමට කියවීමේ රුචිය ඇති කර ගැනීම සඳහා ක්‍රම ශිල්ප 10 ක් **Top Ten ways to Improve Reading skills and other activities** තිබේ. අපට ද මෙම ක්‍රම ශිල්ප පහසුවෙන් යොදා ගත හැකි බැවින් ඒ පිළිබඳව විමසා බැලීම වටී. ඒ මෙසේ ය.

**දිනපතා සැලසුම් සහගතව කියවීමට නියමිත වේලාවක් දරුවන්ට ලබා දීම.**

දරුවාට ඇසෙන සේ ශබ්දනගා කියවීම තුළින් දරුවාගේ ශබ්ද කෝෂය දියුණු වේ. අවබෝධය පුළුල්වේ. කියවීමේ රුචිය වර්ධනය වේ.

**කියවීමේ ද්‍රව්‍ය (Materials) පහසුවෙන් ලබාගැනීමට ඉඩ සැලැස්වීම**

තමන්ගේ කියවීමේ මට්ටමට ගැළපෙන පොත්පත් සඟරා වටකර ගෙන සිටින දරුවන් විභාග පරීක්ෂණවලදී ඉහළ ලකුණු ගන්නා බව **Family Education** සිය අධ්‍යනයෙන් පෙන්වා දෙයි. අප රටේ වුවද සතිපතා පළවන ළමා පුවත්පත් කියැවීමෙන් බුද්ධියේ නිම් වළලු පුළුල් කර ගැනීමට දරුවාට ඉඩ සැලසිය යුතුය.

**මුළු පවුල එකට එකතු වී පොත් පත් බැලීමට වේලාවක් පිළියෙල කර ගැනීම**

මෙය බොහෝ විට පැය භාගයකට හෝ පැයකට සීමා වුවාට කම් නැත. පවුලේ සියලු දෙනා රාත්‍රී ආහාරයට පෙර, එක මේසයක් වටා රොක්වී දවසේ පුවත්පත් කෙටිකතා හෝ සඟරාවක්

නිහඬව කියවන විට එම දරුවා ද අදාළ කුලකයට එකතු වීමට උනන්දු වෙයි. ඔහුද මේසයට පැමිණ පාඩම් පොත හෝ කියවීමට රුචි කරයි. නැතහොත් ඔහු වැඩිහිටියන් පොතපත කියවන ස්ථානයේ බිම දිගාවී තමා රුචිකරන පොතක් කියවනු ඇත. මුළු පරිසරයම සාමකාමී වෙයි. එවිට 'පවුල මොනතරම් ආශ්චර්යවත් තැනක් දැයි අයෙකුට සිතෙනු ඇත.

## කියවීමට අදාළ විවිධ ක්‍රියාකාරකම්වලට දිරිදීම

නිවසට මිලදී ගනු ලබන ජෑම්බෝතල් ආදියේ දවටන කියවීම, ගමන් කරන විට පාර දෙපස ඇති කඩ සාප්පු ආදියේ නම් හා සංඥා පුවරු කියවීම, ප්‍රධාන වීදිවල අතුරුමාවත්වල නාම පුවරු කියවීම, ක්‍රීඩා කට්ටල ආදියේ ලියවී ඇති උපදෙස් කියවීම, රූපවාහිනියේ කාල ගුණ වාර්තා කියවීම හා වෙළෙඳ දැන්වීම් කියවීම ආදිය දරුවාට නිතැනින්ම හුරු කරවන්න. කලාතුරකින් වුවද බස්රියේ හෝ දුම්රියේ ගමන් කිරන විට ද, සුරතල් ළමා හඬින් යුතුව මාර්ගය දෙපස ඇති කඩසාප්පුවල නම් කියවන්නට උත්සහ ගන්නා දරුවන්, ඔබට දැකිය හැකි සුන්දර දසුනක් වනවාට සැක නැත. ඇතැම් විට ළඟ අසුන්ගෙන සිටින මව හෝ පියා දරුවාට උච්චාරණයේදී සහායවනු දැකිය හැකිය.

මධ්‍යම පංතියේ පාසල් දරුවන්, මෙන්ම සරසවි සිසුන්ද සමහර විටෙක වාහනයක ගමන් ගන්නා අතරතුර නිහඬව පොත් කියවීම නගරබදව දැකිය හැකි යහපත් ලක්ෂණයකි. ඔබේ දරුවා ද ඒ සඳහා පොලඹවීමෙන් කියවීමේ රුචිය වර්ධනය කළ හැකිය. ජපානය, ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව බඳු සංවර්ධිත රටවල සම්මුඛ පරීක්ෂණයට යන විට හෝ කිසිවකු මුණ ගැසීමට අපේක්ෂාවෙන් රැඳී සිටින විට වුවද එම කෙටිකාලය තුළ පොතක් කියවීමට තරුණ තරුණියන් යොමු වී ඇත. මෙවැනි චර්යාවන්ට අනුබල දීමත් කියවීමේ රුචිය වර්ධනය කර ගැනීමට මෙන්ම කාල නාස්තිය අවම කර ගැනීමට ද හැකිය.

## කියවීමේ රුචිය වර්ධනය කිරීමට දරුවා පුස්තකාල පරිහරණය සඳහා පොලඹවාලීම

ගමේ හෝ නගරයෙහි පොත්ගුලේ සාමාජිකත්වය ලබා ගැනීමට දරුවාට උදව් කිරීම දෙමාපිය වගකීමයි. පාසල් පුස්තකාලය පරිහරණයට ගුරුවරුන්ගේ මගපෙන්වීම වැදගත් වනවා සේම, නිවසේදී ද මේ සඳහා ස්ථානයක් වෙන් කර ගත හැකි නම් බෙහෙවින් අගනේය. පළමු උපන් දිනයේ සිටම ක්‍රමයෙන් වර්ධනය වන වයස් මට්ටම් අනුව, උපන් දින තිළිණයක් ලෙස කතන්දර පොතක් ලබා දුන්නොත් දරුවා ඉහළ පංතියකට යනවිට නිරායාසයෙන්ම හොඳ පුස්තකාලයක් නිවසේ ගොඩනැගී තිබෙනු ඇත. වටිනා පොත පත පිරුණු අල්මාරියක් ඔබේ විසිත්ත කාමරයට එකතු කරන්නේ නම් දරුවාගේ පොතපත කෙරෙහි දක්වන කැමැත්ත වර්ධනය වනවා සේ ම ඔහුගේ සමාජීය වටිනාකමද ඉහළ යනු නිසැකය.

## දරුවාගේ කියවීමේ හැකියාව වර්ධනය වන්නේදැයි නිරන්තරයෙන් අවධානයකින් පසුවීම

පන්තිකාමරයේදී ගුරුවරයාටත්, නිවසේදී දෙමාපියන්ටත් මෙය පහසුවෙන්ම කළ හැකිය. දක්ෂ ගුරුවරයා තම සිසුන්ගේ කියවීමේ හැකියාවන් මෙන්ම නොහැකියාවන්ද හැඳින ගනී. නිවසේ පරිසරයද මේ අයුරින් සැකසිය යුතුය. කාර්යාලයේ ගැටලුවලට මැදිවී නිවසට පැමිණියද දෙමාපියන්ට සිය දරුවනට සවන් දීමට කාලයක් තිබිය යුතුය. එවිට දරුවාගේ කථනය මෙන්ම ආත්ම විශ්වාසයද, ආත්ම තෘප්තියද ගොඩනැංවෙයි.

**දරුවාගේ කියවීමේ ගැටලු හැඳිනගැනීම**

අවධානයෙන් සවන්දීම තුළින් දරුවා වචනවල අකුරු අතහැර කියවන්නේ ද? විරාම ලක්ෂණ නොසලකා හරින්නේ ද ආදී වූ කරුණු අවබෝධ කරගත හැකිවනු ඇත.

**හැඳිනගත් කියවීමේ ගැටලුවලට අප්‍රමාදව විසඳුම් සෙවීම**

මුලදී කියවීමේ ගැටලු හැඳිනගතහොත් පිළියම් යෙදීමටද පහසුවේ. එසේ නැතිනම් ගැටලුව සංකීර්ණ වූ තරමට පිළියම් යෙදීම දරුවාට වෙහෙසකර ද අප්‍රියජනක ද වනු ඇත.

**කියවීම් ආධාරක මගින් දරුවාට උදව් කිරීම**

මේ සඳහා අභ්‍යාස පොත්, පරිගණක වැඩසටහන් හා පටිගත කළ විවිධ වැඩසටහන් යොදාගත හැකිය. ජන ගායනා හෝ විරිඳු ආශ්‍රිත පටිගත කළ වැඩසටහන් මෙන්ම සංවාද, කතන්දර අඩංගු තැටි ආශ්‍රයෙන් වචන ශබ්ද කිරීම, අවබෝධය සඳහා සවන් දීම සහ චරිතාරෝපිතව කථා කිරීමද යොදාගත හැකිය. ශ්‍රවන හා වින්දන කුසලතා වර්ධනය කිරීම සඳහා සෑම වයස් මට්ටමකදීම මෙම ආධාරක උපයෝගී කර ගැනීම බෙහෙවින්ම ඵලදායක බව මෙම අධ්‍යනය තවදුරටත් පෙන්වා දෙයි.

විශේෂයෙන් ක්‍රීඩා වැඩ සටහනත් මගින් ලැබෙන වින්දනය කියැවීමේ රුචිය වර්ධනය කර ගැනිමට යොදාගත හැකි බවද National Childs Reading Website Foundation පෙන්වා දෙයි.

දරුවාගේ කියවීම පිළිබඳව ඔබ තුළ දැඩි උනන්දුවක් පවතින බව ඔවුන්ට හැඟවීම ඉතා වැදගත්ය. විශ්වසනීයත්වයෙන් යුත් කාර්යය ලෙස සැලකෙන්නේ එයයි. අභිප්‍රේරණය (Mortivation) තුළින් දරුවාගේ කියවීමේ පුරුද්ද කෙටි කාලයක් තුළදී ශීඝ්‍රයෙන් වර්ධනය කළ හැකිය. හොඳම මාර්ගය මෙයයි.

''ඔයා හොඳට කියෙව්වානේ''
''හරිම හොඳයි. අහගෙන ඉන්න ආසයි''
''පුතාට බැරිද තව පාරක් ඒ වගේ කියවන්න. මං අහගෙන ඉන්නම්.''

ඔබේ මුවින් පිටවන එවැනි ප්‍රශංසාත්මක වදනක පවතින ''මැජික් බලය'' ඔබටම විශ්වාස කළ නොහැකි වනු ඇත.

තවද මෙම ග්‍රන්ථ පරිශීලනය කිරීමේදී දරුවා ඉහත දක්වෙන සටහනෙහි පරිදි කතාවට අවධානය යොමු කරවීම තුළ දරුවා විචාරාත්මක, නිර්මාණශීලී චින්තනය තවදුරටත් වර්ධනය කරලිය හැකි ය.

තාක්ෂණය දෙස බලා වශී වී සිටින ළමා පරපුරට අහිතකර දෑ ගෙන එන මාධ්‍ය පිළිබඳවද කිව මනාය. අවිවේකී සමාජයක දිවිගෙවන ළමයා තුළ සුභවාදී ආකල්ප ඇතිකර කියවීමට යොමු කළ යුතුය. ළමයින් කියවීමට යොමු කිරීමට සාහිත්‍ය මාසය එනතෙක් බලා නොසිට එය සෑම අතින්ම කඩිනම් කළ යුතුය.

කතන්දර ගොඩනැගී ඇත්තේ දනුම, හාස්‍යය, පැරැනන්ගේ අත්දැකීම් ආදිය ගොනු කරගෙනය. ඇතැම් අවස්ථාවන්හි අපේ පැරණි මුතුන්මිත්තන්ගේ අනුවණකම්ද මෙම කතන්දරවලින්

දැක්වේ. නිදසුනක් ලෙස මහදැනමුත්තා පිළිබඳ දැක්වෙන කතා ගතහැකිය. මහදැනමුත්තා වී වැපුරූ හැටි, එළුවා හිසේ හිරකරගත් මුට්ටිය ගැලවූ හැටි, ගඟ නිදි දැයි බැලූ හැටි යනාදි කතන්දර නිදසුනක් කොටගත හැකිය. ගමරාලගේ කතන්දර තුළින් අපගේ ජීවිතයට ආදර්ශද සැපයෙයි. රජවාසලේ කවටයා වූ අන්දරේ ජම්බු කෑ හැටි, තිබ්බටු මැල්ලුම් කෑ හැටි, සීනි කෑ හැටි දැක්වෙන පොත් ද ඇත. හාස්‍ය රසයෙන් යුතු වුවද ඇතැම් චරිත පිළිබඳව දුකක් ද දැක්වේ. පැරැන්නන්ගේ ජීවන අත්දැකීම් මුසුකොට පටබැඳුණු මේ කතන්දර ඉතා අගනේය.

කවියද ළමා මනස පෝෂණය කරවන්නකි.

ඇස නැතිදා පොත ගත්තේ කියන්ටද
දත නැතිදා උක් දඬු ගිනි තපින්නටද
වෙර නැතිදා ගහ ගත්තේ දිනන්ටද
යුද ඇතිදා නැති කග කොස් කොටන්ටද

ගොඩල්ලේ තරම දැනගෙන ළිඳ කපනු
බොරැල්ලේ තරම දැනගෙන උඩ පනිනු
කඩුල්ලේ තරම දැනගෙන කඳ බඳිනු
තමුන්ගේ තරම දැනගෙන කල් හරිනු

කාව්‍ය ග්‍රන්ථ සේවනයෙන් ද ශිෂ්‍ය ජීවිත හැඩගස්වා ගැනීමට අවැසි උපදේශනය ලැබෙන බව එමගින් පැහැදිලිය.

කියවීම තුළින් අපට ලේඛන කලාව වර්ධනය කර ගැනීමට ද හැකිවනු ඇත. විෂය සමගාමී මෙන්ම විෂය බාහිර කෙටිකතා, නවකතා, යොවුන් නවකතා, තීරු ලිපි යනාදිය පරිශීලනය කිරීම මගින් දරුවන්ගේ බුද්ධිය දියුණුවනවා සේම පොත දැනුමද වර්ධනය වේ.

පත පොත පරිශීලනයෙන් මනා සංයමයකින් හෙබි මනුෂ්‍යයෙක් බිහිවෙයි. නිර්මාණාත්මක චින්තනය දියුණුවීම ද එමගින් ලද හැකි මහඟු ඵලයකි.

නිර්මාණාත්මක චින්තනය අපට උරුම වූයේ ග්‍රන්ථ පරිශීලනයෙන් බවද කිවයුතුය.

හෙට ලොව දකින්න එහි සැරි සරන්න
නෙත් යුග පාදා දැනුම වඩවන්නේ
හොඳ හැටි සිතන්න නිමැවුම් කරන්න
පත පොත නොමසුරු සහයක් දෙන්නේ

අප නව තාක්ෂණයටම පමණක් වහල් නොවී පත පොත ඇසුරු කළ යුතුය. නිරන්තර පත පොත කියවීම තුළින් විචාරශීලී පුද්ගලයෙකු බිහිවේ. ප්‍රතිලාභය ලැබෙනුයේ අනාගතයටය. අප කවුළුව හැර සුළං සුව විඳිය යුතුය. එහෙත් ඒ සුළඟට අප සතු දෑ ගසාගෙන යාම ඉඩ ලබා නොදිය යුතුය. එමෙන්ම නව තාක්ෂණය අප භාවිතා කළ ද ඊට ලොල් වී පත පොත පසෙකට ලෑම සුදුසු නොවේ.

- පොතේ එන කතාවට සම්බන්ධ චරිත හොඳින් හැඳිනගෙන එම චරිතවල ඇති යහපත් ශක්තීන් තේරුම් ගෙන, තමා තුළද ඒවා වර්ධනය කර ගැනීමට උත්සාහ ගන්න
- ඔබ ඇසුරු කරන අජීවී පොත් මිතුරන් පිළිබඳ ඔබේ සජීවී මිතුරන්ටද හඳුන්වා දෙන්න
- ඔබට ඕනෑම වෙලාවක ඇසුරු කිරීමට හැකි පොත් මිතුරෝ ඔබෙන් කිසිවක් බලාපොරොත්තු නොවෙති. එහෙත් ඔවුන් වෙනුවෙන් ඔබෙන් විය යුතු යුතුකමක් ඇත. ඒ ඔවුන්ට පිරිසිදුව පිළිවෙළට ජීවත්වීමට ඔබේ නිවසෙහි ස්ථානයක් පිළියෙළ කර දීමය.
- පොත් මිතුරා නිතර හමු වන්න. ඇසුරු කරන්න. සංවාද කරන්න.
- කිසිවිටෙක ඔක්තෝම්බර් මාසයට පමණක් සීමාවන පාඨකයෙකු නොවී නිරන්තව කියවන පාඨකයකු වන්න.

# Award Winners

**1st Place - Siriwardhana Public Library**

**2nd Place - Kokuvil Public Library**

**3rd Place - Wellawaya Public Library**

## *Special Awards*

Chunnakam Public Library

Ganesha MahaVidyalaya, Kalmunai

Chulabhaya Secondary School, Teldeniya

Hettipola Central Library, Wilgamuwa

Nagollagama Public Library

## *Awards*

Thambiluvil Public Library

Alayadivembu Public Library

Amir Ali Public Library

Kattankudy Public Library,

Chenkalady Public Library

Arumukaththan Kudiyiruppu Public Library

Mankerny Public Library

Pudavaikattu Public Library

Thiriyay Public Library

Ikbal Nagar Public Library

Kaithady Public Library

Alaveddy Public Library

Manthai East Public Library,

Puthukkudiyiruppu Public Library

Gampaha Public Library

Naranwala Public Library

Thalahena Public Library

Henarathgoda Public Library

Pamunugama Public Library

Colombo Public Library

D.A.Rajapaksha Memorial Public Library

Ingiriya Public Library

Sri Darmapala Public Library

C.W.W.Kannangara Public Library

Bombuwala Public Library

Hatton Dikoya Urban Council Public Library

Medawachchiya Public Library

Bulathkohupitiya Public Library

Ruwanwella Public Library
Nivithigala Public Library
Weligepola Pradeshiya Sabha Public Library
Mahasiva Public Library
Kakkapalliya Public Library
Medagama Public Library
Munneswaram Public Library
Merawala Public Library
Yagampaththuwa Public Library
Mahawa Public Library
Galgamuwa Public Library
Sri Sumangala Central Library
Srimath Jayathilaka Public Library
Monaragala Public Library
Poonakari Public Library
Puloppallai Public Library
Vavuniya Public Library
Vengalacheddikkulam Public Library
Mannar Public Library
Murungan Public Library
ThalaiMannar Public Library

Al - Bahriya MahaVidyalaya, Kalmunai
Kattankudy Central College
St. Francis Xavier MahaVidyalaya, Trincomalee
Methodist Girls' College, Trincomalee
St. Henry's College, Jaffna
Arunodaya College, Jaffna
Union College, Jaffna
Madeena Vidyalaya, Vavuniya
Mankulam MahaVidyalaya
Vattappalai MahaVidyalaya, Mulativu
Kilinochchi MahaVidyalaya
St. Thomas National School, Matale
Sri Sangamiththa Balika National School, Matale
Mahamaya BalikaVidyalaya, Kandy
Pilimathalawa Primary School
J.M. KumaradasaMahaVidyalaya,Monaragala
Kegalu BalikaVidyalaya,Kegalle
St. Josep Vas Primary School,Wennappuwa
Taxila Central College, Horana
Kuruwamulla MahaVidyalaya,Wathurugama
Nimala Maria Girls College,Thudella

# Public Library Conservation Center Competition - 2018

## *Western Province*

- Negombo Public Library - Negombo Municipal Council
- Horana Public Library – Horana Urban Council
- Demanhandiya Public Library - Katana Pradeshiya Sabha

## *Central Province*

- Matale Public Library – Matale Municipal Council
- Nawalapitiya Public Library - Nawalapitiya Urban Council
- Teldeniya Central Library – Medadumbara Pradeshiya Sabha

## *Southern Province*

- Kumarathunga Munidasa Public Library- Matara Municipal Council
- Ambalangoda Public Library- Ambalangoda Urban Council
- Baddegama Public Library - Baddegama Pradeshiya Sabha

## *North Western Province*

- Kurunegala Public Library - Kurunegala Municipal Council
- Puttalam Public Library – Puttalam Urban Council
- Hettipola Public Library - Panduwasnuwara Pradeshiya Sabha

## *Sabaragamuwa Province*

- Kegalle Public Library - Kegalle Urban Council
- Eheliyagoda Public Library - Eheliyagoda Pradeshiya Sabha

## *North Central Province*

- Polonnaruwa Buddhimandapaya Public Library - Polonnaruwa Municipal Council
- Nochchiyagama Public Library- Nochchiyagama Pradeshiya Sabha

## *Uva Province*

- Bandarawela Public Library - Bandarawela Municipal Council
- Monaragala Public Library - Monaragala Pradeshiya Sabha

## *Northern Province*

- Vavuniya Public Library – Vavuniya Urban Council
- Vaddakachchi Public Library – Karachchi Pradeshiya Sabha

## *Eastern Province*

- Sainthamaruthu Public Library – Kalmunai Municipal Council
- Trincomalee Public Library - Trincomalee Urban Council
- Ameer Ali Public Library – Sammanthurai Pradeshiya Sabha

ISBN 978-955-7544-34-2

9 789557 544342

National Library & Documentation Services Board
No. 14, Independence Avenue
Colombo 07
www.natlib.lk

# ජාතික කියවීමේ මාසය - සමරු කලාපය

# தேசிய வாசிப்பு மாத - ஞாபகார்த்த மலர்

# National Reading Month - Commemorative Volume

## 2019

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை
National Library & Documentation Services Board

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education



**දරුවොත් එක්ක කියවමු**
சிறுவர்களுடன் இணைந்து வாசிப்போம்
**Let's read with Children**